82 වන කාණ්ඩය
2 වන කලාපය

බදාදා
1968 සැප්තැම්බර් 25

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

**අන්තර්ගත ප්‍රධාන කරුණු**

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 153]

විසර්ජන පනත : සම්මතිය [තී. 168]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 82
இல. 2

புதன்கிழமை
25 செப்ரெம்பர் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 153]

ஒதுக்கீட்டுச் சட்டம் : தீர்மானம் [ப. 168]

---

**Volume 82**
**No. 2**

**Wednesday**
**25th September 1968**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 153]

APPROPRIATION ACT : RESOLUTION [Col. 168]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

1968 සැප්තැම්බර් 25 වන බදාදා

புதன்கிழமை, 25 செப்டெம்பர் 1968

*Wednesday, 25th September 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 3.

**ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)**
*(கௌரவ வி. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)*
(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

I require two weeks' time to answer this Question.

**එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)**
*(திரு. எல். சி. டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

This officer has been under interdiction for 2½ years. I trust the Hon. Minister will expedite the matter.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

2——එච් 17463—795 (68/9)



### යතුරු ලේඛකයින් තේරීමේ විභාගය, 1967 ජූලි

தட்டெழுத்தாளர் பரீட்சை, ஜூலை 1967

TYPISTS' EXAMINATION, JULY 1967

**4. එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යතුරු ලේඛකයින් තෝරාගැනීම සඳහා 1967 ජූලි මස පවත්වන ලද පරීක්ෂණයෙන් කොපමණ සංඛ්‍යාවක් සමත් වී තිබේද? (ආ) මෙයින් කොපමණ සංඛ්‍යාවකට මේ දක්වා පත්වීම් දී තිබේද? (ඉ) ඉතිරි අයට පත්වීම් දීමට බලාපොරොත්තු වන්නේද? එසේ නම් කවදාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 1967 ஆம் ஆண்டு ஜூலை மாதத்தில் நடைபெற்ற தட்டெழுத்தாளர் பரீட்சையில் சித்தியடைந்தவரின் தொகை என்ன? (ஆ) இத் தொகையில் இதுவரை நியமனங்கள் கொடுக்கப்பட்டவர்கள் எத்தனை பேர்? (இ) மற்றவர்களுக்கும் நியமனங்கள் கொடுக்க உத்தேசிக்கப்பட்டுள்ளதா? அப்படியாயின், எப்பொழுது?*

asked the Minister of Finance: (*a*) How many have passed the Typists' Examination held in July 1967? (*b*) How many out of this number have been given appointments so far? (*c*) Is it proposed to give appointments to the rest? If so, when?

**ගරු එන්. විමලසේන (වැඩබලන මුදල් ඇමති)**
*(கௌரவ என். விமலசேன—பதில் நிதி அமைச்சர்)*
(The Hon. N. Wimalasena—Acting Minister of Finance)

(*a*) A competitive examination for the recruitment of Sinhala typists was held on 5.7.67. On the results of that examination, 157 candidates were given appointments to fill existing vacancies. The appointments were given in order of merit they gained at the examination. (*b*) See (*a*) above. (*c*) If further vacancies arise, the question of making further appointments will be considered.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

Will the Hon. Minister guarantee that those who have passed this examination will be given appointments before a further examination is held?

**ගරු විමලසේන**

*(கௌரவ விமலசேன)*

(The Hon. Wimalasena)

There is no question of a pass. We recruit them in order of merit, if and when vacancies occur.

### විශ්ව විද්‍යාල ප්‍රවේශය

பல்கலைக்கழக அனுமதி

UNIVERSITY ADMISSIONS

**9. එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1964, 1965, 1966 සහ 1967 යන එක් එක් වර්ෂය තුළ විශ්ව විද්‍යාල සතරේ කලා පීඨයන්ට ඇතුල් කර ගත් ශිෂ්‍යයින්ගේ ගණන කොපමණද? (ආ) මෙම වර්ෂයේදී විශ්ව විද්‍යාල සතරේ කලා පීඨයන්ට ශිෂ්‍යයින් කීදෙනකු ඇතුල් කර ගැනීමට අපේක්ෂා කෙරේද? (ඉ) මෙම ගණන තීරණය කර ඇත්තේ කෙසේද? (ඊ) වර්ෂ 1964 සිට 1967 දක්වා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ කවර තත්ත්වයක සාමාර්ථ්‍යයක් ලබාගත යුතු වීද? (උ) මෙම වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ කවර තත්ත්වයක සාමාර්ථ්‍යයක් ලබා ගත යුතු වීද? (ඌ) මෙම වර්ෂයේදී ඇතුළත් කර ගැනීම සඳහා යෙදෙන සාමාර්ථ්‍ය තත්ත්වයන් හේතු කොට ගෙන විෂයයන් සතරකින් සමත් ශිෂ්‍යයින් කී දෙනකුට මෙම වර්ෂයේදී විශ්ව විද්‍යාලයන්ට ඇතුළත්වීම අහිමි වන්නේද? (එ) මෙසේ අහිමි වන ශිෂ්‍යයින් අතුරින් තමන් සමත් වූ විෂයයන් සතරින් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් සම්මාන සාමාර්ථ්‍ය ලැබූවන්ගේ ගණන කොපමණද?



கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1964, 1965, 1966, 1967 ஆகிய ஒவ்வொரு வருடங்களிலும், நாலு பல்கலைக்கழகங்களிலும் கலைத்துறைகளுக்கு அனுமதிக்கப்பட்ட மாணவரின் எண்ணிக்கையென்ன? (ஆ) இந்த வருடம் நாலு பல்கலைக்கழகங்களிலும் கலைத்துறைகளுக்கு அனுமதிக்க உத்தேசித்துள்ள மாணவரின் எண்ணிக்கை யென்ன? (இ) இந்த எண்ணிக்கை தீர்மானிக்கப்பட்டதெப்படி? (ஈ) 1964 தொடக்கம் 1967 வரை பொ. த. ப. (உயர்தர) பரீட்சையில் பெற்றிருக்க வேண்டிய தரம் என்ன? (உ) இந்த வருடம் பொ. த. ப. (உயர்தர) பரீட்சையில் பெற்றிருக்க வேண்டிய தரம் என்ன? (ஊ) நாலு பாடங்களில் சித்தியடைந்த மாணவரில் எத்தனை பேர் இவ்வருடம் நடைமுறைக்குக் கொண்டுவரப்படவுள்ள அனுமதித்தரங்களின் கீழ் அனுமதி பெற முடியாதிருப்பார்கள்? (எ) இவ்வாறு அனுமதி பெற முடியாதவர்களில் எத்தனை பேர் சித்தியடைந்த நாலு பாடங்களில் ஒன்று அல்லது அதற்கு மேலான பாடங்களில் திறமைச் சித்தி பெற்றுள்ளார்கள்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) How many students have been admitted to the Arts faculties of the four universities during each of the years 1964, 1965, 1966 and 1967? (*b*) What number is proposed to be admitted to the Arts faculties of the four universities this year? (*c*) How has this number been determined? (*d*) What standard had to be reached at the G.C.E. (Advanced Level) Examination during the years 1964 to 1967? (*e*) What standard had to be reached at the G.C.E. (Advanced Level) Examination this year? (*f*) On the basis of admission standards to be applied this year, how many students who have passed in four subjects would be shut out this year? (*g*) How many of those who would be shut out have one or more credit passes among the four subjects which they have passed?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(අ) 1964/65-2619, 1965/66-5344, 1966/67-2866, 1967/68-2888. (ආ) 3010. (ඉ) විශ්ව විද්‍යාලවල තිබෙන පුරප්පාඩු අනුව. (ඊ) 1964 අයදුම්කරුවන් තෝරා ගන්නා ලද්දේ ඒ ඒ විශ්ව විද්‍යාල මගින් ය. එම නිසා මෙම විස්තර සැපයිය නො හැක. 1965—එම—1966—එම—1967 අය දුම්කරුවෝ කොටස් දෙකකින් තෝරාගනු ලැබූහ. එනම්, (i) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකින් සාමාර්ථ්‍යය සහිතව යටත් පිරිසෙයින් මුළු ලකුණු සංඛ්‍යාව 160 ක් ලබාගත් අයදුම් කරුවෝ. (ii) විෂයයන් තුනකින් සාමාර්ථ්‍යය සහ යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන තත්ත්වය සහිතව අඩු වශයෙන් මුළු ලකුණු සංඛ්‍යාව 160 ක් ලබා ගත් අයදුම්කරුවෝ. (උ) අ. පො. ස. (උ. පෙ.) විභාගයේදී විෂයයන් හතරකින් සාමාර්ථ්‍යය සහිතව යටත් පිරිසෙයින් මුළු ලකුණු සංඛ්‍යාව 180 ක් හෝ විෂයයන් තුනකින් සාමාර්ථ්‍යය සහ යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන තත්ත්වය සහිතව අඩු වශයෙන් මුළු ලකුණු සංඛ්‍යාව 180 ක් ලාගත් අයදුම්කරුවන්. (ඌ) 918. (එ) 55.

## කනෝගම සමගි මණ්ඩලය

*கனேகம இணக்கச் சபை*

**KANOGAMA CONCILIATION BOARD**

10. **ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වාරිය පොල ඡන්ද කොට්ඨාශයේ කනෝගම ගම් සභා ප්‍රදේශයේ සමගි මණ්ඩලයක් පිහි ටුවා ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙම මණ්ඩලයට පත් කරනු ලැබ සිටින



සභාපති, සිංහල භාෂාවෙන් වැඩකළ නො හැකිය යන හේතුව උඩ විශ්‍රාම ලැබූ රජයේ සේවකයෙක්ද? (ඉ) මෙම මණ්ඩලයේ සාමාජිකයන් 17 දෙනාගෙන්, 7 දෙනකු සභාපතිගේ කිට්ටු ඥාතිවරයන් බව එතුමා දන්නවාද? (ඊ) සියළුම සාමාජිකයන්ගේ පත්වීම්, හුදු දේශපාලන පත්වීම් නිසා මෙම මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීමට එතුමා පියවර ගන්නවාද?

*நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினு: (அ) வாரியப்பொலை தேர்தல் தொகுதியில் கனேகம கி. ச. பகுதியில் ஓர் இணக்கச் சபை தாபிக்கப்பட்டுள்ளதை அறிவாரா? (ஆ) இச் சபையின் தலைவராக நியமிக்கப்பட்டுள்ளவர், சிங்கள மொழியில் கடமையாற்ற இயலாதென்ற காரணத்தினுல், ஓய்வு பெற்ற ஓர் அரசாங்க உத்தியோகத்தரா? (இ) இச்சபையின் உறுப்பினரான 17 பேர்களில், 7 பேர் தலைவரின் நெருங்கிய உறவினர் என்பதை அறிவாரா? (ஈ) உறுப்பினர் எல்லோரும் அரசியல் காரணங்களுக்காக நியமிக்கப்பட்டவர்களாதலால், இச்சபை உறுப்பினர்களை மாற்றி அமைக்க நடவடிக்கை எடுப்பாரா?*

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) Is he aware that a conciliation board has been established for the Kanogama V.C. area in the Wariyapola constituency? (*b*) Is the president who has been appointed to this board an ex-government servant who retired on the ground that he was unable to work in the Sinhala language? (*c*) Is he aware that out of the 17 members of this board, 7 are close relations of the president? (*d*) Will he take steps to reconstitute this board in view of the fact that all the members are pure political appointees?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්—අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs—on behalf of the Parliamentary Secretary to the Minister of Justice)

(*a*) Yes. (*b*) Yes. At the time of the appointment of this chairman of the panel of conciliators, while the fact that he was a retired government servant was known, this Ministry was not aware of the degree of his proficiency in Sinhala. It has since been reported that he has passed the London Matriculation Examination with Sinhala as a subject and that his knowledge of Sinhala is quite adequate for the performance of his duties as chairman. (*c*) At the time of the appointment of this panel no information on this matter was availab!- at the Ministry. Subsequent inquiries have revealed that two out of the members of this panel are very distantly related to the chairman through the latter's wife's father's mother. (*d*) The members are not political appointees; the question, therefore, does not arise.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

If he was so proficient in Sinhala, how could he have retired on the ground that he could not do his work in Sinhala?



**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**

*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*

(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

The Member of Parliament for Anuradhapura (Mr. Ratnayake) retired on that ground himself. You cannot say that he is not proficient in Sinhala.

## කොටහේනේ සිංහල ප්‍රාථමික පාසලේ එස්. එස්. අඹගල්ල මහතා

*திரு. எஸ். எஸ். அம்பகல்ல, கொட்டாஞ்சேனை சிங்கள ஆரம்பக் கல்லூரி*

## MR. S. S. AMBAGALLA, KOTAHENA SINHALESE PRIMARY SCHOOL

1. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ—පී. ජී. බී. කෙනමන් මයා.—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)**

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர் சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පාසලට අදාල ගොඩනැගිලි වැඩ සම්බන්ධව රැවටීමක් හා වංචාවක් කරන ලදැයි යන චෝදනාව ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස කොළඹ, කොටහේනේ, බාබර් වීදියේ සිංහල ප්‍රාථමික පාසලේ හිටපු වැඩ බැලූ මුල්ගුරු ඇස්. ඇස්. අඹගල්ල මහතා විසින් කරන ලද ඉල්ලීම ගැන කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද? නොඑසේ නම් ඒ මන්ද? (ආ) අඹගල්ල මහතාට විරුද්ධව කරන ලද චෝදනා පිළිබඳව 1966 දෙසැම්බර් 2 වැනි දින පවත්වන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලය කුමක්ද? පරීක්ෂක නිලධාරියාගේ තීරණය අඹගල්ල මහතාට නොදන්වන ලද්දේ මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு பாபர் வீதி கொட்டாஞ்சேனை சிங்கள ஆரம்ப கல்லூரியின் முன்னாள் பதில் தலைமை ஆசிரியர் திரு. எஸ். எஸ். அம்பகல்ல அவர்கள் அக்கல்லூரியுடன் சம்பந்தப்பட்ட சில கட்டட வேலைகளின் சார்பில் செய்த ஏமாற்றல், மோசடி ஆகிய குற்றச்சாட்டுகளைப்பற்றி விசாரணையொன்றை நடாத்தும்படி விடுத்த வேண்டுகோளையிட்டு என்ன நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது? ஏதுமில்லை எனில், ஏன்? (ஆ) திரு. அம்பகல்லவிற்கெதிராக செய்யப்பட்ட குற்றச்சாட்டுகள் பற்றி டிசம்பர் 2 ஆந் தேதி நடந்த விசாரணையின் விளைவு என்ன? விசாரித்த உத்தியோகத்தரின் முடிவு திரு. அம்பகல்லவிற்கு தெரியப்படுத்தப்படாததேன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) What action has been taken on the request made by Mr. S. S. Ambagalla, former Acting Head Teacher at the Kotahena Sinhalese Primary School, Barber Street, Colombo, for an inquiry into allegations of cheating and fraud made by him in respect of certain building work connected with the school; and if none, why? (*b*) What was the outcome of the inquiry on 2nd December 1966 into allegations against Mr. Ambagalla and why have the findings of the inquiring officer not been communicated to Mr. Ambagalla?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

(අ) මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි විසින් මූලික පරීක්ෂණයක් පවත්වන ලදී. වැඩිදුර කටයුතු කිරීමට සාක්ෂි නො තිබිණ. (ආ) අඹගල මහතාට විරුද්ධව ලැබී තිබුන පැමිණිලි ගැන 1966.12.2 දින පවත්වන ලද මූලික පරීක්ෂණයේ දී, ප්‍රමාණවත් සාක්ෂි නොලැබුන නිසා, වැඩිදුර කටයුතු අනවශ්‍ය විය. අඹගල මහතාට විරුද්ධව දෙපාර්තමේන්තු චෝදනා පත්‍රයක් ඉදිරිපත් නොකළ නිසා, ඔහුට දැන්වීමක් අනවශ්‍ය විය.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 2.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම් වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

I want ten days' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

### මෝටර් රථ කොටස් සඳහා දෙන ලද විදේශ විනිමය

*மோட்டார் உபகரண பிறநாட்டு நாணய மாற்று ஒதுக்கீடு*

### FOREIGN EXCHANGE ALLOCATIONS FOR MOTOR SPARES

5. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරාදුව—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. பிறின்ஸ் குணசேக்கர — ஹபருதுவ — சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මෝටර් රථ වාහනවල කොටස් ගෙන්වීම සඳහා 1968 වර්ෂය තුළ ඒ ඒ වගීයේ නිෂ්පාදනවලට කොපමණ විදේශ විනිමයක් වෙන් කරන ලදද? (ආ) කොපමණ වටිනා බලපත්‍ර නිකුත් කර තිබේද? ඒවා නිකුත් කර තිබෙන්නේ කවර සමාගම්වලට හා පුද්ගලයන්ටද?

*இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) 1968 ஆம் ஆண்டில், மோட்டார் வாகன உபகரணங்கள் இறக்குமதிக்கென ஒதுக்கப்பட்ட பிறநாட்டு நாணய மாற்று*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]
எவ்வளவு? (ஆ) எவ்வளவு பெறுமதியான அனுமதிச் சீட்டுகள் கொடுக்கப்பட்டுள்ளன? இவ்வனுமதிச் சீட்டுகள் கொடுக்கப்பட்ட தாபனங்களினதும் தனிப்பட்டவர்களினதும் பெயர்கள் என்ன?

asked the Minister of State: (*a*) How much of foreign exchange was allocated for the year 1968 for the import of motor spares of various makes? (*b*) To what value have permits been issued and to what companies and individuals have such permits been issued?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

(*a*) Rs. 10 million was allocated for the first half of 1968 for imports of motor spares. Allocations were not made on the basis of different makes. (*b*) The issue of Foreign Exchange Entitlement Certificates to importers of motor spares under the new scheme is done by the Central Bank.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Is there any means by which you can control the prices of some of these spare parts? A small bulb for a car now costs about Rs. 10. Normally it should cost about Rs. 2.50.—[*Interruption*].

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

They have been put on O. G. L., subject to FEECs, and we are hoping that the market will be flooded with spare parts. The difficulty of fixing prices is that there are hundreds and thousands of different spare parts.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 6

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 7.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති 6 ක් කල් ඉල්ලනවා. [බාධා කිරීම්] ප්‍රදේශ 24 ක ගුරුවරුන් ගැන සොයන්නට තිබෙනවා. පිළිතුරු දීම හිතා වන තරම් ලෙහෙසි නැහැ.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவு மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## බන්ධනාගාර පරිපාලනය පිළිබඳව කොමිසමක් පත්කිරීම

சிறைச்சாலை நிர்வாகம் சம்பந்தமாக அதிகார சபை நியமனம்

## APPOINTMENT OF COMMISSION ON PRISON ADMINISTRATION

8. ද සොයිසා සිරිවර්ධන මයා. (ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට.)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: ලංකාවේ බන්ධනාගාර පරිපාලනය පිළිබඳව වාර්තා කිරීම සඳහා එතුමා රාජකීය පරීක්ෂණ කොමිසමක් පත් කරනවාද? නොඑසේ නම් මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினு: இலங்கையில் சிறைச்சாலை நிர்வாகம் சம்பந்தமாக அறிக்கை சமர்ப்பிப்பதற்கென, அரச விசாரணை அதிகார சபை ஒன்றை நியமிப்பாரா? இல்லையெனில், ஏன்?*

asked the Parliamentary Secretary to the Minister of Justice: Will he appoint a Royal Commission of Inquiry to report on prison administration in Ceylon; if not, why?

**ගරු විමලසේන (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(கௌரவ விமலசேன—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(The Hon. Wimalasena—on behalf of the Parliamentary Secretary to the Minister of Justice)

No. This whole question was fully investigated by the Gratiaen Commission, which thereafter issued a very comprehensive report. Most of the recommendations of that commission have already been implemented. The recommendations which remain to be implemented (which are likely to be the main recommendations of any new commission as well) are those which involve the expenditure of large sums of money on new buildings, which the country cannot afford to incur at the present juncture.

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

*சபை அலுவல்*

## BUSINESS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 24, the Motion appearing as item 1 on the Paper be proceeded with this day."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினு விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

## SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 10 A.M. on Friday, 27th September 1968, and that the hours of sitting that day shall be as though it were a fifth day from the Poya Day."

I wish to mention that we are going to suspend the operation of Standing Order No. 8 on the 27th September so that we can dispose of all the items.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

There are a large number of Bills and so on. What are the items you intend taking up?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

Supplementary Estimates.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினு விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## වැය සම්මතවල අතිරික්ත, 1966-67

*வாக்குப்பண மிகைச் செலவு, 1966-67*

## EXCESS VOTES, 1966-67

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

I move,

"That this House do resolve itself into a Committee to consider grants to make good Excesses on the sum granted for the financial year 1966-67."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Committee to sit when ?

**ගරු විමලසේන**
*(கௌரவ விமலசேன)*
(The Hon. Wimalasena)

On 27th September 1968.

**කාරක සභාව 1968 සැප්තැම්බර් 27 වන සිකුරාදා.**

*குழு அமர்வு : வெள்ளிக்கிழமை, 27 செப்ரெம்பர் 1968.*

*Committee to sit on Friday, 27th September 1968.*

## විසර්ජන පනත: සම්මතිය

*ஒதுக்கீட்டுச் சட்டம் : தீர்மானம்*

## APPROPRIATION ACT : RESOLUTION

**කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය [ජූලි 29 සහ 30]**

*ஜூலை 29 ஆம், 30 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question—[29th and 30th July.]*

"1967 අංක 15 දරණ විසර්ජන පනතෙහි දෙවැනි උපලේඛනය, පහත දක්වෙන පරිදි සංශෝධනය කළ යුතුයයි, ඒ පනතෙහි 7 වැනි වගන්තිය යටතේ මේ සභාව මෙයින් යෝජනා කරයි.

**(i) අළුත් විෂයයෙහි අඩංගු නොයෙක් විස්තර, ඒ උපලේඛණයේ සුදුසු තීරයන්හි දක්වෙන පරිදි, අංක 225 දරණ විෂයයට ඉක්බිතිවම, පහත සඳහන් අළුත් විෂයය ඇතුළත් කිරීමෙන්,**

| විෂයය | රජයේ කාර්‍යය | කාර්‍යයේ වියදමෙහි උපරිම සීමාව | කාර්‍යයේ ගිණුමට බැරකළ යුතු ලැබීම්වල උපරිම සීමාව | කාර්‍යයේ හර ශේෂයන්ගේ උපරිම සීමාව | කාර්‍යයේ බැර කිරීම්වල උපරිම සීමාව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 226 ... | "සියවස" ලොතරැයිය හා උත්සව පැවැත්වීමට | 16,00,000 ... | 10,00,000 ... | 16,00,000 ... | – |

**(ii) ඒ උපලේඛනයේ සුදුසු තීරයන්හි, ඒ එක් එක් මුළු ගණන දක්වෙන පරිදි, ඒ උපලේඛනයේ ii වෙනි, iii වෙනි, හා iv වෙනි තීරයන්හි දක්වා ඇති මුළු ගණන් වෙනුවට, පහත සඳහන් අළුත් මුළු ගණන් ආදේශ කිරීමෙන් :—**

| රජයේ කාර්‍යයන්ගේ වියදමේ සීමා | රජයේ කාර්‍යයන්ගේ ගිණුම්වලට බැරකළයුතු ලැබීම්වල උපරිම සීමා | රජයේ කාර්‍යයන්ගේ හර ශේෂවල උපරිම සීමා | රජයේ කාර්‍යයන්ගේ බැර කම්වල උපරිම සීමා |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 1,97,48,48,155 ... | 1,85,09,75,700 ... | 61,93,68,702 ... | — " |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" 1967 ம் ஆண்டில் 15 ம் இலக்க ஒதுக்கீட்டுக் கணக்குச் சட்டத்தின் 7 ம் பிரிவின் கீழ் அச்சட்டத்தின் இரண்டாவது அட்டவணை பின்வருமாறு திருத்தப்படவேண்டுமென இச்சபை இத்தால் தீர்மானிக்கிறது :

(i) 225 ம் விடயத்தின் பின் அதன் கீழ் உடனடியாக இப்புதிய விடயத்தை இடுவதன் மூலம்—அதில் அடங்கியுள்ள பல விபரங்களும் அவ்வட்டவணையில் உரிய நிரல்களில் அடக்கப்படும் :

| விடயம் இல. | அரசாங்க முயற்சி | முயற்சியின் செலவினங்களின் உச்ச எல்லை | இம்முயற்சியின் கணக்கில் வரவு வைக்கும் பற்றுக்களின் உச்ச எல்லை | இம்முயற்சியின் பற்றுமீதிகளின் உச்ச எல்லை | இம்முயற்சியின் பொறுப்புக்களின் உச்ச எல்லை |
|---|---|---|---|---|---|
| | | ரூ. | ரூ. | ரூ. | ரூ. |
| 226 .. | "சியவச" அதிஷ்ட சீட்டிழுப்பும் கொண்டாட்டங்களும் | 16,00,000 .. | 10,00,000 .. | 16,00,000 .. | — |

(ii) அட்டவணையின் ii ம், iii ம், iv ம் நிரல்களில் கொடுத்த தொகைகளுக்குப் பதில் பின்வரும் ஒவ்வொரு தொகையையும் அவ்வட்டவணையின் சரியான நிரலில் இடுவதன் மூலம்.

| அரசாங்க முயற்சிகளின் செலவினங்களின் உச்ச எல்லை | அரசாங்க முயற்சிகளின் கணக்கில் வரவு வைக்கும் பற்றுக்களின் உச்ச எல்லை | அரசாங்க முயற்சிகளின் பற்றுமீதிகளின் உச்ச எல்லை | அரசாங்க முயற்சிகளின் பொறுப்புக்களின் உச்ச எல்லை |
|---|---|---|---|
| ரூ. | ரூ. | ரூ. | ரூ. |
| 1,97,48,48,155 .. | 1,85,09,75,700 .. | 61,93,68,702 .. | — " |

" That this House hereby resolves under Section 7 of the Appropriation Act, No. 15 of 1967, that the Second Schedule to that Act be amended as follows:—

(i) By insertion, immediately after Item No. 225, of the following new item, the several particulars contained therein being set out in the appropriate columns in that Schedule:—

| *Item No.* | *Activity of the Government* | *Maximum limit of expenditure of the activity* | *Maximum limit of receipts to be credited to the account of the activity* | *Maximum limit of debit balance of the activity* | *Maximum limit of liabilities of the activity* |
|---|---|---|---|---|---|
| | | *Rs.* | *Rs.* | *Rs.* | *Rs.* |
| 226 | .. 'Siyawasa' Lottery and Celebrations | 1,600,000 .. | 1,000,000 .. | 1,600,000 .. | — |

(ii) By substitution, for the totals set out in columns II, III and IV of that Schedule of the following new totals, each such total being set out in the appropriate column of that Schedule:—

| *Maximum limit of expenditure of the activities of Government* | *Maximum limit of receipts to be credited to the accounts of the activities of Government* | *Maximum limit of debit balance of the activities of Government* | *Maximum limit of liabilities of the activities of Government* |
|---|---|---|---|
| *Rs.* | *Rs.* | *Rs.* | *Rs.* |
| 1,974,848,155 .. | 1,850,975,700 .. | 619,368,702 .. | — " |

—[*The Hon. Wanninayake.*]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

අ. භා. 2.12

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளா)*
**(Mr. T. B. Tennekoon—Dambulla)**

කථානායකතුමනි, අධ්‍යාපන සියවස් උළෙලද, උපාරුවද, සංවර්ධනයද, එහෙමත් නැත්නම් විපත්තියද මා දන්නේ නැහැ, විසර්ජන පනත යටතේ ඉදිරිපත් කර තිබෙන සම්මතිය පිළිබඳව වචන ස්වල්පයක් කථා කළ යුතු යයි මා කල්පනා කරනවා. එක දවසකුත් අධ්‍යාපන ඇමති තුමා කීවා, සියවස පිළිබඳ යෝජනා සාකච්ඡා කරන අවස්ථාවේදී අධ්‍යාපනය ගැන කථා කරන්නට පුළුවන්ය කියා. අධ්‍යාපනයේ හොඳ නරක සියල්ල මේ සියවස උලෙලේදී ප්‍රකාශ කරන්නට යන බව ගරු අධ්‍යාපන ඇමතිතුමා කීවා. එක් කාලයක අපේ දීප්තිමත් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ක්‍රියා කළ තැනැත්තා අද වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා ළඟ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වශයෙන් වාඩි වී සිටිනවා. එතුමා අධ්‍යාපන ඇමතිතුමාට ළං වී සිටින්නේ "සියවස අධ්‍යාපනය" තව දුරටත් දීප්තිමත් කරන්නට දැයි මා දන්නේ නැහැ. කෙසේ වුණත් පසු ගිය සියවස තුළදී අධ්‍යාපනය පිළිබඳව නියම විධියට තේරුම්ගෙන අවශ්‍ය කටයුතු කළා යයි සිතා අපට සතුටු වන්නට බැහැ. ඒ පසුගිය සියවස තුළ පවත්වාගෙන ගිය අධ්‍යාපනයෙන් මේ රටට ප්‍රයෝජනයක් වූ බවක් කොහෙත්ම පිළිගන්නට බැහැ.

අධ්‍යාපනය පිළිබඳව නොයෙක් මත තිබෙනවා. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මොන මතය දරනවාදැයි මා දන්නේ නැහැ. අධ්‍යාපනය යනු කුමක්ද, එය කමක් සඳහා තිබෙන දෙයක්ද යන්න ගැන වර්තමාන ගරු අධ්‍යාපන ඇමතිතුමා දරන මතය හෝ දැනට ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් සිටින එදා සිටි අධ්‍යාපන ඇමතිවරයා ඒ පිළිබඳව දැරූ හා දරන මතය හෝ මා දන්නේ නැහැ. (බාධාකිරීමක්) පසුගිය ආණ්ඩුවේ හිටි අධ්‍යාපන ඇමතිවරයාගේ මතය කුමක්ද කියාත් මා දන්නේ නැහැ. කවරු කවුරුන් මොන මත දැරුවත් පසුගිය කාලය තුළ පැවතුණ අධ්‍යාපන නාමයෙන් මේ රටේ ජනතාවට සේවයක් සිදු වු බවක් නම් පේන්නේ නැහැ. මේ රටේ අධ්‍යාපනය පවත්වාගෙන ගිය පරමාර්ථය හරි නැති බවයි, අපට පිළිගන්නට තිබෙන්නේ.

විදේශීයයන් මේ රට ආක්‍රමණය කරන්නට පෙර මේ රටේ තිබුණේ පන්සල් ඇශ්‍රිත අධ්‍යාපනයක්. ඒ පන්සල් ආශ්‍රිත අධ්‍යාපනයෙන් මිනිසුන් නියමෙ රටවැසියන් වශයෙන් හැඩ ගස්වන්නට පුළුවන් වුණා; සමාජයට අවශ්‍ය අන්දමට මිනිසුන් හැඩ ගස්වන්නට පුළුවන් වුණා. ඒ බව පුරාණ ඉතිහාසය ගැන කල්පනා කිරීමේදී පැහැදිලිව පෙනී යනවා.

මා මුලින් කීවාක් මෙන්, අධ්‍යාපනය ගැන නොයෙක් මත තිබෙනවා. ප්ලේටෝ නමැති පඬිවරයාගේ මතය මේකයි: මුල් කාලයේදීම ළමයින් තුළ ඇති වන ස්වාභාවික ලැදිකම් යහපත් ක්‍රියා සඳහා නිසි සේ පුරුදු කිරීමෙන් ලැබෙන පුහුණුව අධ්‍යාපන යයි හැඟේ.

ඇරිස්ටෝටල් පඬිවරයාගේ අදහස මේකයි: රජයේ ශුභසිද්ධියට ඉවහල් වන ක්‍රියා නිෂ්පාදක චරිතයක් ඇති කරවීමද, සාමාන්‍ය වුවමනා සම්පූර්ණ වීමෙන් විවේක සුවය ලබා ගැනීමද, ආත්මය සුදනම් වීමද අධ්‍යාපනයේ පරමාර්ථය වේ.

තොම්සන් පඬිවරාගේ මතය මේකයි: පුද්ගලයාගේ හැසිරීමද, කල්පනා කිරීම හා ආකල්පද සම්බන්ධයෙන් ඇති පුරුදුවල ස්ථිර වෙනසක් ඇති වන සේ ඔහු කෙරේ පරිසරයේ බලපෑම අධ්‍යාපනය වේ.

පර්සි නන් පඬිවරයාගේ අදහස මේකයි: පෞද්ගලිකත්වය සම්පූර්ණ ලෙස දියුණු වන පරිදි සෑම තැනැත්තාටම අවස්ථා ලබා දීම අධ්‍යාපනයේ අදහසයි.

මේ විධියට නොයෙක් දෙනා නොයෙක් මත ප්‍රකාශ කර තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තමන්නාන්සේගේ අදහස මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඒක කියන්න තමයි මේවා කියාගෙන යන්නේ. ගරු කථානායකතුමනි, අපෙත් පණ්ඩිතකමක් තිබෙනවා. හැබැයි එය සැම විටම තිබෙන පණ්ඩිතකමක් මිස වරින් වර—එක්තරා වේලාවකට එකකුත් තවත් වේලාවකට වෙන එකකුත් වශයෙන්—වෙනස් වන පණ්ඩිතකමක් නොවෙයි. ඒ කෙසේ වුණත් ඔය කතාවලින් අපට ඇති වුවමනාවක් නැහැ. අධ්‍යාපනය ලෝකයේ හැම රටකටම ඉතාමත්ම ප්‍රයෝජනවත් වදයක් නිසා ඒ ගැන ඉතාමත්ම අවශ්‍ය කරුණු කිපයක් මේ අවස්ථාවේදී ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ අන්දමට අධ්‍යාපනය පිළිබඳව නොයෙකුත් අන්දමින් පඬිවරු අදහස් දක්වා තිබෙනවා. අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්නට ඈත පුරාණයේ හා ආදි කාලයේ ඉගැන්වූ කරුණු තුනක් තිබෙනවා. එය අදටත් ප්‍රයෝජනවත් වෙනවා. ඒ කරුණු තුනෙන් එකක් ඥානය දියුණු කිරීමයි. තවත් එකක් වින්දනය සම්බන්ධව ඇති ශක්තිය දියුණු කිරීමයි. අනික යත්න වැඩි කිරීමයි. විශේෂයෙන්ම අධ්‍යාපනයකින් බලාපොරොත්තු වන්නේ ඔන්න ඔය තුනය කියලයි කල්පනා කර තිබෙන්නේ. එහෙත් අපේ මේ සියවස් අධ්‍යාපනයට මුල පුරණ කාලයේ ඔය කරුණු තුන ගැන කිසිම අන්දමකින් කල්පනා කළේ නැහැ. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ අපට පළමුවෙන්ම ලැබුණේ මිනිසුන් ක්‍රිස්තියානියට හරවා ගන්නේ කොයි අන්දමින්ද කියන ප්‍රශ්නය අනුව සකස් කළ අධ්‍යාපනයක්ය කියන එක අපට අමතක කරන්නට බැහැ.

පෘතුගීසි හා ඕලන්ද කාල පසෙක තබා, 1900 සිට 1932 දක්වා අධ්‍යාපනය කරගෙන ගියේ කොයි අන්දමින්ද කියා කල්පනා කරනවා නම් රටවැසියා ක්‍රිස්තියානි ආගමට හැරවීමට අධ්‍යාපනය උපයෝගී කර ගනිමින් අධ්‍යාපනය කරගෙන ගිය බව කියන්නට පුළුවන්. ජේම්ස් කෝර්ඩිනර් දේවගැතිතුමා අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් පත්වුණාට පසව ස්වදේශිකයන් කිස්තියානි භක්තියට හැරවීම අධ්‍යාපනයේ මාර්ගයෙන් ඉතාම තදබලව කරගෙන ගියා. හෙන්රි බාන්ස් ආණ්ඩුකාරතුමා මේ රට ආණ්ඩු කළ කාලයේ කල්පනා කළා රටවැසියන්ට තම මව් බසින් ලියන්න කියන්නවත් ආණ්ඩුව මගින් උගන්වන්නට ඕනෑය කියා. එහෙත් ඒ සඳහා අවශ්‍ය වියදම දැරීමට 1932 වන විට ඒ කාලයේ තිබුණු ආණ්ඩුවට පුළුවන්කමක් ඇති වුණේ නැහැ. ඒ නිසා ඒ අධ්‍යාපන ක්‍රමයත් එතැනින් අවසන් වුණා. ඒ නිසා තමයි අධ්‍යාපන කටයුතු කරගෙන යෑමට 1932න් පසුව කෝල්බෲක් සාමිවරයා කොමිසමක් වශයෙන් පත් කළේ. ඒ කෝල්බෲක් සාමිගේ ප්‍රකාශනයෙන් කිව්වා අධ්‍යාපන සභාවක් ඇති කිරීම ඉතාම වැදගත්ය කියා. යාපනය, කොළඹ, මහනුවර ආදී ස්ථානවල ශාඛා ඇති කරගෙන යෑමත් ඉතාම වැදගත් බව ඒ කෝල්බෲක් සාමිවරයාගේ ප්‍රකාශනයේ සඳහන් කළා.

1812 දී මේ රටේ බැප්ටිස්ට් මිෂනාරි සභාව ඇති වුණු බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඒ කාලයේම වාගේ ඇන්ග්ලිකන් සභාවත් ඇති වුණා. මේ සභා සියල්ලක්ම අධ්‍යාපන කටයුතුවල යෙදුණේ අධ්‍යාපන මූලධර්ම අනුව අධ්‍යාපනයක් ලබා දීමේ පරමාර්ථයෙන් නොව අධ්‍යාපනයේ නාමයෙන් තමතමන්ගේ ආගම් පතුරුවා හැරීමේ පරමාර්ථයෙන් බව පසුගිය කාලයේ අධ්‍යාපන කටයුතු ගැන සොයා බැලීමේදී අපට අවබෝධ වුණා. අද මේ රටේ පාඨශාලා විශාල සංඛ්‍යාවක් තිබුණත්, 1872 වන තුරු මේ රටේ ආණ්ඩුවේ පාඨශාලා තිබුණේ 202 ක් පමණයි. එකල ආධාර ලබන පාඨශාලා එමෙන් දෙගුණයක් තිබුණා. ආධාර ලබන පාඨශාලා 402 ක් තිබුණා. 1872 සිට 1882 දක්වා අවුරුදු 10 ඇතුළත ආණ්ඩුවේ පාඨශාලාවල ප්‍රමාණය 421 දක්වා වැඩි වුණු අතර, ආධාර ලබන පාඨශාලාවල ප්‍රමාණය එමෙන් දෙගුණයක් හෙවත් 832 ක් වුණා. ආධාර ලබන පාඨශාලා ප්‍රමාණය මෙතරම් වැඩි වුණේ නොයෙක් ආගමික ආයතන මගින් ආගම් පතුරුවා හැරීම සඳහා පාඨශාලා ආරම්භ කරන්නට යෙදුණු නිසයි.

ගරු කථානායකතුමනි, 1880 දී තමයි කේම්බ්‍රිජ් සීනියර් කියන විභාගය ලංකාවේ පළමු වරට ආරම්භ කළේ. ඒ විභාගයට පළමුවෙන්ම පෙනී සිටි නැනැත්තා කවුදැයි කියන්නට මට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

1862 සිට 1883 දක්වා ඇතිවුණු යම් යම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු නිසා අළුත් අධ්‍යාපන ක්‍රම ඇති වූ බව අපි දන්නවා. ඒ වගේම 1911 දී බ්‍රිජස් නමැති කොමිෂන් සභාවේ නියෝජිත මහතුන් ලංකාවේ අධ්‍යාපන කටයුතු ගැන පුළුල් වශයෙන් කල්පනා කර නිර්දේශයන් ඉදිරිපත් කළ නිසා අධ්‍යාපනයේ වැදගත් ප්‍රතිසංස්කරණයක් ඇති වුණා.

නොයෙක් අවස්ථාවල අධ්‍යාපන කටයුතු ගැන සොයා බැලීමට කොමිෂන් සභා ඇති වී තිබෙනවා. එහෙත් මෙතෙක් ලැබී තිබෙන අධ්‍යාපනයෙන් සිදු වී තිබෙන්නේ මේ රටේ වැසියන් දෙකට බෙදීම බව අපට ස්ථිර වශයෙන් කියන්නට පුළුවනි. ඉංග්‍රීසියෙන් උසස් අධ්‍යාපනයක් ලබා ගත් පිරිස මේ රටේ අනිකුත් ස්වදේශිකයන්ගෙන් වෙන් වී කටයුතු කළ බවයි අපට පෙනී යන්නේ. ලංකාවේ සෑම ශිෂ්‍යයෙකුටම ප්‍රාථමික පන්තියේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිළයේ අධ්‍යාපනය ලබා දිය යුතු යයි 1942 දී පත් කරන ලද කාරකසභාවක් නිර්දේශ කළා. ඒ කාලයේ තිබුණු ආණ්ඩුව ඒ යෝජනාව පිළිගෙන ක්‍රියා කර ගෙන ගිය බව අපි දන්නවා. එහෙත් ඒ යෝජනාවෙන් වුවත් හරියාකාර ප්‍රයෝජනයක් ලැබුණා යයි අපට කියන්නට පුළුවන්කමක් නැහැ. ඒ යෝජනාව හරියාකාර ක්‍රියාත්මක කරන්නට බැරි වුණේ මේ රටේ අධ්‍යාපනය ඉතා තදින් විසිරී ගොස් තිබුණු නිසයි.

ගරු කථානායකතුමනි, 1956 දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ආණ්ඩුව පිහිටෙව්වාට පසු මේ රටේ අධ්‍යාපනය දියුණු කිරීමේ පරමාර්ථය ඇතිව තමයි, සෑම කෙනෙකුටම සාධාරණ ලෙස ස්වදේශයට ගැළපෙන අන්දමේ අධ්‍යාපනයක් ලබා දීමට ක්‍රියාමාර්ග සකස් කරන්නට යෙදුණේ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් මේ සියවස් උත්සව ප්‍රදර්ශනයේදී නැත්නම් ප්‍රචාරයේදී මේ කාරණා ගැනත් විශේෂයෙන් කල්පනා කළොත් ඉතා හොඳ බව මා කියන්ට කැමතියි.

1956 න් පෙර මේ රටේ පැවති පැරණි අධ්‍යාපන ක්‍රමය පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්නට හැක්කේ මෙසේයි: අවුරුදු සියයක් පමණ කාලයක් පවත්වා ගෙන ආයේයයි කියන මෙම අධ්‍යාපනයෙන් ධනවත් බලවතුන්ගේ මෝඩ දරුවනට තැන ලැබුණා හැරෙන්නට ගම්බද දුප්පත් උදවියගේ බුද්ධිමත් දරුවන්ට කිසිම ප්‍රයෝජනයක් ලැබුණේ නැහැ. මට ඒ බව ස්ථිර වශයෙන්ම කිව හැකියි. ප්‍රධාන පෙළේ ලොක්කන්ගේ දරුවන් කොතරම් මැටිමෝලුන් වුවත් ඒ උදවිය ඉගෙන ගත්තත් නැතත් විභාගයකින් සමර්ථ වන එක පුදුමයක් නොවෙයි. ලංකාවේ ඉඳගෙන හෝ වෙනත් රටකට ගිහින් හෝ එවැනි කෙනෙකුට ඒ අන්දමේ දෙයක් කර ගතහැකි බව කවුරුන් විසිනුත් පිළිගනු ලබනවා. දීර්ඝ කාලයක් තිස්සේම මේ ක්‍රම යටයි කටයුතු කෙරුණේ. ධනවතුන්ගේ මෝඩ දරුවන් ලොක්කන් බවට පත් කිරීමේ ව්‍යාපාරයක් තමයි දීර්ඝ කාලයක් තිස්සේම මේ අධ්‍යාපනයෙන් කෙරීගෙන ගියේ. ඒ ඒ උදවියගේ සහතිකයට වැඩ ලැබුණා හැරෙන්නට වැඩ කිරීමෙහි දක්ෂතාවයට වැඩ ලැබුණායැයි කියන්නට අපට පුළුවන්කමක් නැහැ. සහතිකවලට, උපාධිවලට සහ වෙනත් බලපෑම්වලට වැඩ ලැබුණු එකයි ස්ථිර වශයෙන්ම සිදු වුණේ. පුරාණ කාලයේ අප එක්තරා දෙයක් අසා තිබුණා. ඕනෑම විභාගයකින් සමර්ථ වීමට වුවමනා නම් පිට රට යාමට මුදල් තිබෙන්නට ඕනෑය කියන කාරණයයි. ඒ මුදල් වියදම් කර පිටරට යාමට පුළුවන්කම තිබෙනවා නම් ඒ නෑනෑත්තාට තමන් බලාපොරොත්තු වන ඕනෑම විභාගයකින් සමත් වී ආ හැකි බවයි ඒ කාලයේ කවුරුත් කිව්වේ. ඒ උදවියට නියම පිළිවෙළටම විභාගවලට පෙනී සිට සමත් වී කටයුතු කරනවායැයි අද වුවත් අපට කියන්නට බැහැ.

1956 න් පසුව සකස් කළ අධ්‍යාපන ක්‍රමය අනුව ගම්බද සියළු දෙනාටම අවස්ථාවක් සලසා දෙන්නට අපි කල්පනා කළා. නමුන්නාන්සේලා කොතරම් බෙරගසමින් කෑ ගැසුවත් මට ස්ථිර වශයෙන්ම කියන්නට පුළුවනි දඹුල්ල ආසනයේ ගම්බද දරුවනට විශ්ව විද්‍යාලයට යාමට පුළුවන් වුණේ 1956 න් පසුව බව. අපේ ප්‍රදේශවල දුප්පත් ළමයින්ට ඊට ප්‍රථම විශ්ව විද්‍යාලයකට ඇතුළත් වන්නට ඉඩක් තිබුණේ නැහැ. එම අවස්ථාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සලසා දුන්නේ කවුද? ගලේවෙල මහා විද්‍යාලය, දඹුල්ලේ මහා විද්‍යාලය වැනි පිටි සර පිහිටි මහා විද්‍යාලවලට සමහරවිට කොළඹ රාජකීය විද්‍යාලයටත් වඩා උසස් තත්ත්වයේ ගුරුවරුන්, උපකරණ සහ අනිකුත් අවශ්‍යතාවයන් සලසා දී ගම්බද දරුවන්ටත් නිසිපරිදි අධ්‍යාපන පහසුව සලසා දෙන්නට අපි කල්පනා කළා.

අපේ බොහොම පිටිසර පාඨශාලාවක ජය ග්‍රහණයක් ගැන ගරු ඇමතිතුමා පවා දන්නවා ඇති. මුළු ලංකාවේ කාටත් පාෂේ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සඳහා දෙන්නේ එකම ප්‍රශ්න පත්‍රයි. 1964 දී එම විභාගයට පෙනී සිටි රුසිගම පාඨශාලාවේ ළමයි රාජකීය විද්‍යාලය වැනි උසස් පෙළේ විද්‍යාල පවා පරදවමින් සියයට සියයක්ම ප්‍රතිඵල පෙන්වා තිබෙන බව කියන්නට කැමතියි. අපේ රුසිගම පාඨශාලාවට යන ළමයි බස් පාරේ සිට සැතපුම් 3ක් පමණ දුරක් කඳු නගිමින් පයින් යන්නට ඕනෑ. ඒ පාඨශාලාවේ ළමයි සියයට සියයක්ම ප්‍රතිඵල පෙන්වූ නමුත් රාජකීය විද්‍යාලයේ ළමයි එවැනි තත්ත්වයකින් සමර්ථ වුණේ නැහැ. නුවර තිබෙන ලොකු විද්‍යාල වළ, කොළඹ තිබෙන ලොකු විද්‍යාලවල සහ වෙනත් නගරවල තිබෙන ලොකු විද්‍යාල වල සියයට 50ක් වත් සමර්ථ වුණේ නැති වකවානුවේ ඒ රුසිගම පාඨශාලාවේ ළමයින් සියයට 100ක්ම සමත් වුණා. අපේ ගම්බද ගොවි කම්කරුවන්ගේ ළමයින් ට හරියට අධ්‍යාපනයක් දෙනවා නම්, ධන වතුන්ගේ ළමයින්ට වඩා හොඳ ඉගෙනී මක් ලබා ගන්නට පුළුවන් බුද්ධි ශක්ති යක් ඔවුන්ට තිබෙන බවයි එයින් පෙනී යන්නේ.

දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ? අපේ ගරු ඇමතිතුමාට පින් සිදු වන්නට, දඹුල්ලේ තිබුණු විද්‍යාලයේ ඉගැන්වූ ගුරු වරුන් සියල්ලක්ම දැන් නගරයට යවා තිබෙනවා. අකුරන්ගොඩ මධ්‍ය මහා විද්‍යා ලයේ ගුරුවරුන් සියලු දෙනාම නගරයට යවා තිබෙනවා. එහි තිබුණු උපකරණත් නගරයට ගත්තා. ගලේවෙල නමැති ස්ථා නයේ බොහොම හොඳ විද්‍යාලයක් තිබුණා. ඒ විද්‍යාලයේත් ගුරුවරුන් සියලු දෙනා වම මාරු කර දැම්මා. ගම්බද පාඨශාලාවල ඉගෙනීම ලබන දුප්පත් ගොවි කම්කරු වන්ගේ දරුවන් ඔවුන්ගේ බුද්ධියේ මහි මයෙන් යම්කිසි උසස් තත්ත්වයකට ඒම වැළැක්වීමට මේ ආණ්ඩුව නොදැනුවත් වම ක්‍රියා කරගෙන යන බවයි, එයින් අපට පැහැදිළිව පෙනී යන්නේ.

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)
තමුන්නාන්සෙගෙ පුතා කොහේද?

**ටී. බී තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
කොයි පුතා ගැනද අහන්නෙ?

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)
ජර්මනියේ අධ්‍යාපනය ලබන පුතා ගැන.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නැහැ, නැහැ, තවම එහෙම එකක් නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමා, මගේ පුත්තු ගැන මට වඩා දැනගෙන ඉන්නෙ කොහො මද කියා මා දන්නෙ නැහැ. මගේ පුත්තු නම් සියලු දෙනාම දෙවියන්ගේ පිහිටෙන් ලංකාවේ වැජඹෙනවා. [බාධාකිරීමක්] මා උප්පැන්නය දුන් පුතුන් සියලු දෙනාම ලංකාවේ ඉන්නවා. මට කෙටියෙන් කියන් නට තිබෙන්නේ එපමණයි. අපේ හිත මිත්‍ර කොත්මලේ මන්ත්‍රීතුමා (රණතුංග මයා.) සමහරවිට බොරු ආරංචියක් දැන ගෙන මේක කියන්නට ඇති.

ගරු කථානායකතුමනි, අපේ ළමයින්ට ඉගෙනීම ලැබීමට තැනක් නැති වීම ගැන අප කණගාටු වෙනවා. මේ ආණ්ඩුව ක්‍රියා කරගෙන යන්නේ අධ්‍යාපනය කලින් තිබුණු පිළිවෙළට නැවත ගෙන ඒමටය කියායි අපට කල්පනා කරන්නට තිබෙන් නේ. ජාතික අධ්‍යාපනයක් ඇති වීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

අධ්‍යාපනය එක මූලස්ථානයකින් පාලනය විය යුතුය යන කල්පනාව අනුව තමයි—එක් කෙනකු බෙරේ ගහන විට සියලු දෙනාම ඒ අනුව නටන්නට ඕනෑය යන කල්පනාව අනුව තමයි—සියලුම පාඨශාලා රජයට ගැනීමට අප කටයුතු කළේ. පාඨශාලා සියල්ල රජයට ගැනීම ඒ කාලයේදී තමුන්නාන්සේලා අනුමත කළේ නැතත්, එය කොයි තරම් හොඳ දෙයක්ද, යහපත් දෙයක්ද, වටිනා දෙයක්ද යන්න දැන් තමුන්නාන්සේලාට අවබෝධ වී ඇති. පාඨශාලා රජයට ගැනීම නිසා ක්‍රමානුකූලව වැඩ කරගෙන යන්නට පුළුවන් බව දැන් තමුන්නාන්සේලාට පැහැදිලි වී ඇති. බොහොම දක්ෂ ඇමතිවරයකුය කියා සිතාගෙන සිටින තමුන්නාන්සේ එදා අධ්‍යාපන අමාත්‍ය පදවිය ඉසිලුවා නම් තමුන්නාන්සේටවත් ඒ තිබුණු බලපෑම්වල හැටියට පාඨශාලා සියල්ලම රජයට ගෙන ඒකාබද්ධ අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. අප ආරම්භ කළ ඒ ඒකාබද්ධ අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කරගෙන යන අතරම සැලකිල්ලට ගතයුතු තවත් කාරණයක් තිබෙනවා. එකිනෙකා උපන් හැටියට, උපන් සමර්ථකම් නැත්නම් සහජ දක්ෂකම් දක්වනවා නම් සාධාරණ පිළිවෙළට ඒකාබද්ධ අධ්‍යාපනය දෙන ගමන්ම ඒ සහජ දක්ෂකම් ගැනත් සොයා බලා ඒවා නව තවත් දියුණු කර ගැනීමට අත දිය යුතුයි. 'ආරේ ගුණ නැරේ' කියා අපේ පුරාණ කථාවක් තිබෙනවා. එමනිසා ජාතික වශයෙන් හෝ පවුල් වශයෙන් හෝ අපේ දරුවන් යම් යම් සහජ දක්ෂකම් ලබා ඉපදී සිටිනවා නම් ඒ සහජ දක්ෂකම් ගැන තවදුරටත් සොයා බලා අධ්‍යාපනය දීමට කටයුතු කළොත් තමයි සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වන්නේ.

පසුගිය අධ්‍යාපන සිය වස ගැන මා එදත් සඳහන් කළා. ඇත්ත වශයෙන්ම පසුගිය සිය වස තුළ අධ්‍යාපනයෙන් අපේ ජාතියට, ආගමට, භාෂාවට හා සිරිත්විරිත්වලට වූ හානිය මෙන්න මේ තරම්ය කියා ඔය ප්‍රදර්ශනයෙන් ප්‍රචාරය කිරීමට තමුන්නාන්සේ ඔය සියවස් බෙරය ගසනවා නම් අප ඉතාම සතුටු වෙනවා. සිය වසක් මුළුල්ලේ අප අන්ධකාර යුගයක සිටියා. ජාතික අධ්‍යාපන ක්‍රමයක් පිළිබඳව යන්තමින්වත් අත්තිවාරමක් දමන්නට පුළුවන් වුණේ බණ්ඩාරනායක යුගයේදීයි. සමහර විට අපේ අග මැතිතුමා එහෙම කල්පනා කරනවා ඇති අර එතුමන්ලාගේ කාලයේදී නිදහස් අධ්‍යාපනය නමින් ඇති කළ අධ්‍යාපන ක්‍රමය අප අනුමත කරනවාය කියා. තමුන්නාන්සේලාගේ කාලයේදී එවැනි අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ කළා. නමුත් අප එය උසස් කොට සලකනවාය කියා කල්පනා කරන්නට එපා. අප එය උසස් කොට සලකන්නේ නැහැ. ඒ කාලයේ බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය දෙනවාය කියා කථාවක් තිබුණා. නමුත් ඒ අධ්‍යාපන ක්‍රමයෙන් ලොකු ලොක්කන්ගේ දරුවන්ට නොමිලේ ඉංග්‍රීසි ඉගෙනගැනීමට අවස්ථාව සැලසුණා පමණයි. එපමණයි වුණේ. කොළඹ ප්‍රදේශය ගැන මා කථා කරන්නෙ නැහැ. අපේ ප්‍රදේශවල තිබුණු පාඨශාලා කීපයක් ගැන මා සඳහන් කරන්නම්. ධර්මරාජ විද්‍යාලය තිබුණා. ට්‍රිනිටි විද්‍යාලය තිබුණා. ඒවාගේම සාන්ත අන්තෝනි, සාන්ත සිල්වෙස්ටර් ආදී විද්‍යාල තිබුණා. දුප්පත් ළමයකුට මේ විද්‍යාලයක කිට්ටුවකටවත් යන්නට ඉඩක් ලැබුණේ නැහැ. නොමිලේ තමයි උගන්වන්නෙ. නමුත් දුප්පත් ගොවි කම්කරුවන්ගේ ළමයින්ට මේ විද්‍යාලවලට ඇතුළුවන්නට අවස්ථාවක් තිබුණේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

මධ්‍ය මහා විද්‍යාලත් තිබුණා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

මධ්‍ය මහා විද්‍යාලත් ඇති කළා තමයි. මගේ ප්‍රදේශයේ මධ්‍ය මහා විද්‍යාලයක් ගැන මා තමුන්නාන්සේට කියන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලයක් ඇති කළා. නමුත් ඒ මධ්‍ය මහා විද්‍යාලයට ගොඩනැගිල්ලක් තිබුණේ නැහැ. පොල් අතු මඩුවක් තිබුණේ. වර්තමාන ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා තමයි එදා අධ්‍යාපන ඇමති වශයෙන් ඒ පොල් අතු මඩුව කඩා ගොඩනැගිල්ලක් සාදා දුන්නෙ. එය කළේ 1956 දීයි. එතෙක් තිබුණේ නමින් මධ්‍ය මහා විද්‍යාලයක් පමණයි. ඊට පසු අප රුපියල් අට ලක්ෂයක් පමණ ඒ විද්‍යාලයට වියදම් කළ බව මා ආඩම්බර යෙන් කියන්නට සතුටුයි. නමුත් එම ගොඩනැගිල්ල සාදා පිළිවෙළක් කරගෙන ආවාම දැන් එහි ගුරුවරුන් සියලු දෙනාම ඉවතට ගෙන තිබෙනවා. දැන් නැවතත් ගොඩනැගිල්ල පමණයි; පරණ තත්ත්වය වම අධ්‍යාපනය බැස්සා. සමහර මධ්‍ය මහා විද්‍යාලවලින් සවල්ප වශයෙන් ළමයින් තෝරා ගත් බව මා පිළිගන්නවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
විශ්ව විද්‍යාලයටත් ගත්තා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
සමහර මධ්‍ය මහා විද්‍යාලවලින්, ඒ කියන්නෙ ඉබ්බාගමුව, තෝලංගමුව වැනි මධ්‍ය මහා විද්‍යාලවලින් විශ්ව විද්‍යාලයටත් ශිෂ්‍යයින් ගත්තා. නමුත් එවැනි මධ්‍ය මහා විද්‍යාල තිබෙන්නේ සවල්පයක් පමණයි. [බාධා කිරීමක්] විද්‍යාල කීපයක් බොහොම හොඳට සෑදූ බව අප දන්නවා. ඒවායින් හොඳම එකක් තමයි තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය. තෝලංගමුවෙ මහා විද්‍යාලයක් හැදුවෙ අපේ ගරු අගමැතිතුමාගේ ආසනයට අයිති ප්‍රදේශය නිසා වෙන්නට පුළුවනි. එවකට හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ ආසනයට අයිති නිසා නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය හැදුවා වෙන්නට පුළුවනි. හිටපු අගමැතිවරයකු වූ සර් ජෝන් කොතලාවල මැතිතුමා නිසා ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය ඇති කරන්නට ඇති. කුලියාපිටියටත් මහා විද්‍යාලයක් ඇති කළේ වර්තමාන වෙනද අධ්‍යාපන ඇමතිතුමා ඒ කාලයේ බොහොම දක්ෂ මන්ත්‍රීවරයකු හැටියට හිටපු නිසා වෙන්නට ඇති. තෝලන්ගමුව, ඉබ්බාගමුව, නුගවෙල සහ කුලියාපිටිය වැනි මධ්‍ය මහා විද්‍යාලත් ලංකාවේ වෙනත් බොහෝ පළාත්වල තිබෙන මධ්‍ය මහා විද්‍යාලත් සන්සන්දනය කර බලන්න.

අපටත් තරමක මධ්‍ය මහා විද්‍යාලයක් දී තිබෙනවා. මාතලේට දුන් ඒ මධ්‍ය මහා විද්‍යාලය තිබෙන්නේ අකුරම්බඩ. අකුරම්බඩ මධ්‍ය මහා විද්‍යාලයේ තත්ත්වයත් මා මුලින් සඳහන් කළ අනෙක් මධ්‍ය මහා විද්‍යාලවල තත්ත්වයත් දෙස බැලුවාම, අහසට පොළොව මෙන් වෙනස් තත්ත්වයක් ඇති බව පෙනී යනවා ඇති. ලොකු ඇමතිවරුන් හිටපු, බලවත් පුද්ගලයන් හිටපු ප්‍රදේශවල හොඳ අංග සම්පූර්ණ මධ්‍ය මහා විද්‍යාල ඇති කර තිබෙන බවත්, ඒවායේ වැඩ කටයුතු ඇතුත් බොහොම හොඳට කෙරීගෙන යන බවත් අපට පෙනෙනවා. ඒ කොයි හැටි වෙතත්, අහිංසක මිනිසුන් හිටපු ගම්වල ඇති කළ මධ්‍ය මහා විද්‍යාලවල තත්ත්වය ගැන කියන්නට ඒ තරම් වැදගත් දෙයක් නැහැ. ඒ විද්‍යාලවල තොරතුරු වාර්තා වලින් පෙන්වා දෙන්නට පුළුවනි. ගුරු වරු කී දෙනාද, ගොඩනැගිලි කොයි විධියේ ඒවාද, උපකරණවල තත්ත්වය කුමක්ද, ඉගැන්වූයේ මොනවාද, යනාදි තොරතුරු පෙන්වා දිය හැකියි. ඒවායේ ළමයින් කී දෙනාද හිටියේ කියන එකත් කියන්නට බැරි නැහැ. ඒ කාලයේ තෝලන්ගමුව, නුගවෙල, කුලියාපිටිය, ඉබ්බාගමුව වැනි මහා විද්‍යාලවල තත්ත්ව යත් කියන්නට පුළුවනි. ඒවායින් පවා, දුප්පත් මිනිසුන් සිටින ගම්බද ප්‍රදේශ වලට ඒ තරම් සැලකිය යුතු ප්‍රයෝජන යක් වුණේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
තෝලන්ගමුව ගම්බද ප්‍රදේශයක් නො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

පුදන කොටම කාපි යකා. හැම ගමකටම තිබුණේ නැහැ නමයි. ලඟ ගහන කොටම අටයි කියලා හැම තැනම එක වරම හදන්නට බැහැ නොවැ.

**පී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

කොහොම හරි ඒවායිනුත් ප්‍රයෝජනයක් ලැබුණා නම් ලැබුණේ ලොකු ධනවත් පවුල්වල උදවියට පමණයි. නිදහස් අධ්‍යාපනය කියන එකෙනුත් ප්‍රයෝජනයක් ලැබුණේ එහෙම උදවියටයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

තෝලන්ගමුවෙන් ප්‍රයෝජන ලැබුණේ ධනවතුන්ට පමණක්ද?

**පී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ශිෂ්‍යත්ව දීමේ ක්‍රමයක් උඩ පස්වැනි පංතියේදී තෝරා ගත් ටික දෙනකු මධ්‍ය මහා විද්‍යාලවලට ඒ කාලයේ භාර ගත්තා තමයි. ඒ ක්‍රමයෙන් සාමාන්‍ය දුප්පත් පිරිසටත් ප්‍රයෝජනයක් ලැබුණු බව පෙන්වීමට පමණක් කරන්නා වාගේ කටයුතු කළ බවත් අපට කියන්නට පුළුවනි. ඒ නිසා ඒ අධ්‍යාපන ක්‍රමයෙනුත් හරි ප්‍රයෝජනයක් වුණේ නැහැ.

බණ්ඩාරනායක අගමැතිතුමා ඉන්න කාලයේ හැම ළමයෙකුටම ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීමට කටයුතු සැලැස්සිය යුතුය කිව්වා. පාසල් දෙකක් අතර දුර හැතැප්ම දෙකකට වඩා නොතිබිය යුතුය කියාත් කිව්වා. ඊට ඉහල තත්ත්වයේ පාඨශාලාවලටත් පහසුකම් ඇති කරන්නට නියම කළා. විශ්ව විද්‍යාලයට ඇතුළුවීමේ පංති පැවැත්වෙන පාඨශාලා දෙකක් අතර දුර ප්‍රමාණය හැතැප්ම පහකට වැඩි නොවිය යුතුය කියා නියමයක් තිබුණා. ලංකාවේ කිසිම ළමයෙකුට ඊට වඩා දුරස්තර නොගිහින් ඉගෙනීම ලබන්නට පහසුකම් ඇති කළ යුතුය කිව්වා. නගරවලට පැමිණ අධ්‍යාපනය ලැබීමට ඒ කාලයේ තිබුණු අවශ්‍යතාව නැති කරන්නටයි එවැනි වැඩ පිළිවෙළක් ගැන නියම කර තිබුණේ.

සමහර විට මධ්‍ය මහා විද්‍යාල ඇති කරන්නට ඇත්තේත් ඒ අදහසින්මදැයි අපට කියන්නට බැහැ. ඒ කොයි හැටි වෙතත්, එයිනුත් ඒ තරම් ප්‍රයෝජනයක් වෙලා නැහැ. උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා නගරවලටම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇදී යෑම වැළැක්වීම පිණිස මධ්‍ය මහා විද්‍යාල ඇති කළා නම් ඒ පරමාර්ථය ඉෂ්ට වන ආකාරයට වැඩ කරන්නට යුතුකමක් තිබුණා. ඒ ඉලක්කය කරා යෑමේ පරමාර්ථයෙන් වැඩ කරගෙන ගියා නම් අකුරම්බඩ මහා විද්‍යාලයත් හරියාකාර අධ්‍යාපනයක් ලබා දෙන ආයතනයක තත්ත්වයට ගෙන ඒමට උත්සාහ කළ යුතුව තිබුණා. ඒ විද්‍යාලයටත් හොඳ ගුරුවරුන් මෙන්ම අවශ්‍ය උපකරණත් ලබා දිය යුතුව තිබුණා. විද්‍යාව වැනි විෂයයන් ඇතුළු අවශ්‍ය විෂයයන් උසස් අන්දමින් ඉගැන්වීමට වැඩ පිළිවෙළක් ඇති කළ යුතුව තිබුණා. අද ඒ විද්‍යාලය විනාශ වේගනයි යන්නේ. ඒ නිසා සාධාරණව කල්පනා කර, ළමයින්ට තමන්ගේ බුද්ධියට අනුව උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කර දීමට සෑහෙන වැඩ පිළිවෙළක් ඇති කරවන්නැයි සියවස හෝ මොන වස හෝ සිහිපත් කරන මේ කාලයේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට මා කියා සිටිනවා. සාධාරණ ලෙස කල්පනා කර, ඒ ඒ අයගේ දක්ෂතාවන් අනුව අධ්‍යාපනය ලබා දීමට සෑහෙන වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ.

විභාග ගත් තරමට, උපාධි ලබා ගත් තරමට ආණ්ඩුවට කරදරයයි ආණ්ඩුවත් ගරු අධ්‍යාපන ඇමතිතුමාත් හිතුවොත්, උගතුන් වැඩි වුණාම ඒ අයට රක්ෂාවල් දෙන්නට බැහැ කියා හිතුවොත්, එය විශාල වරදක්. රක්ෂාවල් සැපයීම අමාරු දෙයක් වන නිසා උපාධි ගැනීම සම්පූර්ණයෙන්ම නවත්වන වැඩ පිළිවෙළක් හෝ උපාධි ගන්න අය සීමා කිරීමේ වැඩ පිළිවෙළක් හෝ ඇති කළ යුතුයයි කල්පනා කරනවා නම් එයත් වැරදියි. අධිරාජ්‍යවාදීන් කල්පනා කළෙත් එහෙමයි. අධිරාජ්‍යවාදීන් කල්පනා කළෙත් ටික දෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත : සම්මතිය

කුට උගන්වමු, වැඩිපුර වුවමනා නැහැ කියලයි. ස්වල්ප දෙනකුට උගන්වා ඔවුන් ඉගෙන ගත්තත් නැතත්, ඉගනගත්තාය කියා පට්ටමක් නැත්නම් සහතිකයක් දෙනවා. ඒ කාලයේ රක්ෂාවලට මිනිසුන් බඳවා ගත්තේ අවශ්‍යතාවයේ හැටියට රක්ෂාවට වුවමනා කරන ආකාරයට නො වෙයි. ඒ කාලයේ කළේ මිනිසුන්ට වුව මනා විධියට රක්ෂාවල් ඇති කිරීමයි. තේ වත්තකට කම්කරුවන් 10 දෙනෙක් ඕනෑය කියා සුදුසුකම් අනුව කම්කරුවන් 10 දෙනෙක් බඳවා ගන්නවා වෙනුවට ඒ කාලයේ දී කළේ 10 දෙනකුට රක්ෂාව දෙන්නට ඕනෑ නිසා තනතුරු 10 ක් ඇති කිරීමයි. මිනිහා ඕනෑ නිසා තනතුරු හැදුවා මිස, තනතුරට ඕනෑ මිනිහා තෝරා ගත්තේ නැහැ. මුල සිටම කරගෙන ආවේ ඒ විධියටයි. එදා තනතුරු හැදුවෙත් දැන් ගරු අගමැතිතුමා ඇමතිකම් හදන්නා වගෙයි. මිනිහා ඕනෑ නිසා ඇමතිකමක් ඇති කරනවා මිස අවශ්‍යතාවය උඩ ඇමති කම් ඇති කරනවා නොවෙයි. අන්න ඒ විධියට මේ ආණ්ඩුවෙනුත් පසුගිය කාලයේ තිබුණු ආණ්ඩුවලිනුත් මිනිසුන් නිසා තනතුරු හැදුවා මිස අවශ්‍යතාවය උඩ තනතුරු ඇති කර සුදුසුකම් අනුව මිනිසුන් බඳවා ගැනීමේ ක්‍රමයක් ඇති කළේ නැහැ. අන්න ඒ විධියට කටයුතු සිදු වුණාය කියා අපට බාරගන්නට සිදු වී තිබෙනවා. කවුරු ආණ්ඩු කළත් කමක් නැහැ, මොන ආණ්ඩුවකින් හෝ මේ රට ඒ තත්ත්ව යෙන් ගලවා ගන්නට ඕනෑ. අපට ඕනෑ කරන්නේ සියලුදෙනාටම සාධාරණ ක්‍රම යක්. විශේෂයෙන්ම අධ්‍යාපනය අතින් සාධාරණ ක්‍රමයක් ඇති වන්නට ඕනෑ. එසේ නොකර, ලෝකයේ කිසිම රටක් නොකරන වැඩක් අපි කරනවා, අපි නොමිලේ අධ්‍යාපනය දෙනවා, නොමිලේ හාල් දෙනවා, නොමිලේ සෞඛ්‍ය පහසු කම් දෙනවා, නොමිලේ බේත් හේත් දෙනවා කිව්වාට මහජනයාට ප්‍රයෝජන වත් අන්දමින් ඒවා නොලැබෙන බවයි අපට පිළිගන්නට සිදු වී තිබෙන්නේ.

මොන ආණ්ඩුවෙන් අපට නොමිලේ හාල් දුන්නත් එයින් ලබන පාඩුව මෙන් දෙතුන් ගුණයක් අපට දෙන සීනිවලින් ගන්නවා. අපට නොමිලේ අධ්‍යාපනය දුන්නත් එයින් නියම විධියට වැඩක් වෙනවාද කියා අපි සොයා බලන්නට ඕනෑ. අපට නොමිලේ දෙන අධ්‍යාපන යෙන් ලෝකයේ අනිකුත් රටවල අධ්‍යා පනයෙන් ලැබෙන අන්දමේ ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ. ගොවිතැන දියුණු කිරීම සඳහා ගොවියෙකුට අධ්‍යාපනයක් ලබා දුන්නත් ඒ මගින් ඔහු ගොවිතැන දියුණු කරන අවස්ථාවේදී ප්‍රතිඵල ලබන් නෙ කොහොමද ? අපේ පැරණි ගොවියා වී ලාහක් වපුරා වී ලාස් 12 ක් ලැබුවා නම් ගොවිතැන පිළිබඳව අධ්‍යාපනයක් ලැබූ ගොවියා අඩු වශයෙන් වී ලාහක් වපුරා ලාස් 20 ක් වත් ගන්නට දැනගන්න එපායැ. ඒ අන්දමින් කටයුතු කෙරීගෙන යන බවක් අපට නම් දැනගන්නට ලැබී නැහැ. විශ්ව විද්‍යාල තිබෙන නමුත් ඒවා යින් විශ්ව ප්‍රයෝජනයක් ඇති වන අධ්‍යා පනයක් දෙනවාය කියා අපට නම් තවම විශ්වාස කරන්නට පුළුවන්කමක් නැහැ. ආයතනය විශ්ව විද්‍යාලය නම්, එහි දෙන්නේ විශ්ව අධ්‍යාපනයක් නම්, එහි ඉගෙන ගන්නා අයට විශ්ව තත්ත්වයක් ඇති කිරීමේ අධ්‍යාපනයක් ලබාදීම ඉතා මත්ම වටිනා දෙයක් බව මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ රටේ මිනිහා හැඩගැස්වීම පිණිස මේ රටේ අධ්‍යාපනය ඇතිවීම ඉතාම වැදගත් ය කියන එකයි කියන්නට තිබෙන්නේ. ගරු අධ්‍යාපන ඇමතිතුමා මගේ සැලකිල්ලට ලක් වී සිටින කෙනෙක්. අප දෙදෙනාගේ අදහස් හුඟක් දුරට සමානයි. අධ්‍යාපන යෙන් කෙරෙන්නේ මිනිසුන් හැදීම නම්, පසුගිය අවුරුදු තුනහමාරක කාලය තුළ ගරු අධ්‍යාපන ඇමතිතුමා මිනිසුන් හුව දක්වා හදා තිබෙන බව දැන් මේ රටේ මිනිසුන් කියනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்லை)
(The Hon. Iriyagolle)
හුව භාෂාවේ මුලනේ.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
නව අවුරුදු දෙකක් දෙකහමාරක් යන විට මේ හැදීම කොතැනින් කෙළවර වේදැයි කියනන්ට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. තෙන්නකෝන් මයා.]

අද පවතින්නේ බැණීමෙන් මිනිසුන් හැඩ ගස්වන්නට පුළුවන් කාලයක් නොවෙයි. ආදරයෙන් කරුණාවෙන් මෛත්‍රියෙන් හොඳ නරක කියා දී වරද පෙන්වා දීමෙන් මිස තැලීමෙන් බැණීමෙන් පොඩි ළමයකු පවා හදන්නට පුළුවන්කමක් ඇතැයි කවුරුන්වත් කල්පනා කරන්නේ නැහැ. ලෝකයේ තිබෙන නොයෙක් අන්දමේ ආයතන අතුරෙන් උසස්ම ආයතනයන් වන අධ්‍යාපන ආයතනවල මේ කාරණය විශේෂයෙන් බල පානවා. ඒවායේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යහ මඟට පත් කරනන්ට පුළුවන් වන්නේ කරුණාවෙන් මෛත්‍රියෙන් කරුණු කියා දීමෙන් පමණයි.

ගොවිතැන් කටයුතු හා හරකුන් මෙච්චල් කිරීම ආදී ඊට අවශ්‍ය අනෙක් සියලු දේත් අප කුඩා කාලයේ පටන්ම ගෙදර දොරේදී ඉගෙන ගත්තා. දැනුත් අපේ පළාත්වල ළමයින් ඔවුන්ගේ ගෙවලදී ඒ කටයුතු කරනවා. උදේ නැගිට තම එළවුළු වගාවට වතුර දැමීම, හරකුන් දිගේලි කිරීම ආදී වැඩ කටයුතු සියල්ල අවසාන කර සුදු ඇඳුමක් ඇඳගෙන ඉස්කෝලයට යන ළමයාට අද සිදු වී තිබෙන්නේ එහි දීත් ගොවිතැන් කරන්නයි. ඉස්කෝලය ඇරී ගෙදර ආපසු නැවතත් ඒ ළමයා මවුපියන් සමඟ එක් වී ගොවිතැන් වැඩ කරනවා. හරකුන්ට තණකොළ කපනවා; හරකුන් දිගේලි කරනවා; කුඹුරේ වතුර බඳිනවා; හේනට ගොස් එහි තිබෙන බෝගයක් කඩාගෙන එන්නට මවුපියන්ගෙන් අණක් ලැබුණොත් ඒකටත් යනවා. අද තිබෙන අධ්‍යාපනය යටතේ අපේ ළමයින්ට ඉස්කෝලයේදීත් කරන්නට සිදු වී තිබෙන්නේ උදේ සිට රෑ වනතුරු ගෙදරදී කරන වැඩමයි. දැන් ඒ ළමයින්ට ඉස්කෝලයේදී බනිස් ගෙඩිය ලැබෙන්නේත් නැහැ. සමහර තැන්වල නම් විස්කෝතු දෙනවායයි කියනවා. ඒකත් හරිහැටි ලැබෙන්නේ නැහැ. ළමයින් ගෙදරදී කරන වැඩම නැවතත් ඉස්කෝලයේදී ඔවුන්ට උගන්වන්නට ඕනෑකමක් ඇත්තේ නැහැ. අප කුඩා කාලයේදී පවා, මවුපියන් කුඹුරට යන විට පුංචි උදැල්ලක් අරගෙන ඒ සමඟ අපත් කුඹුරට යනවා. ඒ පුංචි උදැල්ලෙන් අප අතින් වැඩිපුර කුඹුර කෙටෙන්නේ නැතත් පියා කරන දේ අනුව අපත් පුළුවන් හැටියට ඒ වැඩ කරනවා. කොළ මඩවන විට අපත් ඊට සහභාගි වෙනවා. අපේ පළාත්වල සෑම ගොවියකුගේම ළමයින් අදත් මේ විධියට වැඩ කරනවා. අද ඒ ළමයින්ට සිදු වී තිබෙන්නේ, සුදු ඇඳුම් ඇඳගෙන උදේ ඉස්කෝලයට පැමිණි විට ඒ ඇඳුම් පිටින්ම කුඹුරට බහින්නයි. ළමයින් එසේ කුඹුරට බැස සිටිනවා මා ඊයේ පෙරෙයිදාත් දැක්කා. ඉස්කෝලෙ යන ඒ ළමයින් ඇඳුම් පිටින්ම කුඹුරට බැස්සාම පසුදාට අඳින්නට ඇඳුම් නැහැ. ඇමතිතුමන්ලාගේ ළමයින්ට ඇඳුම් ඕනෑ තරම් තිබෙන්නට පුළුවනි. එහෙත් අපේ ගම්බද සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය අනුව නම්, දවසින් දවස මාරු කරමින් අඳින්න ඒ ළමයින්ට හුඟාක් ඇඳුම් නැහැ. එම නිසා ඉස්කෝලවලට යන ළමයින් කුඹුරුවලට බැස්සවීම ඔවුන්ට විශාල කරදරයක් වී තිබෙනවා. ඒ ළමයින් ගෙදරදී, විශේෂයෙන් නිවාඩු කාලවලදී, කරන්නේ කුඹුරේ නැත්නම් හේනේ වැඩ තමයි. ඔවුන්ගේ දෙමාපියන් විසින් ඒ ළමයින් ඉස්කෝලවලට එවනු ලබන්නේ ලියන්නට කියන්නට පුරුදු කරවීම සඳහායි. එම නිසා, ඒ ළමයින් වුවමනා නැති වැඩවලට යොදවා තිබීමෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විශාල කරදරයක් කර තිබෙන බව ඒ අය සිතනවා. එම නිසා, මේ සියවසේදී පමණක් නොව කොයි වසේදී වුණත් ළමයින්ට නියම අධ්‍යාපනයක් දෙන්නට නම්, ඔවුන් නියම වැඩවල යොදවන්න ඕනෑ.

අධ්‍යාපන ඇමතිතුමාට කේන්ති ගිය පළියට, නොයෙක් දේවල් කී පළියට අපේ අධ්‍යාපනයවත්, අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්වත් නියම විධියට හැඩ ගැසෙන්නේ නැහැ. එතුමාට කේන්ති ගියාම තේරුමක් නැති කථා කියනවා; තේරුමක් නැති වැඩ කරනවා. එම නිසා, හොඳට කල්පනා කර බලා නියම විධියට වැඩ කරන්නට ඕනෑ.

අනෙක, මැති ඇමතිවරුන්ට හා උසස් නිලධාරීන්ට ගරු කරවීම සඳහා ළමයින් ගෙන ගොස් අව්වේ සිටවීමෙන් අධ්‍යාපනය දියුණු වන්නේ නැහැ. ඒ ළමයින්ගෙන් බලහත්කාරයෙන් වාගේ ගෞරව ලබා ගන්නට තැත් කිරීම විහිළුවක්. ගරු කළ යුත්තන්ට නිරායාසයෙන්ම ගරු සැලකිලි දක්වන විධියට, ඒ ළමයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැඩගස්වන්න ඕනෑ. තවත් හුඟාක් කරුණු කියන්නට ඇතත්, කාලවේලාව මඳ නිසා මගේ කථාව මෙතෙකින් නවත් වනවා.

අ. භා. 3

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

කථානායකතුමනි, මෙය අධ්‍යාපන "සියවස" නොව "සිව්වස" යනුවෙන් හඳුන්වනවා නම් වඩාත් හොඳයි. එවිට, පසුගිය අවුරුදු හතර තුළ මේ රජයෙන් කොයි විධියේ සේවයක් කර තිබෙනවා දැයි කියන්නට පුළුවන්කම ලැබෙනවා. පසුගිය අවුරුදු හතර තුළ අධ්‍යාපනය කොයි තරම් අවුල් වී තිබෙනවාදැයි කියන්නටත් එවිට පුළුවනි. අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ගේ තත්ත්වය මොකක්ද, පාසල්වල තත්වය මොකක්ද, විශ්ව විද්‍යාලවල තත්ත්වය මොකක්ද, ගුරුවරුන්ගේ තත්ත්වය මොකක්ද, කොටින්ම කියනවා නම් මේ රජය කළාය කියන මහා අධ්‍යාපන විප්ලවයේ ස්වරූපය මොකක්ද යන්න එවිට තේරුම් ගන්නට අවකාශය සැලසෙනවා. ඇත්ත වශයෙන්ම, පසුගිය අවුරුදු හතර තුළ මේ රජයෙන් පොදු මහ ජනතාවට ලැබී තිබෙන දායාදය මොකක්ද? අධ්‍යාපන සියවස ගැන නොව පසුගිය සිව් වස තුළ කෙරුණු අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් විග්‍රහයක් කරනවා නම් වඩා ප්‍රයෝජනවත් වේ යයි මා විශ්වාස කරනවා.

මෙය අධ්‍යාපනය පිළිබඳ සියවසක් නොව අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිබඳ සියවසක් බව අප අමතක කරන්න හොඳ නැහැ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව ආරම්භ කර සියවසක් ගත වීම නිමිත්තෙන්, එහි ඉතිහාසය ජනතාවට කියා පාන්නට තමයි, මේ සියවස උළෙල මඟින් අධ්‍යාපන ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ. ඇත්ත වශයෙන්ම අනුන් කළ වැඩ, පසුගිය ආණ්ඩුව කළ වැඩ පවා මේ ආණ්ඩුවෙන් කෙරුණු වැඩ හැටියට පෙන්වා, අධ්‍යාපන විප්ලවයක් කළා යයි මහජනයා ඉදිරියේ කියන්නට තමයි, මේ සියවස උළෙල පැවැත්වීමෙන් බලාපොරොත්තු වන්නේ. ගරු කථානායකතුමනි, මේ රටේ තිබුණු යටත් විජිත අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීමේ ගෞරවය පිරිනැමිය යුත්තේ 1956 දී ඇති වුණු ආණ්ඩුවටයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කන්නන්ගර ඇමතිතුමාට.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කන්නන්ගර මැතිතුමාට ගෞරව කරනවා. එතුමා නිදහස් අධ්‍යාපනය ඇති කිරීමට ක්‍රියා කළා. ගුරුවරුන් හැටියට නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අපත් සටන් කර තිබෙනවා. නිදහස් අධ්‍යාපනයේ වැදගත්කම ජනතාවට පෙන්වා දීම සඳහාත්, නිදහස් අධ්‍යාපන ක්‍රමයක් මේ රටට අවශ්‍ය බව කියාපෑම සඳහාත්, මාතර නගරයේ බ්‍රේඩ්වේ ශාලාවේදී පවත්වන්නට යෙදුණු මහජන රැස්වීම ගැන දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධ ගුරුවරයකු හැටියට මට මතකයි. එදා රුවන්වැල්ලේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටි වර්තමාන යටියන්තොට ගරු මන්ත්‍රීවරයාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ රැස්වීමට පැමිණ සිටියා. නිදහස් අධ්‍යාපනයේ තිබෙන වැදගත්කම, දුප්පත් දරුවන්ගේ සහජ දක්ෂතා දියුණු කිරීමේ වැදගත්කම, ලොක්කන්ගේ දරුවන්ට තිබෙන පහසුකම් දුප්පතුන්ගේ දරුවන්ටද දීමේ වැදගත්කම යන මේ කාරණා මහජනයාට පෙන්වා දෙමින් ඒ සම්බන්ධයෙන් මහ ජනතාව උනන්දු කරවන ලද්දේ වාමාංශිකයන් විසින් බව අමතක කරන්නට බැහැ. කන්නන්ගර ඇමතිතුමා ගෙන ආ පනත ක්‍රියාත්මක කිරීමට වාමාංශිකයන් විශේෂ උනන්දුවකින් ක්‍රියා කළා. [බාධා කිරීමක්] නිදහස් අධ්‍යාපනයේ ගෞරවය ගන්නට එක්සත් ජාතික පක්ෂයේ උදවිය ඇස්නි වෙනවා නම් එය මුළාවක් බව මතක් කරන්නට කැමතියි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

අධ්‍යාපනයේ වෙනසක් ඇති වුණේ 1956 න් පසුව බව කීවා නේද? මා කියන්නේ ඊට පෙර බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා ඒ කීවේ අධ්‍යාපනයේ වෙනසක් ඇති වීම ගැනයි. නිදහස් අධ්‍යාපනය ගැන නොවෙයි. කන්නන්ගර ඇමතිතුමා සිංහල මහා සභාවේ නායකයෙක්. එතුමා ඉදිරිපත් කළ නිදහස් අධ්‍යාපන ක්‍රමය බණ්ඩාර නායක උරුමයක්.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Mr. A. Ratnayake was the person who brought that Motion.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Where was it brought up ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

In the State Council.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He did not bring it up in the State Council.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

You were in the National Congress at that time.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He did not bring it in the State Council.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

He brought it up in the State Council. There was no party system then. There was the Sinhala Maha Sabha resolution which Mr. Kannangara implemented. You were in the National Congress.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Do not talk rubbish. This was a special committee on education where Mr. A. Ratnayake was a member. Do not talk about what you do not know.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නිදහස් අධ්‍යාපනය එක්සත් ජාතික පක්ෂයේ වැඩක් නොවන බව අගමැතිතුමා පිළිගැනීම ගැන මා සතුටු වෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒක කන්නන්ගර ඇමතිතුමාගේ වැඩක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ වුණාට එක්සත් ජාතික පක්ෂයේ සමහරුන් කියන්නේ නිදහස් අධ්‍යාපනය ගෙනෙන ලද්දේ එක්සත් ජාතික පක්ෂය විසින් බවයි. ඒ විධියට කියා මහජනයා මුළා කරන්නට හදනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එයා එක්සත් ජාතික පක්ෂය හදාපු නායකයෙක්. 1944 දී එක්සත් ජාතික පක්ෂයක් කොයින්ද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හොඳයි, නිදහස් අධ්‍යාපන යෝජනාවෙන් සිදු වුණේ මොකක්ද ? මුදල් ගෙවා ඉගෙන ගන්නට පුළුවන්කම තිබුණු ධනපති පංක්තියේ ළමයින්ට නොමිලේ අධ්‍යාපනය ලබන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

වුණා. නිදහස් අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කරන විටත් මේ රටේ බාගෙට නිදහස් අධ්‍යාපනයක් තිබුණා. ඒ කාලයේ දුප්පත් ගම්බද දරුවන් සිංහල පාසල්වල ඉගෙන ගත්තේ මුදල් ගෙවා නොවෙයි. ඒ කාලයේ මුදල් අය කළේ ඉංග්‍රීසි අධ්‍යාපනයටයි. වෙන විධියකින් කියනවා නම් නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් සිදු වුණේ කළුසුද්දන් ඇති කරන්නට නොමිලයේ ඉංග්‍රීසි අධ්‍යාපනය දීම ආරම්භ කිරීමයි. ගම්බද දුප්පත් දරුවන් ඊට කලිනුත් නිදහස් අධ්‍යාපන වරප්‍රසාදය භුක්ති වින්දා. මුදල් ගෙවා තමුන්ගේ දරුවන් උසස් විද්‍යාලවලට යැවූ දෙමව්පියන්ට නොමිලයේ ඒ අධ්‍යාපනය තම දරුවන්ට ලබා දෙන්ට වරප්‍රසාදය ලැබීමයි නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් සිද්ධ වුණේ. ඒක ඇත්ත. ඊට වඩා වෙනසක් වුණේ නැහැ. ඒ වුණත් අපි ඒ නිදහස් අධ්‍යාපන යෝජනාවලට අපේ එකඟත්වය පළ කළා. ඊට හේතුව අධ්‍යාපනය නිදහස් විය යුතු බව අප පිළිගත්ත නිසයි. දෙමව්පියන්ගේ ආර්ථික තත්ත්වයන් ගැන නොසලකා අධ්‍යාපනය කාටත් පොදුවේ ලැබිය යුතුයි. ඒ මාර්ගයෙන් තමයි, දුප්පත් දරුවන්ගේ, බුද්ධිමත් දරුවන්ගේ, දක්ෂකම් ජාතියේ යහපතට යොදවන්නට පුළුවන්කම තිබෙන්නේ. ඒ අදහස උඩ තමයි, මූලික පියවර හැටියට නිදහස් අධ්‍යාපන යෝජනාවලට අප එකඟ වුණේ.

එහෙත් ඒ නිදහස් අධ්‍යාපනය නොවෙයි, ජාතික අධ්‍යාපනය කියන්නේ. අධ්‍යාපනය නොමිලයේ දීම නොවෙයි ජාතික අධ්‍යාපනය කියන්නේ. මේ රටේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ මුල් පියවර ක්‍රියාත්මක කළේ බණ්ඩාරනායක රජය බව අපි කවුරුත් ගෞරවයෙන් සිහිපත් කරන්නට ඕනෑ. ජාතික අධ්‍යාපනය නම් ජාතියේ වුවමනාවන් ඉෂ්ට කරන අධ්‍යාපනයයි; දරුවන්ගේ දක්ෂකම් ජාතික සංවර්ධනයට පාවිච්චි කරන අධ්‍යාපනයයි. ජාති භේදයෙන්, වර්ණ භේදයෙන්, ආගම් භේදයෙන් තොරව සියලුම දරුවන්ට එක හා සමාන අධ්‍යාපනයක් ලබා දෙන අධ්‍යාපනය ජාතික අධ්‍යාපනයයි.

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මොකක්ද ඒ? මම එනතුරු එහෙම එකක් තිබුණේ නැහැ. 1968 වන තුරුවත් එහෙම එකක් තිබුණේ නැහැ, ගම්බද පාසල්වල—[බාධාකිරීමක්]

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr .Tudawe)

මම කියන්නම් අධ්‍යාපන ඇමතිතුමනි. [බාධාකිරීමක්] මේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ මුල් පියවර තමයි, පාඨශාලා ජනසතු කිරීම; පාඨශාලා රජයට ගැනීම. ජාතික සංවර්ධනයට, ජාතිය දියුණු කිරීමට, දරුවන්ගේ දක්ෂකම් දියුණු කිරීමට, දරුවන්ගේ දක්ෂකම් ජාතියේ යහපත සඳහා යෙදවීමට ඒ ගෙන ගිය ඉතාමත් වැදගත් අධ්‍යාපන විප්ලවයේ පළමුවෙනි කාරියට විරුද්ධ වුණේ කවුද? එක්සත් ජාතික පක්ෂයයි. දැන් කියනවා, මහා විප්ලවයක් කරන්නට යනවා කියා. එක්සත් ජාතික පක්ෂය තමයි, පාඨශාලා වට කර කම්බි ගසාගෙන "අපි මේවා දෙන්නේ නැහැ" කියන තැනට සමහර කොටස් උසි ගැන්නුවේ. පාඨශාලා වටකර කම්බි ගසා ගෙන ඒවා නොදී ආණ්ඩුවට විරුද්ධව විශාල ව්‍යාපාරයක් ගෙන යන්නට කටයුතු කළේ කවුද? එක්සත් ජාතික පක්ෂයයි, තමුන්ගේ මිත්‍ර ෆේඩරල් පක්ෂයත් සමඟ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කර්මාන්ත ඇමතිතුමා අපට හිටිය.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr .Tudawe)

ඔව්. කර්මාන්ත ඇමතිතුමා හිටිය. අධ්‍යාපන ඇමතිතුමාත් කොහොමද කියල මම දන්නෙ නැහැ. පොදුවේ ඒ පියවරට විරුද්ධ වුණේ එක්සත් ජාතික පක්ෂයයි. ගරු කථානායකතුමනි, පාසල් රජයට නොගෙන මේ රටේ ජාතික අධ්‍යාපනයක් ගොඩ නඟන්නේ කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ජාතික අධ්‍යාපනයේ පසුබිම සකස් කළේ බණ්ඩාරනායක රජයයි. නොයෙක් තර්ජන, ගර්ජන හා විප්ලවවලට මුහුණදී ඒ කටයුත්ත ඉටු කිරීම අපි ඉතා ගෞරවයෙන් සිහිපත් කරන්ට ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒක කළේ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒත් බණ්ඩාරනායක රජය නොවෙයිද? [බාධාකිරීමක්] හොඳයි එහෙම නම් ඒක හරි ගස්ස ගන්න.

ඒ වගේම ජාතික අධ්‍යාපනය ගැන කථා කරන විට ඒ රජයේ හිටපු අධ්‍යාපන ඇමති බදිඋද්දීන් මහ්මූද් මහත්මයාත් අපි ගෞරවයෙන් සිහිපත් කරන්ට ඕනෑ. මේ රටේ අධ්‍යාපන ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන නාමයක් තමයි, බදිඋද්දීන් මහ්මූද් නාමය. මුස්ලිම් ජාතිකයකු වුවත් රට ගැන සහ ජාතිය ගැන තිබෙන කැක්කුම නිසා ධනපතීන්ට, ප්‍රතිගාමීන්ට සහ අධිරාජ්‍යවාදීන්ට ඉඩනොදී කෙළින්ම පාසල් ජනසතු කිරීමේ ව්‍යාපාරය ඉදිරියට ගෙන ගිය නිසා බදිඋද්දීන් මහ්මූද් හිටපු අධ්‍යාපන ඇමතිතුමාට අපි ගෞරව කරන්නට ඕනෑ. මෙම අධ්‍යාපන සියවසේ වීරයා බදිඋද්දීන් මහ්මූද් මහතා බව මේ ගරු සභාව ඉදිරිපිටදී කියන්නට මා කැමතියි. එදා පාසල් රජයට නොගත්තා නම් කෙසේද ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන්නේ? වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාගේත් අදහස තිබෙනවා වෙන්නට පුළුවනි, ජාතික අධ්‍යාපනය පවත්වාගෙන යන්නට. එහෙත් ඊට මුල් පියවර තැබුවේ කවුද? තමුන්නාන්සේට මෙහි මුල් පියවර තබන්නට අවස්ථාව ආවා නම් මේ හත් හවුල් ආණ්ඩුව ඊට ඉඩ දෙනවාදැයි මා අහනවා. මේ ආණ්ඩුව තමුන්නාන්සේට ඉඩ දේවිද, පාසල් ජනසතු කරන්නට? ඇත්ත වශයෙන්ම ඉඩ දෙන්නේ නැහැ. තමුන්නාන්සේට ඒක කරන්නට වුවමනාවක් තිබුණත් මේ රජය ඊට ඉඩදෙන්නේ නැහැ. එවැනි ආණ්ඩුවක් තමයි දැන් තිබෙන්නේ.

නිදහස් අධ්‍යාපනය ගැන නිතරම කතා කරනවා. මේ රටේ විශාල අධ්‍යාපන පෙරළියක් වී තිබෙනවායැයි කියනවා. මෙවැනි නිදහස් අධ්‍යාපනයක් ලෝකයේ කොහේවත් නැතැයි ගරු අධ්‍යාපන ඇමතිතුමාම කිව්වා. මේවා කාට කියනවාදැයි මා දන්නේ නැහැ. මා ලෝකයේ වෙනත් රටවල එතරම් ඇවිදලා නැහැ. එහෙත් මා අසා තිබෙන අන්දමට නැති නම් මා පොතපතින් කියවා තිබෙන අන්දමට ලෝකයේ රටවල් පණස් ගණනකම නිදහස් අධ්‍යාපනය තිබෙනවා. සෝවියට් දේශ සීමාවේ පිහිටි ඉතා නොදියුණු ඇෆ්ගනිස්තානයේ පවා අද නිදහස් අධ්‍යාපනයක් තිබෙනවා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*
(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)
කී දෙනෙකුටද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක නොවෙයි ප්‍රශ්නය. ඒ උදවියගේ ආර්ථික ක්‍රමයේ හැටියට කටයුතු කරන්නට ඕනෑ.ක්‍යුබාවේ තත්ත්වය කෙසේද? [බාධා කිරීමක්] චෙකොස්ලොවෙකියාව ගැනත් කියන්නම්.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
චෙකොස්ලොවෙකියාවේ දැන් තිබෙන වාද කියන්නට අපි දන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
හා හැබෑද? ඉස්සර නම් දන්නවා. දැන් නම් දන්නේ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
බැංකොක්වල කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කියුබාවේ තත්ත්වය කොහොමද? කියුබාවේ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට ඇඳුම් පවා දෙනවා. තමුන්නාන්සේ එය නැතෙයි කියනවාද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ශිෂ්‍යත්වවලට.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ශිෂ්‍යත්වවලට ඇඳුම් පවා දෙනවා. කියුබාවේ යෝධ විද්‍යාල තිබෙනවා. 1961 වර්ෂය කියුබාවේ අධ්‍යාපන වර්ෂය හැටියට සලකනවා. නූගත්කම තුරන් කිරීම සඳහා කියුබාව විශාල සටනක් ගෙන ගියා. 1961 ජූලි 6 වන දින කියුබාවේ ඇති වූ විප්ලව යෙන් පසු ඒ රටේ පාසල් සියල්ල ජනසතු කළා. ඒ අනුව සම්පූර්ණයෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඒ රටේ ඇති කර තිබෙනවා. ඒ අධ්‍යාපන කටයුතු පිළිබඳව ඉංග්‍රීසි භාෂාවෙන් මෙසේ සඳහන් කර තිබෙනවා:

"There was a joke about free tuition which was exceedingly limited. This contrasts to the present situation where not only tuition is free but most of the students enjoy scholarships which guarantee their room and board in modern apartment buildings assigned to scholarship students as well as providing their clothing, books and supplies and spending money."

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඒ ශිෂ්‍යත්ව දිනාගත් සමහර ළමයින්ට.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඒ අයට නේන්නම් දෙන්නේ. ඒ රටේ අධ්‍යාපන වර්ෂය හැටියට 1961 වර්ෂය සලකාගෙන මුළු රටම අවදි කරවාගෙන මුළු රටේම උගතුන්ගේ ආධාරය ඇතුව කියුබාවේ නායකයා වන පිදෙල් කස්ත්‍රෝ ඒ රටේ ජනතාවගේ නූගත්කම තුරන් කිරීම සඳහා විශාල ව්‍යාපාරයක් ගෙනිච්චා. එය සාර්ථක ව්‍යාපාරයක් හැටියට හඳුන්වන්නට පුළුවනි. මොකක්ද අපේ රටේ තත්ත්වය? මහා අධ්‍යාපන පෙරළියක් ගැන කථා කරනවා. අද ලංකාවේ අකුරු නොදන්න අයගේ සංඛ්‍යාව කොපමණද? මොකක්ද අධ්‍යාපනය කියන්නෙ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කියුබාවේ කොයි තරම් ඉන්නවද කියා දන්නවාද? සියයට 55 ක් ඉන්නවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පට්ටපල් බොරු.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ වචනය නම් පාවිච්චි කරන්නට එපා.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
Not as high as in Ceylon.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Oh yes! It is higher now.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
No. No. No.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
It is higher than what it was but not as high as in Ceylon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

It is higher than what it was, certainly.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

They have eliminated illiteracy practically altogether.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

You cannot do it overnight.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

They did it. I was there in 1961.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

You may have been there. I admit they have made tremendous advances.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමා කී දේ සම්පූර්ණ මුසාවාදයක්ය කියා මා කියනවා. [බාධා කිරීමක්] ක්‍යුබාව ගැන කියන විට තමුන්නාන්සේලාට මේ තරම් කැක්කුමක් ඇති වන්නෙ ඇයි ?

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

කා ගැන වුණත් කමක් නැහැ, ඇත්ත කියන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඇත්ත මම තව ටිකකින් කියන්නම්. ගරු කථානායකතුමනි, අද මේ රටේ නූගත්කම නැති කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මේ රජය ලෑස්තිද ? ලෝක බැංකු වාර්තාවේ මේ රටේ අධ්‍යාපනය ගැන කියන්නෙ මොකක්ද ? පළමු වැනි ශ්‍රේණියේ සිට 8 වැනි ශ්‍රේණිය දක්වා—වයස අවුරුදු 14 දක්වා—මේ රටේ ශිෂ්‍යයන්ගෙන් සියයට 50 ක් වත් අධ්‍යාපනය නොලබන බවයි, 8 වැනි ශ්‍රේණිය වන තුරු සියයට 50 ක් වත් ඉතිරි නොවන බවයි, කියන්නේ. සියයට 50 ක් මගදී හැලිලා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අනිත් රටවල තත්ත්වය කොහොමද ? තමුන්නාන්සේගේ හිතේ හැම ළමයාම පළමුවැනි ශ්‍රේණියේ සිට විශ්ව විද්‍යාලය දක්වා ඉගෙනීම ලබනවාය කියලද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කියන්නේ මූලික අධ්‍යාපනය ගැනයි. මූලික අධ්‍යාපනය කියන්නේ 1 වැනි ශ්‍රේණියේ සිට 8 වැනි ශ්‍රේණිය දක්වායි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

1 වැනි ශ්‍රේණියේ සිට 8 වැනි ශ්‍රේණියට යන විට දියුණුය කියන රටවල කොයි තරම් ප්‍රමාණයක් ඉතිරි වෙනවද ? සියයට 40 යි ; 50 යි ; 55 යි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සමාජවාදී රටවල සියයට 100 යි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

ඒක ඇත්ත නොවෙයි. ඒක කවදාවත් වෙන්න බැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මොකක්ද ඇත්ත ? මේ රටේ සියයට 50 ක් මූලික අධ්‍යාපනය ලබන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහරු 1 වැනි ශ්‍රේණියෙන් නවතිනවා. සමහරු 2 වැනි ශ්‍රේණියෙන් නවතිනවා. සමහරු 3 වැනි ශ්‍රේණියෙන් නවතිනවා. මූලික අධ්‍යාපනය ලැබුවාය කියන්නට පුළුවන් වන්නේ 8 වැනි ශ්‍රේණිය දක්වා ගියොත් පමණයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ලංකාවේ සියයට 85 කට ලියන්නට කියන්නට පුළුවන්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
යන්තම් අත්සන් කරන්නට පුළුවනි. මේකද ආඩම්බර වන අධ්‍යාපනය?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මූලික අධ්‍යාපනය කියන්නේ 8 වැනි ප්‍රමාණය දක්වායි. ප්‍රාථමික අධ්‍යාපනය කියන්නේ 6 වැනි ප්‍රමාණය දක්වායි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගන්නට කී දෙනකුට අවස්ථාව ලැබෙනවද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කී දෙනෙක් ඉපදෙන විටම මැරෙණවද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කව්රුත් මැරෙණවා. ඒක නවත්වන්නට බැහැ. ගරු කථානායකතුමනි, මීට හේතුව මේ රටේ තිබෙන දුප්පත්කමයි; දෙමව්පියන්ගේ ආර්ථික අමාරුකමයි.

ජාතික අධ්‍යාපනය ගැන කථා කරන විට අපට ශිෂ්‍යයන් ගැන තමයි, කථා කරන්නට තිබෙන්නේ.

ශිෂ්‍යාශිෂ්‍යාවන් ගැන කථා කරන විට අපට කියන්නට තිබෙන්නේ මූලික අධ්‍යාපනය, එනම් පළමුවැනි ශ්‍රේණියේ සිට අට වැනි ශ්‍රේණිය දක්වා වූ, මූලික අධ්‍යාපනය, මේ රටේ දරුවන්ගෙන් සියයට 50 කටවත් නොලැබෙන බවයි. මේ තත්ත්වය හරිගස්සන්නේ නැතිව මේ රටේ අධ්‍යාපනය ගැන අපට ආඩම්බර වෙන්නට පුළුවන්ද කියා මා ප්‍රශ්න කරනවා. ඒ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ තත්ත්වයයි.

ඊළඟට විද්‍යා අධ්‍යාපනය ගැන බලමු. ඇත්ත වශයෙන්ම මේ රටේ විද්‍යා අධ්‍යාපනය පිළිබඳව පවතින තත්ත්වය ගැන කථා කරන්නටත් ලැජ්ජයි. ලෝකයේ ශිෂ්ට සම්පන්න සෑම රටක්ම විද්‍යාවෙන් තොර අධ්‍යාපනයක් නැත කියා කල්පනා කරනවා. යම් අධ්‍යාපන ක්‍රමයකින් විද්‍යාව පිළිබඳව අවබෝධයක් නොලැබෙනවා නම් ඒක නියම අධ්‍යාපන ක්‍රමයක් නොවෙයි. නමුත් විද්‍යා අධ්‍යාපනය පිළිබඳ මේ රටේ පවතින තත්ත්වය කුමක්ද? 1964-65 වර්ෂය සඳහා විභාග කොමසාරිස්ගේ පාලන වාර්තාවෙන් මා කොටසක් කිය වන්නට සතුටුයි. විභාග කොමසාරිස් මොකක්ද කියන්නෙ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
අප එන්න ඉස්සර.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
"විද්‍යා අධ්‍යාපනය අතින් පහසුකම්, සංඛ්‍යා ලේඛන අනුව, සැලකීමේදී පෙනෙන විෂමතා ඉතා තියුණුය."

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඇත්ත තමයි. එහෙම තත්ත්වයක් තිබුණා. ඒක නොවැ අප දැන් ඒ විෂමතාවන් නැති කරගෙන යන්නෙ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
නමුත් නාන්සේලාගේ කාලයෙනුත් කොටසක් අසු වෙනවා මේකට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මාර්තු සිට සැප්තැම්බර් දක්වා. වැඩි කොටසක් තමුන්නාන්සේලාගේයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

"මෙයට නිදර්ශන බොහෝ දිය හැකිය. ගාලු දිස්ත්‍රික්කයෙන් සියයට 10.3 ක් අයදුම්කරුවන් මුළු විභාගයටම ඉදිරිපත්ව ඇතත්, විද්‍යා ශිෂ්‍යයන් ගෙන් ගාලු දිස්ත්‍රික්කයෙන් පෙනී සිටියේ සියයට 5.1 ක් පමණකි. එහෙත් යාපනයේ දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 8.3 ක් වුවත්, විද්‍යා ශිෂ්‍යයන්ගෙන් සියයට 20.1 ක් පෙනී සිටියේ යාපනයෙනි. ඉදිරිපත් වූ මුළු ගණන් හා ඉදිරිපත් වූ විද්‍යා ශිෂ්‍යයන් අනුව බලන කල, සාධාරණත්වය ඇත්තේ මාතලේ පමණක් බවත් කොළඹ දකුණට හා යාපනයට විද්‍යා පහසුකම් බෙහෙවින් ඇති බවත් කිව හැකිය. කොළඹ දකුණින් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 24.5 ක් ඉදිරිපත් වූ අතර විද්‍යා ශිෂ්‍යයන්ගෙන් සියයට 51.5 ක් ඉදිරිපත් වූහ. යාපනයේ මුළු ශිෂ්‍යයින් ගෙන් සියයට 8.3 ක් පෙනී සිටියත් විද්‍යා ශිෂ්‍යයන් ගෙන් සියයට 20.3 ක් ඉදිරිපත් වුයේ යාපනයෙනි. තව ද කොළඹ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගෙන් සියයට 48.9 ක්ද යාපනයේ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගෙන් සියයට 55.9 ක්ද විද්‍යා ශිෂ්‍යයෝ වූහ. කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල තදබදය වළක්වාලීමට විද්‍යා අධ්‍යාපනයට පහසුකම් සාධාරණව ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ත විය යුතුයයි සිතමි."

මේ අසතුටුදායක තත්ත්වය සම්බන්ධයෙන් නුවරඑළිය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාරේ, මොනරාගල, අක්කරෙයිපත්තු හා වවුනියා දිස්ත්‍රික්ක ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. මේ දිස්ත්‍රික්කවල එකම ශිෂ්‍යයකුවත් එම වර්ෂයේ අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂයයන් ගෙන නැහැ.

මේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති කරන්නට නම් විශේෂයෙන්ම විද්‍යා අධ්‍යාපනයක් ලබා දීම ඉතාම අවශ්‍යයි. නමුත් විද්‍යා අධ්‍යාපනය පිළිබඳව අද තිබෙන්නේ කොයි තරම් භයානක තත්ත්වයක්ද? රැකීරක්ෂාවක් නැති කලා උපාධිධාරීන්ගේ සංඛ්‍යාව දැන් අවදහසක් වී තිබෙනවා. විද්‍යා උපාධිධාරීන්ට නම් රක්ෂාවක් ලබා ගැනීමට පුළුවන්කම තිබුණත්, කලා උපාධිධාරීන්ට රක්ෂා ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. එම නිසා ඔවුන් අද අනාථ තත්ත්වයකට පත් වී සිටිනවා.

අධ්‍යාපනය නොමිලයේ ලැබෙතත් වෛද්‍ය විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව ආදිය හදාරන්නන්ට ඒ සඳහා අවශ්‍ය පොත්පත්, උපකරණ සහ වියුෂන් ගාස්තු සඳහා සෑහෙන මුදලක් වැය කරන්නට සිදු වන නිසා බොහෝ දෙනාට එයින් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට අමාරු වෙලා තිබෙනවා. ඒ නිසා අද විද්‍යා අධ්‍යාපනය සහ කලා අධ්‍යාපනය අපේ සමාජයේ සිටින ඇති මිනිසුනුත් නැති මිනිසුනුත් අතර ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ අනුව, ඇති අයට විද්‍යාව; නැති අයට කලාව. වෙනත් වචනවලින් කියතොත්, පොහොසත් අයට විද්‍යාවත් දුප්පත් අයට කලාවත් හදාරන්නටයි වෙලා තියෙන්නේ. ඔය තත්ත්වයයි අද තිබෙන්නේ. ඒ නිසා වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් ඇති කරන්නට ඕනෑ. විද්‍යා අධ්‍යාපනය මුළු ලංකාව පුරාම එක ලෙස පැතිර යන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයෙන් — යුනෙස්කෝවෙන් — ලංකාවට විශාල මුදලක් ලැබුණු බව මීට පෙර දවසක මා විසින් සඳහන් කරන්නට යෙදුණා. විද්‍යා අධ්‍යාපනය සඳහා විද්‍යා විද්‍යාලයක් අත්තනගල්ලේ ඇති කරන්නට ඒ මගින් මුදල් ලැබුණා. එහෙත් ඒ වැඩ කොටස කොයිතරම් දුරට අතපසු කර තිබෙනවාද? මේ රටේ විද්‍යා අධ්‍යාපනයට තිබෙන අවශ්‍යතාවත්, එහි බැරෑරුම්කම සහ බර පතලකමත් කෙබඳුදැයි අපට තේරෙනවා. එවැනි වැදගත් තත්ත්වයක් තිබියදී මේ ආයතනයෙන් ලැබුණු මුදල පවා හරියාකාර පාවිච්චි කරන්නෙ නැතිව මෙතෙක් ප්‍රමාද කිරීම ගැන වගකියන්නට ඕනෑ කවුද? මේ ආණ්ඩුව මේ ගැන වගකියන්නට ඕනෑ. අත්තනගල්ලේ පිහිටුවන්නට අදහස් කළ නිසාදෝ මේ ආණ්ඩුව ඒ කටයුත්ත හරියාකාර සාර්ථක අන්දමට ඉටු කරන තත්ත්වයක් අපට නම් පෙනෙන්නේ නැහැ.

අද මේ රටේ ශිෂ්‍යයන් තුළ විශාල අසහනයක් තිබෙනවා. ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම බොහෝ රටවල ශිෂ්‍යයන්ගේ අසහනයක් තිබෙන බව අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දකින්නට ලැබෙනවා. ලෝකයේ නොයෙක් විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ගේ අසහනයක් තිබෙන බවට ලකුණු තිබෙනවා. ඒ ලකුණු ප්‍රංශයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගෙන් දකින්නට ලැබෙනවා වෙන්නට පුළුවනි. ජර්මනියේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගෙන් සහ එංගලන්තයේත්, ඉතාලියේත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුළින් පිළිබිඹු වන්නට පුළුවනි. එවැනි අවස්ථා රාශියක් අපට දකින්නට ලැබී තිබෙනවා. ධනපති රටවල විශ්ව විද්‍යාලවල ඉන්න ශිෂ්‍යයින්ගේ විශාල අසහනයක් තිබෙනවා. ඒ ශිෂ්‍යයන් ඉදිරිපත් කරන ඉල්ලීම් ඉෂ්ට කරන්නට ධනපති රටවලට අද බැරි වෙලා තියෙනවා. සෑහෙන ගොඩනැගිලි, උපකරණ, ශිෂ්‍යාධාර ඇති කර දෙන්නටත්, විශ්ව විද්‍යාලවල කටයුතුවලට ශිෂ්‍යයින්ගේ සහභාගිත්වය ලබා ගන්නටත් වැඩ පිළිවෙළක් ඇති කරන්නට බැරි වෙලා තියෙනවා. මෙවැනි දේවල් සඳහා අද ලෝකයේ සෑම තැනම ශිෂ්‍යයන් සටන් කරන්නට පටන් අරන් තිබෙනවා. වෙනත් විධියකින් කියනවා නම් අද ලෝක ශිෂ්‍යයන්ගේ විප්ලවයක් ආරම්භ වෙලා තියෙනවා, ධනපති රටවල තිබෙන අධ්‍යාපන ක්‍රමයට විරුද්ධව. ලෝකයේ ශිෂ්‍යයන් අද කැරලි ගහන්නට පටන් අරන් තියෙනවා, ඒ ඒ රටවල තිබෙන අධ්‍යාපන ක්‍රමයට විරුද්ධව. මීට සමාන තත්ත්වයක් ළඟදී ලංකාවේත් ඇති වේවි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(දොම්පෙ)
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*
(Mr. F. R. Dias Bandaranaike—Dompe)
There is no Quorum, Sir.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்.*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, මුළු ලෝකයේම ශිෂ්‍යයින් අසාධාරණකම්වලට විරුද්ධව, වඩා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීම පිණිස විශාල කැරලි ගැසීමක් ආරම්භ කර තිබෙනවා. විශ්ව විද්‍යාලවල කටයුතුවලට සහභාගි වීමට පමණක් නොවෙයි ඔවුන් බලාපොරොත්තු වන්නේ. ඔවුන් විශ්ව විද්‍යාලවල විභාග ක්‍රමය පවා ප්‍රතිසංස්කරණය කරන්නැයි අද ඉල්ලනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය දවසක මාතර රාහුල විද්‍යාලයේ කළ කථාව ගැන මා කනගාටු වෙනවා. මාත් එතුමා ළඟම වේදිකාවේ එදා සිටියා. ගරු ඇමතිතුමෙක් යම් කිසි උත්සවයකට ඇමතිතුමෙක් හැටියට සහභාගි වනවිට ඒ පළාතේ මන්ත්‍රීවරයාටත් ඔහුගේ අදහස් ප්‍රකාශ කරන්නට ඉඩ ප්‍රස්තාව ලබාදීම සාමාන්‍ය ප්‍රතිපත්තියක්. එහෙත් ඒ අවස්ථාව මට නොලැබුණු බව මා ඉතා කණගාටුවෙන් මතක් කරනවා. ඒ අවස්ථාව නොලැබුණාට මට කිසිම පාඩුවක් නැහැ. අපි දේශපාලනය කරන්නේ පාඨශාලාවලින් නොවෙයි. එහෙත් මාතර තිබෙන ප්‍රධානම විද්‍යාලය වන රාහුල මහා විද්‍යාලයේ තෑගි බෙදාදීමේ උත්සවයේදී කථා කළේ ගරු ඇමතිතුමා පමණයි. වෙන කිසිවෙක් කථා කළේ නැහැ. මාත් එහි සිටි නමුත් මට කථාවක් කරන්නට ඉඩක් ලැබුණේ නැහැ. ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමා කළ යම් යම් ප්‍රකාශයන් ගැන මා ඉතා කණගාටුවෙන් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ගුරුවරුන් දේශපාලන කටයුතු සඳහා පාඨශාලා යොදා ගන්නට එපාය, ශිෂ්‍යයන් දේශපාලනය කරන්න පාඨශාලා යොදා ගන්නට එපාය කී ගරු ඇමතිතුමා එහිදී කළේ දේශපාලන කථාවක්. එතුමා කළේ දේශපාලන පක්ෂවලට පහර ගැසීමක්. අපි බොහොම සාමකාමීව ඉවසිල්ලෙන් සිටියා. අපට ඉවසන්නට පුළුවන්. පක්ෂවලට පහර ගැසුවාට මට කමක් නැහැ. එහෙත් ඒ උත්සවයේදී බොහොම අසත්‍ය කරුණු ගරු ඇමතිතුමා කිව්වා.

එක කරුණක් මම ඉදිරිපත් කරන්නම්. අද විශ්ව විද්‍යාල බොහොමයක්ම නරක තත්ත්වයකට පත් වී තිබෙනවා යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
එතුමා කීවා. ප්‍රංශයේ සෝබෝන් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ ඉල්ලීම නම් රාත්‍රි කාලයේ ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරයට යන්නට ශිෂ්‍යයන්ටත් ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාරයට යන්නට ශිෂ්‍යාවන්ටත් අවසර ඉල්ලීම යයි කිව්වා. එය ඇත්තක්ද කියා මා අහනවා. ඒ ඉල්ලීමට ඉඩ නොදුන් නිසා ඩිගෝල්ගේ ආණ්ඩුව පෙරළා දමන්නට විශාල පෙළපාළියක් ගියාය කීවේ ඇත්තක්ද කියා ගරු ඇමතිතුමාගෙන් මා අහනවා. එය ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා යයි එතුමා කී නමුත් තිබුණේ මොන ප්‍රවෘත්ති පත්‍රයේද කියා කීවේ නැහැ. රැස්වීමෙන් පසුව දෙමව්පියන් ගණනාවක්ම මා හමු වී කියා හිටියා ප්‍රංශයේ සෝබෝන් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ ඉල්ලීම රාත්‍රි කාලයේ ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරයට යන්නට ශිෂ්‍යයන්ටත් ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාරයට යන්නට ශිෂ්‍යාවන්ටත් අවසර ඉල්ලීමයි, එය පත්තරවල පළ වී තිබුණා කියා ගරු ඇමතිතුමා කීවා, නමුත් අපි එය දැක්කේ නැත කියා. ගරු කථානායකතුමනි, මෙවැනි බොරු ප්‍රකාශ කරන එක—මෙවැනි අසත්‍ය ප්‍රකාශ කරන එක—හරිද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
අසත්‍ය කරුණු ප්‍රකාශ කරන්නේ අප දෙදෙනාගෙන් කවුද කියන එකනේ ප්‍රශ්නය. එය අප දෙදෙනාටම විසඳන්න බැහැනේ. ඒකත් එක ඉල්ලීමක් බව මා ඇනුත් කියනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
එදා කීවේ ප්‍රධාන ඉල්ලීම ඒකය කියලයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ප්‍රධාන ඉල්ලීම නොවෙයි, ඒකත් එක ඉල්ලීමක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
වෙන ඉල්ලීම් එකක් ගැනවත් ගරු ඇමතිතුමා කීවේ නැහැනේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔක පමණයි කියන්නට සිදු වුණේ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
නොදන්නා දේවල් කියන්න එපා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
දැනගෙන තමයි කිව්වේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු ඇමතිතුමා කීවේ ශිෂ්‍යයින් පෙළපාළි ගියේත්, විදුලි කම්බි කැඩුවේත්, රථ වාහන වලට ගසා ඒවා කුඩු කළේත්, ආණ්ඩුව පෙරළන්නට සූදානම් වුණේත් ඒ ඉල්ලීම උඩයි කියලයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
පිරිමි කාන්තා නේවාසිකාගාරය කඩාගෙන එයට ඇතුල් වුණේ ඊට පසුව තමයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අනේ මම දන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මාත් දන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු ඇමතිතුමා අර විධියට කී බවයි මා කීවේ. මා නම් එයට ඇහුම්කන් දීගෙන හිටියේ බොහොම අප්‍රියජනක ලෙසිනුයි. මගේ විශ්වාසයේ හැටියට නම් එය සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක්. ශිෂ්‍යයන් ඉල්ලීම් ඉදිරිපත් කරන විට ධනවාදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

රටවල තිබෙන බංකොළොත්කම වහගන්නට—ඉල්ලීම් දෙන්නට බැරිව—ශිෂ්‍යයින් වෙනුවෙන් ඉදිරිපත් කරන ද්වේශසහගත චෝදනා තමයි ඒ. ලංකාවේ දෙමව්පියන්ට ප්‍රංශයෙන් නිදර්ශන ගෙනැවිත් පෙන්වනවා, මෙන්න ප්‍රංශයේ ශිෂ්‍යයන්ගේ ඉල්ලීම් කියා. එසේ කරන්නේ ලංකාවේ ශිෂ්‍යයන්ගේත් මෙවැනි ඉල්ලීම් තිබෙනවාය කියා පෙන්වා දෙන්ටයි. ළමයින් විශ්ව විද්‍යාලවලට යවන්න එපාය කියා දෙමව්පියන්ට කිව්වා. විශ්ව විද්‍යාල සංස්කෘතිය හෝ සභ්‍යත්වය අතින් කිසිම වැදගත්කමක් නැති මේ රටේ තිබෙන්නට නුසුදුසු ආයතන වගයක් කියන අදහසයි ගරු ඇමතිතුමා දුන්නේ. විශ්ව විද්‍යාල වලින් වැඩක් නැත කියා ඇමතිතුමා හිත නවා නම් ඒවා නැති නොකර ළමයින් එවන්න එපාය කියා දෙමව්පියන්ට කියන්නේ කුමටද? ළමයින් හදාගන්න ඕනෑ නම් විශ්ව විද්‍යාලවලට එවන්න එපා කියා ඇමතිතුමා කියනවා. තම දරුවන් ගෙදර නවත්වා ගන්නවා මිස විශ්ව විද්‍යාලවලට එවන්නට එපාය කියමින් දෙමවුපියන් අධෛර්යයට පත් කිරීමේ තේරුම මොකක්ද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
විශ්ව විද්‍යාල හදන්න ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
හදන්න. හදන්නේ නැතිව, ළමයින් විශ්ව විද්‍යාලවලට එවන්න එපායයි දෙමවුපියන්ට කියන්න එපා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ළමයින්ගේ ආරක්ෂාව තියෙන්න ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
දැනට ආරක්ෂාව නැත්නම්, එය ඇති වන තුරු විශ්ව විද්‍යාල වහන්න. තමුන්නාන්සේ යටතේ තිබෙන විශ්ව විද්‍යාල නියම තත්ත්වයෙන් පාලනය කරන්නට තමුන්නාන්සේට බැරි නම් වෙන මොනවා කරන්නද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මගේ යටතේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
එහෙනම් කවුරුන් යටතේද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
"ඔටොනොමිය".

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
තමුන්නාන්සේ අලුත් නීතියක් ගෙනාවේ ඔටොනොමිය නැති කරන්නනේ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තම දුර්වලකම් වසා ගැනීම සඳහා, වැදගත් සභාවලට ගොස් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ඔවුන්ගේ දෙමවුපියන් ඉදිරියේ ගරු අධ්‍යාපන ඇමතිතුමා විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් මෙවැනි ප්‍රකාශයක් කිරීම ඉතාම අසාධාරණ බවයි මගේ අදහස.

අද මේ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙස බලන විට ඔවුන් තුළ එක්තරා වෙනසක් නම් සිදු වී තිබෙන බව අපට පෙනෙනවා. ඒ, ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ ශ්‍රමාභිමානය ඇති කිරීමේ ව්‍යාපාරයයි. ශ්‍රමය අභිමානයක්, වැඩ කිරීම අභිමානයක්, යන අදහස ඔවුන් තුළ ඇති කිරීම සඳහා උත්සාහයක් දරා තිබෙන බව මා පිළිගන්නවා. එහෙත් ශිෂ්‍යයන් ලවා කුඹුරුවල වල් පැළ නෙළීමේ ව්‍යාපාරය නම් සාර්ථක වී නැති බව මේ ආණ්ඩුවේ උපදේශකයන් වන ලෝක බැංකුව එහි වාර්තාවෙන් ප්‍රකාශ කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කියවන්න ඒ කොටස.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
වාර්තාව දැන් මා ළඟ නැහැ. තමුන්නාන්සේට මම එය පෞද්ගලික වශයෙන් පසුව පෙන්වන්නම්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
පෞද්ගලික වශයෙන් කිය යුතු දේ මෙතැන කියන්නේ මොකටද ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පොතෙන් කියවූ දේ මා කියන්නේ. වගා ව්‍යාපාරයෙන් ළමයින්ගේ අධ්‍යාපන යට පහරක් වැදී තිබෙන බව ලෝක බැංකු වාර්තාවෙහි සඳහන් වී තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කෝ ? අභූත චෝදනා නොකර, එය කියවා පෙන්වා දෙන්න. ලෝක බැංකු වාර්තාවේ තිබෙන දේ කවදාවත් නොපිළිගන්න තමුන්නාන්සේලා මේ කරුණ පමණක් පිළිගෙන තිබෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
වගා ව්‍යාපාරය සාර්ථක නැති බව තමුන්නාන්සේලාට උපදෙස් දෙන අයම කියනවා. මම එය පසුව පෙන්නන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යම් වාර්තාවකින් කරුණු ඉදිරිපත් කරනවා නම් එය කියවන්නට ඕනෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
වල් නෙළීමේ ව්‍යාපාරයෙන් සාර්ථක ප්‍රතිඵල ලැබී නැති නිසා දැන් මොකක්ද කරන්නට යන්නේ ? දින පහ හයක් කරන්නට යනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
සම්පූර්ණයෙන්ම මිථ්‍යාවක්. අසත්‍ය ප්‍රකාශයක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එවැනි අදහසක් නැති බව තමුන්නාන්සේ කියනවා නම් මම එය පිළිගන්නම්.

ගුරුවරුන්ගේ අද තත්ත්වය ගැන අපි ඊළඟට කල්පනා කර බලමු. 1963, 1964 දී පමණ—මේ ආණ්ඩුව බලයට එන්නට පෙර—මේ රටේ ගුරුවරුන් ඔවුන්ගේ ගුරු සංවිධාන ගොඩ නඟාගෙන විශාල සටනක් කළා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
දේශපාලන සටනක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දේශපාලන සටනක් නොවෙයි, ජාතික අධ්‍යාපනයක් ඇති කිරීමේ සටනක්. මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වරට ගුරුවරුන් වීථිවලට බැස ජාතික අධ්‍යාපන ක්‍රමයක් සඳහා විශාල සටනක් කෙළේ ඒ කාලයේදීයි. එහෙත් පසුගිය ආණ්ඩුව, ඔවුන් ගෙන්වා ප්‍රශ්න කොට ඔවුන්ට දඬුවම් කෙළේ නැහැ. ඒ ගුරුවරුන්ම පසුගිය සභාග රජය පැවති කාලයේදී ජාතික වශයෙන් බලපාන ඉල්ලීම් ඉදිරිපත් කළා පමණක් නොව, වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් පවා ඉදිරිපත් කරමින් සටන් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

පසුගිය අවුරුදු තුනේදීමත් මන්ත්‍රීතුමා ඔය කාරණයම කියා තිබෙනවා. මාත් තුන් වතාවක්ම ඕවාට පිළිතුරු දී තිබෙනවා. දැන් හතර වැනි වතාවටත් ඒ කාරණාම කියනවා. පසුගිය අයවැය විවාදයේදීත් මන්ත්‍රීතුමා ඔය කාරණාම කියා තිබෙනවා. හොඳයි, කියන්න. මමත් උත්තර දෙන්නම්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

පසුගිය රජය පැවති කාලයේදී ගුරුවරුන්ට නිදහසක් තිබුණා, තම අදහස් නිර්භයව ප්‍රකාශ කරන්න. එය තමා ගුරුවරයකුට ලැබිය යුතු මූලික අයිතිවාසිකම. ගුරුවරුන්ට සිය වෘත්තීය සංගම් කටයුතුවල යෙදෙන්නට බැහැ, තම නිදහස් අදහස් ප්‍රකාශ කරන්නට අවකාශයක් නැත්නම්. ගුරුවරුන්, පසුගිය රජය පැවති කාලයේදී සිය නිදහස් අදහස් නොබියව පළ කළා පමණක් නොව, වෘත්තීය සංගම් හදාගෙන රජයට විරුද්ධවත් සටන් කළා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මන්ත්‍රීතුමා නිදහස් අදහස් ගැන කථා කරනවා. එහෙත් චෙකෝස්ලෝවැකියාවට බෑ, රුසියාවට විරුද්ධව නිදහස් අදහස් ප්‍රකාශ කරන්න. මෙහෙ බණ කියනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගුරුවරුන් ගැන කියන විට ඇමතිතුමාට ඉන්න බෑ. එම නිසා නැගිට යනවා. පසුගිය රජය පැවති කාලයේදී ගුරුවරුන් පෙළ පාලි ගියා පමණක් නොවෙයි; ඔවුන් ජාතික අධ්‍යාපනය පිළිබඳව නොයෙකුත් යෝජනා ඉදිරිපත් කළා. නොයෙකුත් අයිතිවාසිකම් ඉල්ලමින් ඔවුන් සටන් කළා. ඒ වාගේම, පසුගිය රජය පැවති කාලයේදී ඔවුන් විශාල වශයෙන් අයිතිවාසිකම් ලබා ගත්තා. ගුරු මාරු මණ්ඩලයක් ඇති කරවා ගන්නටත් ඔවුන්ට පුළුවන්කම ලැබුණා. පසුගිය රජය, ඒ කාලයේ දී ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්තා, ඒ ඒ ප්‍රශ්නය පිළිබඳව ගුරු සංගම් නියෝජිතයන් කැඳවා සාකච්ඡා කළ යුතුය කියා. මේ ආදි වශයෙන් පසුගිය රජය ගුරුවරුන්ගේ වෘත්තීය සංගම් ව්‍යාපාරයට නොයෙක් ලෙසින් ආධාර දුන්නා.

ඒ විතරක් නොවෙයි. මීට කලින්, ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් ඔවුන්ගේ මාසික වේතනයෙන් සියයට 4 ක් කපා ගත්තත්, එය සියයට 2 දක්වා අඩු කළෙත් පසුගිය රජයයි. ගුරුවරුන්ගේ උසස්වීම් සම්බන්ධයෙන් කමිටු පත් කරන විට, ඒවාට ගුරු සංගම් නියෝජිතයන්ද පත් කිරීමට භාර ගත්තේත් පසුගිය රජයයි.

එහෙත් මේ රජයෙන් අද කෙරෙන්නේ මොනවාද ? පසුගිය රජයෙන් ගුරුවරුන්ට ලැබුණු අයිතිවාසිකම් එකින් එක මේ රජය විසින් කපා හරිනවා. මේ රජය දැන් ක්‍රියා කරගෙන යන්නේ, ගුරුවරුන්ගේ වෘත්තීය සංගම් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අහෝසි කර දැමීම සඳහායි. ජාතික අධ්‍යාපන ක්‍රමයක් හදන්නට මේ රජය කල්පනා කරනවා නම්, ගුරුවරුන්ගේ සහයෝගය නැතිව එවැන්නක් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේදැයි මා අහන්න කැමැතියි. බලහත්කාරයෙන් ඒවා ක්‍රියාත්මක කරන්නද, මේ රජය බලාපොරොත්තු වන්නේ ? බලය පාවිච්චි කර මෙවැනි වැදගත් කාර්යයක ගුරුවරුන් යොදවන්න පුළුවන් වේවිද ? දැනට ගුරුවරුන් තුළ ඇති මානසික අසහනය නැති කොට ඔවුන්ට සහනය දී, ඔවුන් සමඟ සාකච්ඡා පවත්වා ඔවුන්ගේ ඉල්ලීම් ගැන සලකා බලා, ජාතික අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දී කටයුතු කිරීමයි, රජයේ පරම යුතුකම. එහෙත් මේ රජයෙන් නම් ඒ විධියේ කිසිම දෙයක් කෙරෙන බවක් පෙනෙන්නට නැහැ. රජය ගුරුවරුන් දිහා බලන්නේ වපරඇහිනුයි. අද ලංකාවේ ගුරුවරුන් වැටී තිබෙන්නේ මෙවැනි අවාසනාවන්ත තත්ත්වයකටයි.

අධ්‍යාපන සියවසක් ගැන කථා කළත්, ගුරුවරුන්ගේ පඩිනඩි ප්‍රශ්න ගැන මේ රජය කටයුතු කර තිබෙනවාද ? සිංහල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ගුරුවරයාත්, ඉංග්‍රීසි ගුරුවරයාත් අතර තිබෙන වැටුප් පරතරය නැති කරන්නට මේ රජයට තවමත් බැරි වී තිබෙනවා. ඒ වැටුප් පරතරය අඩු කරන බවට පසුගිය මැතිවරණ කාලයේදී නම් තමුන්නාන්සේලා පොරොන්දු දුන්නා. එහෙත් අද වැඩ කෙරී තිබෙන්නේ නම්, ඒ පරතරය තවත් වැඩි වන ආකාරයටයි. මේ රජය තරම් ගුරුවරුන්ගේ ප්‍රශ්නවලදී කර ඇරිය වෙනත් රජයක් නම් ඇත්තේ නැහැ. ගුරුවරුන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් මේ රජය කටයුතු කර තිබෙන්නේ ඉතාමත් නරක අන්දමටයි.

අද ශිෂ්‍ය ගුරුවරයකුට ලැබෙන වැටුප කීයද? රුපියල් සියයයි. අමතර දීමනාත් සමග එකතු කළ විට ඔවුන්ට මාසයකට ලැබෙන්නේ රුපියල් 135 ක් පමණයි. රුපියල් 100 මුළු වැටුප ගැන කල්පනා කරන විට එහි මූලික වැටුප රුපියල් 35 කට වැඩි නොවන බව පේනවා. එහෙම නම් අද ශිෂ්‍ය ගුරුවරුන් පත් කරන්නේ රුපියල් 35 මූලික වැටුපකටයි. අද සහතික පත්‍ර ලත් ගුරුවරුන්ගේ මූලික වැටුප රුපියල් 64 යි. යම් කෙනකු ගුරුවරයකු වශයෙන් පත් වී පාසලක උගන්වන විට ලැබෙන්නේ රුපියල් 64 ක මූලික වැටුපක් වුණත් ඔහු ලිපිකරුවකු වශයෙන් පත් වී කාර්යාලයක වැඩ කරන්නට ගිය විට රුපියල් 80 ක මූලික වැටුපක් ලැබෙනවා. මේ අතර ඔහු බැංකු ලිපිකරුවකු හැටියට පත් වුණොත් රුපියල් 120 ක මූලික වැටුපක් ලැබෙනවා. එකම සුදුසුකම් ඇති තැනැත්තන්ට නොයෙක් විධියේ වැටුප් ක්‍රම තිබෙනවා. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිපිකරුවකු වශයෙන් පත් වුණොත් රුපියල් 124 ක මූලික වැටුපක් ලබන්නට පුළුවන් වෙනවා. එකම සුදුසුකම් තියෙන තැනැත්තාට එක තැනක ගෙවන්නේ රුපියල් 35 යි. තවත් තැනක රුපියල් 124 යි.

ගරු කථානායකතුමනි, ගුරුවරුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් සෑහෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැහැ. ලක්ෂයකට වැඩියෙන් සිටින ගුරුවරුන් ගෙන් භාගයක් නුපුහුණු අයයි. නුපුහුණු ගුරුවරුන් ලවා සෑහෙන තත්ත්වයක අධ්‍යාපනයක් ඇති කරන්නට බැහැ. කොයි වැඩකට වුණත් යම් තැනැත්තකු තෝරා ගන්නවා නම් එසේ තෝරා ගන්නේ ඒ වැඩ කටයුතු පිළිබඳ දැනුමක් පළපුරුද්දක් තිබෙන කෙනකු නේද? නුපුහුණු, පළපුරුද්ද නැති අයගෙන් උසස් සේවයක් බලාපොරොත්තු වන්නට බැහැ. ඒ ඒ කර්මාන්ත පිළිබඳ දැනුම් තේරුම්, පළපුරුදුකම් හා පුහුණුව තිබෙන අය ඒ ඒ කර්මාන්ත අංශයන්හි සේවය සඳහා බඳවා ගත්තත් ළමයින්ට අධ්‍යාපනය දීම සඳහා ගුරුවරුන් වශයෙන් තෝරා ගන්නේ අධ්‍යාපන ක්‍රම පිළිබඳව, අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳව, ළමයින්ගේ හිත් ක්‍රියා කරන ආකාරය පිළිබඳව දැනුමක් තේරුමක් නැති අයයි. සමාජවාදී රටවල නම් නුපුහුණු ගුරුවරුන් පාඨශාලාවලට පත් කරන්නේ නැහැ. ඉගැන්වීම පිළිබඳ පුහුණුව පමණක් නොව, විශේෂයෙන්ම ප්‍රාථමික පංක්තිවල උගන්වන උදවිය මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ පුහුණුවක් ද ලබා ගන්නවා. පුංචි ළමයින්ගේ නිර්මල අවංක හිත් අපවිත්‍ර නොකර කටයුතු කරගෙන යන්නට හොඳ දක්ෂ පුහුණු ගුරුවරුන් ඉන්නට ඕනෑ. ඒ ළමයින්ගේ එඩිතරභාවය දියුණු කරන්නට නම් ඔවුන්ගේ අභිත අදහස් දියුණු කරන්නට නම්, ඒ ළමයින් දවසින් දවස ඉදිරියට යන ගුණ ගරුක යුක්ති ගරුක අයවලුන් බවට පත් කරන්නට නම් ඒ අයට උගන්වන ගුරුවරුන් අධ්‍යාපන විද්‍යාව ගැන, මනෝ විද්‍යාව ගැන, අධ්‍යාපන මූල ධර්ම ගැන දැනගෙන ඉන්නට ඕනෑ. [බාධා කිරීමක්] ගරු කර්මාන්ත ඇමතිතුමා අධ්‍යාපනය ගැන දන්නේ නැහැ. එතුමා දන්නේ කර්මාන්ත ගැනයි. ඒ නිසා නොදන්නා දේවලට කට නොගසා ඉන්නා ලෙස මා එතුමාට මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ සිටින ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් ළමයින්ට අධ්‍යාපනය දීමේ කටයුතු සඳහා සුදුසු තත්ත්වයක නැහැ. දැනට පවතින අධ්‍යාපන ක්‍රමයේ වරද මීට හේතුවයි. මේ ක්‍රමය වෙනස් කර වැඩි වැඩියෙන් ගුරුවරුන් පුහුණු කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වී තිබෙනවා. ලෝකයේ සමාජවාදී රටවල ගුරුවරුන් තුන් හතර වර පුහුණු කරවනවා. දියුණු වන සමාජය සමග, දියුණු වන විද්‍යාව සමග අධ්‍යාපන ක්‍රමවල වෙනස්වීම් ඇති වන නිසා ඒවා පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුහුණුවක් ලබා දීමට ඔවුන් වරින් වර පුහුණු කරවීමයි සමාජවාදී රටවල සිරිතව තිබෙන්නේ. මේ රටේ පුහුණු ගුරුවරුන් නව වරක් පුහුණු කරනවා තබා නුපුහුණු ගුරුවරුන්ගේ සංඛ්‍යාව අඩු කිරීම සඳහාවත් වැඩි වැඩියෙන් ගුරුවරුන් පුහුණු කර වන්නේ නැහැ. දැනට අවුරුදු 50 කට පෙර අනුගමනය කල අධ්‍යාපන ක්‍රම උඩ තමයි තවමත් අපේ අභ්‍යාස විද්‍යාලවල පුහුණුවක් ලබා දෙන්නේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අපිත් ඒ ක්‍රම පටන් ගන්න ඕනෑ. එතකොට ලෙහෙසියෙන් කරන්ට පුළුවනි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඇත්ත. තමුන්නාන්සෙත් පිළිගන්නවා. පිළිගත යුතු කාරණයක් ඒක. පුහුණු වීමෙන් පසු අවුරුදු 20 ක්, 25 ක් සේවය කරන ගුරුවරුන්ට ඒ කාලය තුළදී ඔවුන්ගේ දැනුම දියුණු කර ගන්නට අවස්ථාවක් ඇත්තෙ නැහැ. ගුරුවරයකු හැටියට තමන්ගේ රාජකාරිය සාර්ථක ලෙස කරන්නට නම් සමාජයේ විටින් විට ඇති වන තත්ත්වයන් අනුව ගුරුවරයාත් වෙනස් වෙන්නට ඕනෑ. ගුරුවරයාට ඒ ඒ අවස්ථාවල පුහුණුවක් ලබා දෙන්නට ඕනෑ. එහෙම නැත්නම් දියුණු වන සමාජයත් සමග ඔහුට ඉදිරියට යන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා වරින් වර ගුරුවරුන් පුහුණු කිරීමට කටයුතු කිරීම ඉතා අවශ්‍ය දෙයක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වෙලා කථා කරණවාද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

පැයක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

දැන් පැයක් කථා කරල තියෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவா)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, අවුරුදු 100 ක දේවල් ගැන කථා කරන්ට තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මම ඇහුවෙ කොච්චර වෙලා කථා කරන වාද කියලයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අවුරුදු 100 ක දේවල් ගැන පැයකින් කථා කරන්නේ කොහොමද කථානායක තුමනි?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එහෙනම් අවුරුදු 100 ක් කථා කරන්නද යන්නෙ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

පුළුවන් තරම් ඉක්මනින් මම ඉවර කරන්නම්. වැඩිම වුණොත් තව විනාඩි 20 කින් විතර ඉවර කරන්නම්.

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ සහයෝගය ඇතිව ගුරුවරුන්ගේ සේවා තත්ත්වයන් පිළිබඳව ජාත්‍යන්තර නිර්දේශයන් සකස් කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P.M. On resumption, the Hon. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி.ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபா நாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Sitting accordingly suspended till 4.30* P.M., *and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කතා කරමින් සිටියේ ගුරුවරුන්ගේ සේවා තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනයක් මගින් කරන ලද නිර්දේශ සමූහයක් පිළිබඳවයි. ඒ ගැන කතා කරන අවස්ථාවේදීම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලසුන් ගෙන සිටී ම ගැන මා ඉතා සන්තෝෂයට පත් වෙනවා. මා දුටුවා තමුන්නාන්සේගේ නමින් න්‍යාය පත්‍රයේ පළ වී තිබෙන එක්තරා යෝජනාවක්. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ මෙහෙයීමෙන් පවත්වන ලද රටවල් 80 ක නියෝජිතයන්ගෙන් සැදුම් ලත් සම්මේලනයකදී ගුරුවරුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ගන්නා ලද තීරණ සමූහයක් ලංකාණ්ඩුව මගින් පිළිගෙන ක්‍රියාත්මක කරන්නට ඕනෑය යන යෝජනාවයි තමුන්නාන්සේගේ නමින් න්‍යාය පත්‍රයේ පළ වී තිබුණේ. එම කාරණයට අදාළව මා කතා කරන්නට යන අවස්ථාවේදීයි තමුන්නාන්සේ මූලාසයනට පැමිණියේ.

තමුන්නාන්සේ සඳහන් කර තිබෙන එම ප්‍රකාශනය තමයි ගුරුවරුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පළ කර තිබෙන ඉතාම උසස් ප්‍රකාශනය. අධ්‍යාපනයෙහි අරමුණ හා අධ්‍යාපන ප්‍රතිපත්ති යනාදිය ගැන පමණක් නොවෙයි එම සම්මේලනයෙහිදී සඳහන් වී තිබෙන්නේ. ගුරු වෘත්තියෙහි තිබෙන වැදගත්කම රැක දීම, වැඩි වැඩියෙන් ගුරුවරුන් පුහුණු කිරීම, ගුරුවරුන්ට වැඩිදුර අධ්‍යාපනයක් ලබා දීම, ගුරුවරුන්ගේ සේවයෙහි උසස්වීම්වලට කටයුතු සලස්වා දීම, ගුරුවරුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව ඇති කිරීම හා වෘත්තීය නිදහස රැක දීම, ගුරුවරුන්ගේ සේවා කාලය පිළිබඳ තත්ත්වය රැක දීම, ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳීම, ගුරුවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය රැක දීම, ගුරුවරුන්ට ආපදා සහනාධාර රෝග සහනාධාර යනාදිය ලබා දීම සහ ගුරුවරුන්ගෙන් යැපෙන්නන්ට සහනාධාර සලසා දීම යනාදී වැදගත් කරුණු රාශියක් පිළිබඳ යෝජනා තමයි එම ජාත්‍යන්තර සම්මේලනයේදී ස්ථිර කර තිබෙන්නේ. එම සම්මේලනයට ලංකාවද සහභාගි වී තිබෙනවා. එම සම්මේලනයට සහභාගි වූ රටවල් 80 න් එකක් වන ලංකාවෙහි බල පවත්වන රජයෙහි යුතුකම කුමක්ද? තම රටත් සහභාගි වී තිබෙන සම්මේලනයකදී ගුරුවරුන් වෙනුවෙන් නිර්දේශ කොට තිබෙන යම් යම් කරුණු ගැන විශේෂ සැලකිල්ලක් දැක්වීමයි ඒ යුතුකම වන්නේ. එම නිර්දේශ වලින් සියයට සියයක්ම ක්‍රියාත්මක කරන්නට අපහසු වුවත්, ඒවායින් ඉතා වැදගත් නිර්දේශවත් පිළිගෙන ඒවා ක්‍රියාත්මක කරන්නට උත්සාහ දැරීමයි එහි ප්‍රතිඵලය විය යුත්තේ. එසේ නොමැති නම් මහජන මුදල් වැය කරමින් මෙවැනි සම්මේලනවලට නියෝජිතවරුන් සහභාගි කරවීම කිසි වැඩකට නැති දෙයක් හැටියට සලකන්නට පුළුවනි. මේ නිර්දේශ ඉතාමත් වැදගත් නිර්දේශ. ලෝකයේ නොයෙකුත් විධියේ අධ්‍යාපන විශාරදයන්, අධ්‍යාපන විශේෂඥයන්, දීර්ඝ කාලීන අත්දැකීම් ඇති ගුරුවරුන් සහභාගි වී තීරණය කර තමයි, මේ නිර්දේශ සකස් කර තිබෙන්නේ. එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවිධ සමාජ ක්‍රම තිබෙන රටවල නියෝජිතයන් මෙයට සහභාගි වී තිබෙනවා. සමාජවාදී රටවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිතයන්, ධනවාදී රටවල නියෝජිතයන්, යටත්විජිතවල නියෝජිතයන් සහ ළඟදී නිදහස ලැබූ රටවල නියෝජිතයන්, එසේම නොයෙක් ආණ්ඩුක්‍රම තිබෙන රටවල නියෝජිතයන් එකට එකතු වී සාකච්ඡා කර තමයි, මේ නිර්දේශ ඒකමතිකව සකස් කර තිබෙන්නේ.

ලෝකයේ අධ්‍යාපන තත්ත්වය උසස් කිරීමට නම් ඒ අධ්‍යාපනයට අත හිත දී වැඩ කිරීමට කැප වී සිටින ගුරුවරයාට සමාජයේ ලැබිය යුතු නියම ස්ථානය දී, ඔහුගේ කථා කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කර, රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිය හැඩගස්වා ගැනීමට ඔහුගෙන් ලබා ගත හැකි ඉතාමත්ම ඉහළ තත්ත්වයේ සහයෝගය ලබාගෙන කටයුතු කළ යුතුය යන වැදගත් ප්‍රතිපත්තිය මුල් කොටගෙනයි, මේ නිර්දේශ සකස් කර තිබෙන්නේ. ඒ නිසා මා නැවතත් ඉල්ලා සිටිනවා, මේ නිර්දේශ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා මොන පියවරක් ගන්නට යනවාද යන්න විස්තර කරන ලෙස. එතුමා මේ නිර්දේශ පිළිගන්නවාට මට කිසිම සැකයක් නැහැ. ගුරුවරුන්ගේ නිදහස යටපත් කරන්නේ නැතිව, ඔවුන්ගේ අදහස් උදහස් යටපත් කරන්නේ නැතිව, ඔවුන් සමග මිත්‍රත්වයෙන්, සහයෝගයෙන් කටයුතු කිරීමෙන් තමයි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ වැඩ කොටස ඉදිරියට ගෙන යන්නට පුළුවන් වන්නේ. එසේ නැතිව මේක කරන්නෙ කොහොමද? ගරු ඇමතිතුමා බොහොම හොඳට ප්‍රතිපත්ති හදයි; බොහොම ලක්ෂණ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නට, රට කාර්මික කරන්නට, රටේ කර්මාන්ත සංවර්ධනයට සහ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය පුද්ගලයන් ඇති කරන්නට යෝජනා ඉදිරිපත් කරයි. දෙපාර්තමේන්තුවත් ඒවා කඩදාසිවල ලියා ගුරුවරුන්ට යවයි. අවසානයේදී මේක කරන්නට ඉන්නෙ කව්ද? කාර්ය භාරයට කර දෙන්නට ඉන්නෙ කව්ද? මේක ක්‍රියාත්මක කරන්නේ ඇමතිතුමා නොවෙයි; අධ්‍යක්ෂවරුන් නොවෙයි; අධ්‍යාපන උපදේශකවරුන් නොවෙයි. ගුරුවරයා තමයි, මේක කරන්නට ඉන්නේ. ඒ නිසා ගුරුවරයාගේ සහයෝගය නැතිව, මේක කරන්නට සිටින ප්‍රධාන නැනැත්තාගේ සහයෝගය නැතිව, කොහොමද මේක කරන්නෙ? මේ අදහස හිතේ ඇතිව එතුමාගේ මනෝරථ පූරණය සඳහා ගුරුවරුන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගුරුවරුන්ගේ දේශපාලන නිදහස පිළිබඳ ප්‍රශ්නය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ගුරුවරයාගේ දේශපාලන නිදහස ආරක්ෂා කරන්නෙ නැත්නම්, ගුරුවරයාගේ ශාස්ත්‍රීය නිදහස ආරක්ෂා කරන්නෙ නැත්නම් ගුරුවරයාට ඔහුගේ සේවය හරියාකාර කරන්නට බැහැ. එයයි, අද ලෝකය පිළිගත් ප්‍රතිපත්තිය. ගුරුවරයා ලිපිකරුවකු වගේ, වෙනත් රජයේ සේවකයකු වගේ සලකා ඔහුගේ නිදහස් අදහස් සීමා කිරීමට, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා කිරීමට කටයුතු කිරීම රටේ අධ්‍යාපනයට බලවත් පහරක් ගැසීමක් බවයි, මගේ විශ්වාසය. යම්කිසි ප්‍රශ්නයක් ගැන තමාගේ අදහස් ප්‍රකාශ කරන්නට ගුරුවරයාට අයිතියක් තියෙන්නට ඕනෑ. ඒ අදහස් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ශිෂ්‍යයාට අයිතිය තියෙනවා. ඒ ඩිධියට ගුරුවරයා ඉදිරිපත් කරන කරුණු ගැන බුද්ධිමත්ව විමසන්නට ශිෂ්‍යයන්ට ඉඩ දෙන්නේ නැතිව හොඳ පුරවැසියන් බිහි කිරීමට අපට පුළුවන් වන්නේ නැහැ. එමනිසා ගුරුවරුන්ගේ දේශපාලන නිදහස ගැන විශේෂයෙන්ම සඳහන් කළ යුතුව තිබෙනවා. ලංකාවේ ගුරුවරුන්ගෙන් විශාල සංඛ්‍යාවක් දේශපාලන නිදහස ඇතිව සිටියා. ගුරුවරුන්ට දේශපාලන නිදහස දීම ගැන කථා කරන විට සමහරුන් කියන දෙයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. ගුරුවරුන්ට දේශපාලන නිදහස දුන්නොත් ලංකාවේ පාඨශාලා දේශපාලන පොර පිටි බවට පත්වේය, එමනිසා මේ රටේ අධ්‍යාපනයටත් පහරක් වදීවිය කියා ඒ අය කල්පනා කරනවා. ඇත්ත වශයෙන්ම එහෙම වේනවා නම් අපත් විරුද්ධයි. පාඨශාලා දේශපාලන පොර පිටි බවට පත් වෙන්නට ඉඩ හරින්නට අපට බැහැ. අප ඒක නවත්වන්නට ඕනෑ. නමුත් මේ රටේ උපකෘත පාඨශාලා තිබුණු කාලයේ මේ රටේ ගුරුවරුන් දේශපාලන නිදහස භුක්ති වින්දා. ආනන්ද, නාලන්ද ආදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

උසස් විද්‍යාලවල ගුරුවරුනුත් දේශපාලන නිදහස භුක්ති වින්දා. නමුත් ඒ කිසිම විද්‍යාලයක අවුලක් ඇතිවුණේ නැහැ. ඒවා දේශපාලන පොර පිටි බවට පත්වුණේ නැහැ. ඒවායින් හොඳ අධ්‍යාපනයක් ලැබුණා පමණක් නොවෙයි නිදහස් අදහස් ඇති හොඳ පුරවැසියන් පිරිසකුත් රටට දෙන්නට පුළුවන් වුණා. ඒ ගුරුවරුන්ට සම්පූර්ණ දේශපාලන නිදහස තිබුණා. එම දේශපාලන නිදහස වැරදි විධියට පාවිච්චි කර ළමයින් මුළා කරන්නට හෝ බලෙන් තමන්ගේ දේශපාලන අදහස් ළමයින්ට පොවන්නට හෝ කිසිම ගුරුවරයකු කට යුතු කළේ නැහැ. එවැනි දෙයක් වුණේ නැහැ. එවැනි දෙයක් කරන්නට වුව මනාත් නැහැ. සමහර විට ගුරු මණ්ඩල යක එක් කෙනෙකු දෙදෙනෙකු නැත්නම් කීප දෙනෙකු එවැනි අදහස් තිබෙන අය වෙන්නට පුළුවනි. නමුත් ප්‍රතිපත්තිය හරි නම්, පරමාර්ථය හරි නම් එක් කෙනෙකු දෙදෙනෙකු එය වැරදි විධියට පාවිච්චි කරනවාය කියා ඒ මූලික යුතුකම ඉෂ්ට කිරීමට අප භය විය යුතු නැහැ. ඉන්දියාවේ මහාණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍ය කේ. එල්. ශ්‍රීමලි මහත්මයාගේ පොතකින් මා දැන් කොටසක් කියවන්නට සතුටුයි. ඒ මහත්මයා උගතෙක් ; එම්. ඒ. උපාධි ධාරියෙක්. ඒ මහත්මයා ගුරුවරුන් ගැන මොකක්ද කියන්නෙ ? එතුමා විසින් ලියන ලද "Teachers in the new social order" නම් පොතේ මෙහෙම සඳහන් කර තිබෙනවා :

"The teacher has as much right as any member of society to express his opinion on political and economic questions, to participate, individually or collectively, in public affairs and to influence social policies. These are the elementary rights of a citizen in a democratic society, and society cannot very well deny these fundamental rights to the most enlightened section of the community."

මේක ඉන්දියාවේ අධ්‍යාපන ඇමතිවරයා කර තිබෙන ප්‍රකාශයක්. මේක සිංහලෙන් කියනවා නම් මෙසේයි :

"දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමටද මහජන කටයුතු වලට පෞද්ගලිකව හා සාමූහික වශයෙන් සහභාගි වීමටද සමාජ ප්‍රතිපත්ති කෙරෙහි බලපෑමටද සමාජ යේ අවශේෂ අයට මෙන් ගුරුවරයාටද අයිතියක් ඇත. මේවා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් වන අතර එම මූලික අයිතිවාසි කම් ජාතියේ ඉතාම බුද්ධිමත් කොටසකට නොදී ප්‍රතික්ෂේප කිරීම සමාජයට කළ නොහැකි කාර්යයකි."

ඉන්දියාවේ අධ්‍යාපන ඇමතිවරයා කර තිබෙන මේ ප්‍රකාශය හරි. අපේ අධ්‍යාපන ඇමතිවරයාගේ ප්‍රකාශයත් මෙයම විය යුතුයි. සමහර විට එතුමා හොඳ අදහස් ප්‍රකාශ කරනවා. ගුරුවරුන් වෙනුවෙන් මේ අදහසත් ප්‍රකාශ කරන මෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගුරුවරුන්ට මේ මූලික අයිතිවාසිකම දීම ප්‍රතික්ෂේප කරන්නට එතුමාට පුළුවන්කමක් නැහැ. ඒ අනුව ගුරුවරයාට දේශපාලන නිදහස තිබෙන්නට ඕනෑ. ගුරුවරුන් ගැන තවත් නොයෙකුත් වැදගත් කරුණු මේ පොතේ තිබෙනවා :

"The struggle between the haves and the have-nots in our society is going to be a long one. Teachers cannot be neutral in this struggle but they must act with a sense of responsibility and at no stage lose the sympathy of the people whom they serve."

ඒක සිංහලෙන් කියැවෙන්නෙ මෙහෙමයි :

"සමාජයේ ඇත්තන් හා නැත්තන් අතර පවත්නා අරගලය දීර්ඝ එකකි. මෙම අරගලයේදී මධ්‍යස්ථව සිටීම ගුරුවරුන්ට කළ නොහැකි දෙයකි. එහෙත් වගකීමෙන් යුක්තවද කවර අවස්ථාවකදී වත් තමන්ගේ සේවය ලබන ජනතාවගේ අනු කූලතාවය නැති නොවන අයුරින්ද ඔව්හු ක්‍රියා කළ යුත්තෝය."

තවත් බොහෝ දේවල් මේ පොතේ තිබෙනවා. ගුරුවරයාගේ දේශපාලන නිද හස ආරක්ෂා කිරීමේත්, ගුරුවරයාට සිය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස දීමේත් වැද ගත්කම පැහැදිලි කර ලියන ලද ලොකු පොතක් තමයි මා ළඟ තිබෙන්නේ. මෙහි තිබෙන්නේ ඉන්දියාවේ අධ්‍යාපන ඇමති තුමාගේ අදහස්. ලෝකයේ වෙන රට වලත් මේ අදහස් තිබෙනවා පමණක් නොව, සමහර රටවල ඒවා ක්‍රියාත්මක වෙලාත් තිබෙනවා. ධනවාදී බොහෝ රට වලත් ගුරුවරයාට දේශපාලන නිදහස තිබෙන බව ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුරුවරයාට සිය අදහස් බියෙන් තොරව ප්‍රකාශ කරන්නට ඉඩක් නැත්නම් ඇති වන තත්ත්වය කුමක්ද? ප්‍රජාචාරය හෝ එවැනි වෙනත් විෂයයක් යටතේ ශිෂ්‍යයන්ට පාඩමක් උගන්වන්නට ගිය ගුරුවරයාට මොකක් හරි දෙයක් කිය වුණොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් පසුව දාට වැරදි ලෙස කියවුණු දෙය නිසා ඊට සමාවට කියන්නට දෙයක් වෙතොත් සුමානයකින් ලියා එවන්නැයි චෝදනා පත්‍රයක් ලැබිය හැකියයි බියක් තිබෙනවා නම් නිදහසේ උගන්වන්නේ කොහොමද? එවැනි තත්ත්වයක් යටතේ වැඩ කරන්නට සිදු වන ගුරුවරයා තමන්ගේ පංක්තියේ ශිෂ්‍යයන්ට ප්‍රජාචාරය පිළිබඳ පාඩමක් බියෙන් තොරව උගන්වන්නට පුළුවන්කමක් ඇති කෙනෙක්ද? භූගෝල විද්‍යාව, කෘෂිකර්මය, රටේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම, සමාජ සේවා කටයුතු, යන මේ කවර විෂයයක් යටතේ වුවත් පාඩම් උගන්වන්නට ගුරුවරයාට සිදු වෙනවා. කාත් කවුරුත් නැති අහිංසක දුප්පත් ගැමියෙකුට මාසයකට රුපියල් පහක පින්පඩියක් ලැබෙනවා නම්, එය ජීවන තත්ත්වය අනුව කොහෙත්ම ප්‍රමාණවත් නැති බව තමන්ගේ දේශනයේදී සඳහන් කරන්නට සමහර විට ගුරුවරයාට සිදු විය හැකියි. ආණ්ඩුවේ බංකොලොත් භාවය නිසා හෝ, භාණ්ඩාගාරයේ සෑහෙන තරම් මුදල් නැති නිසා හෝ, අවශ්‍ය දේවලට මුදල් සොයා ගන්නට ආණ්ඩුවට නොහැකි වූ නිසා හෝ, ඒ තරම් සුළු පින්පඩියක් එවැනි අහිංසකයකුට ගෙවන්නට සිදු වූ බවත් සමහර විට සඳහන් කරන්නට ගුරුවරයාට සිදු විය හැකියි. බියෙන් තොරව එවැන්නක් කියා දෙන්නට ගුරුවරයාට ඉඩක් සලසා දී නැත්නම් ප්‍රශ්නයේ නියම තත්ත්වය පැහැදිලි කරන්නට ඔහුට බැහැ. කිය යුතු දේ කිව්වොත්, ආණ්ඩුව විවේචනයට භාජන කළායයි ගුරුවරයාට දඬුවම් කරන්නට පුළුවනි. එහෙත් එසේ දඬුවම් කිරීම වරදක් බවයි මා කියන්නේ. දේශපාලනයෙහි නිරත වීමක් හැටියට එය භාර නොගත යුතුයි.

නිදහස් අදහස් ප්‍රකාශ කරන්නට ගුරුවරයාට අවස්ථාව දෙන්නට ඕනෑ. එහෙම දුන්නොත් තමයි හොඳ, එඩිතර, බුද්ධිමත් පුරවැසියන් බිහි කරන්නට පුළුවන් වන්නේ. තර්කානුකූලව කල්පනා කරන්නටත්, හිතට එකඟව යමක් භාර ගන්නටත් පුළුවන් පුරවැසියන් පාසලින් පිට කරන්නට ගුරුවරුන්ට පුළුවන් වන්නේ ගුරුවරුන්ට නිදහසේ සිය ඉගැන්වීමේ කාර්යය කරගෙන යෑමට තිබුණොත් පමණයි. ලිපිකරුවන් සහ කිසිම පණක් නොමැති යතුරු ලියනයන් හසුරුවන්නන් වැන්නන් රටට බිහි කිරීම නොවෙයි ගුරුවරයාගේ සේවයෙන් බලාපොරොත්තු වන ඉලක්කය. යතුරු ලියනයක් හසුරුවනවා වාගේ වැඩක් නොවෙයි ගුරුවරයාට භාර දී තිබෙන්නේ. පණ තිබෙන පිරිසක් සමගයි ගුරුවරයා වැඩ කරන්නේ. අනාගත සමාජයේ වගකීම් භාර ගන්න ඉන්න දරුවන් ළඟයි ගුරුවරයා ඉන්නේ. ඒ ළමයින් රටට ජාතියට ලොවට ප්‍රයෝජනවත් පුරවැසියන් හැටියට සකස් කිරීමයි, හැඩගැස්සීමයි, ගුරුවරයා සතු වැදගත් වගකීම. ඒ නිසා සමාජ ප්‍රශ්නවලදී ඇහැ පියාගෙන ඉන්නට පුළුවන් තත්ත්වයක් ඇති කෙනෙක් නොවෙයි ගුරුවරයා. යම් ප්‍රශ්නයක නියම ස්වරූපය හැදෙන වැඩෙන දරුවන්ට කියා දෙන්නට ගුරුවරයාට සිදු වෙනවා. යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මනා විග්‍රහයක් කරන්නටත් ගුරුවරයාට සිද්ධ වෙනවා. දේශපාලන නිදහසක් නැත්නම්, තමන් දන්න විද්‍යාත්මක තොරතුරු බියෙන් තොරව ප්‍රකාශ කරන්නට අයිතියක් නැත්නම්, ගුරුවරයාට නියම විධියට ප්‍රශ්නයක් විස්තර කරන්නට බැහැ. ඒ නිසා මොන ආණ්ඩුවක් බලයට ආවත් ගුරුවරයාට ලැබිය යුතු නිදහස ගුරුවරයාට ලැබිය යුතුයි. එක්සත් ජාතික පක්ෂය බලයේ සිටියත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයේ සිටියත්, කොයි ආණ්ඩුව බලයේ සිටියත්, කවර පිරිසක් විරුද්ධ පාර්ශ්වයේ සිටියත් ගුරුවරයාට තමන් භාරයේ තිබෙන අධ්‍යාපන කටයුතු කරගෙන යෑමේදී නිදහසේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව දෙන්නට ඕනෑ. එය අවශ්‍ය වන්නේ පුද්ගලයකු වශයෙන් ගුරුවරයාගේ අංශයෙන් බැලීමෙන් නොවෙයි. ළමයාගේ අංශයෙන් බලා, ළමයාගේ අධ්‍යාපනය ගැන බලා, අනාගත පරම්පරාවේ හැඩගැස්ම ගැන සලකා බලා, කළ යුතු දෙයක් හැටියටයි මා එය විස්තර කරන්නේ. මා එසේ කියන්නේ මන්ද?

4——එච 17463 (68/9)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ළමයා හොඳ බුද්ධිමත් පුද්ගලයකු හැටියට පාසලෙන් පිට කරන්න නම් ගුරුවරයාගේ බැඳ තිබෙන අත්පා විලංගු සම්පූර්ණයෙන් නිදහස් කරන්නට ඕනෑය යන මතය මා තරයේම පිළිගන්නවා. නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේත්, ඇති කිරීමේත් නිදහස ගුරුවරයාට දෙන්නට ඕනෑ. ඒ අයිතිය ගුරුවරයා සතු දෙයක්. ඒ වැදගත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් තමයි අපේ අනාගත සමාජය නියම පුරවැසියන්ගෙන් යුත් සමාජයක් හැටියට සකස් කරන්නට පුළුවන් වන්නේ.

තවත් කරුණු දෙකක් ගැන පමණක් කියා මගේ කථාව අවසන් කරන්නටයි මා බලාපොරොත්තු වන්නේ. මේ රටේ ජාතික අධ්‍යාපනය සඳහා ක්‍රමයක් ඇති කිරීමේ මුල් පියවර බණ්ඩාරනායක ආණ්ඩුවෙන් තැබුවායයි මා මීට කලින් කිව්වා. එය මා දැන් සඳහන් කරන්නට යන පළමුවැන්නයි. එවකට අධ්‍යාපන ඇමති ධුරයේ සිටි ගරු බදිඋද්දීන් මහ්මූද් මැතිතුමා මේ රටේ අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසයේ ඉතාමත් වැදගත් විප්ලවයක් කර පාසල් රජයට අරන් ඒ මුල් පියවර තැබූ බවයි මා කියන්නේ. එහෙත් ඒ පියවර සර්ව සම්පූර්ණ පියවරක් බවට පරිවර්තනය කිරීමේ වගකීම දැන් තිබෙන්නේ අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාටයි. තවමත් පෞද්ගලික පාසල් හැටියට පාඨශාලා රාශියක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. එමෙන්ම වතු පාඨශාලාත් තිබෙනවා. මේ වතු පාඨශාලා හා පෞද්ගලික පාඨශාලා සියල්ලම රජයට ගන්නට ඕනෑ. එය කරන තුරු මේ රටේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කරනවාය කියන එක ගැන අපට විශ්වාසයක් තබන්නට බැහැ. අද මේ පෞද්ගලික පාඨශාලාවල සිටින ගුරුවරුන්ට විශාල අසහනයක් තිබෙනවා. ඔවුන්ට සෑහෙන පඩිනඩි ලැබෙන්නේ නැහැ. අඩු පඩියට වැඩ කරන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. එමෙන්ම දෙමව්පියන් මිරිකා මුදල් අය කර කළුකඩ ජාවාරමක් කරන්නට පුද්ගලයින් පිරිසකට ඉඩ දී තිබෙනවා. ගරු ඇමතිතුමාගේ පරමාර්ථය මේ රටේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම නම්, එය ඉටුකර ගැනීමට බලාපොරොත්තු වෙනවා නම්, මේ පාඨශාලා විකත් රජයට ගන්න. පෞද්ගලික පාඨශාලා අයිතිකාරයින්—ඒ සමාගම්—ඒවා රජයට බාරදෙන්නට දැන් ලෑහැස්ති වී සිටිනවා. එවැනි ඉඟියක් පුවත්පත් මගින් අපට ලැබී තිබෙනවා. ඒ නිසා හැකි ඉක්මණින් ඒ පාඨශාලා රජයට ගන්න. අන් සියල්ලටම කලින් කළ යුතු මූලික කටයුත්ත එයයි. එය ඉටු නොකර අනික් කටයුතු කිරීමේ තේරුමක් නැහැ.

ඊළඟට පාඨශාලා ප්‍රතිසංවිධානය ගැනත් මතක් කරන්නට ඕනෑ. යම් යම් අඩුපාඩුකම් තිබුණත් පාඨශාලා ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා අනුගමනය කරන අදහස් අනුව එය වැදගත් වැඩක් හැටියට මා පිළිගන්නවා. පාඨශාලා ප්‍රතිසංවිධානයේදී මාතර නගරයේ පාඨශාලා ගණනාවක්ම මහා විද්‍යාල බවට පත් වූ බව මා දන්නවා. වෙලේගොඩ කණිෂ්ඨ විද්‍යාලය මහා විද්‍යාලයක් වුණා. එමෙන්ම කඹුරන, මොටාගෙදර ආදී විද්‍යාලත් මහා විද්‍යාල බවට පත් වුණා. ගොඩගම විද්‍යාලයත් මහා විද්‍යාලයක් කරන්න ඔන්න මෙන්න කියා තිබෙනවා. ඒ අනුව මහා විද්‍යාල ගණනාවක් ඇති වී තිබෙනවා. එහෙත් ගම්බද ප්‍රදේශවල මහා විද්‍යාල ඇති කිරීමේදි ශිෂ්‍යයන්ගේ පහසුකම් ගැනත් සලකා බලන්නට ඕනෑ. ගම්බද සමහර ප්‍රදේශවල මහා විද්‍යාල ඇති කරන විට ඇතැම් ළමයින්ට හැතැප්ම හතක් අටක් ඈත විද්‍යාලයකට යන්නට සිදු වෙනවා. ඒ නිසා ඒ ගැනත් කල්පනා කර, දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් නොවන විධියට, ගමනාගමන අපහසුකම අධ්‍යාපනයට බාධාවක් නොවන විධියට, උසස් අධ්‍යාපනයක් ලබාගැනීමට ආසාවක්, කැමැත්තක්, උනන්දුවක් ඇති ගම්බද දුප්පත් දරුවන්ට ත් අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවන අන්දමට ගම්බද ප්‍රදේශ සම්බන්ධයෙන් පාසල් ප්‍රතිසංවිධානයේ විශේෂත්වයක් ඇති කර ක්‍රියා කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

කිසිම රජයකට හැම තැනම මහා විද්‍යාල ඇති කරන්නට පුළුවන්කමක් නැහැ. එමෙන්ම හැම මහා විද්‍යාලයකම රසායනාගාර පහසුකම් ඇති කිරීමත් බොහොම අමාරුයි. අපේ අධ්‍යාපන ප්‍රතිපත්තියත් තවම නියම අන්දමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සකස් වී නැහැ. යම් යම් නගරවල ඇති මහා විද්‍යාලවලින් හා ඒවායේ ඇති රසායනාගාරවලින් ගතහැකි උපරිම ප්‍රයෝජනය රටටත් ළමයින්ටත් ලබාගත හැකි අන්දමේ වැඩ පිළිවෙළක් තවමත් සකස් වී නැති බව ඉතා කණගාටුවෙන් කියන්නට ඕනෑ. උදාහරණයක් වශයෙන් මාතර රාහුල මහා විද්‍යාලය ගැන කියන්නම්. එය ගොඩනැගිලි රසායනාගාර ආදිය තිබෙන අංග සම්පූර්ණ මහා විද්‍යාලයක්. එහෙත් එහි තිබෙන රසායනාගාරවලින් ඒ අවට ළමයින්ට නියම ප්‍රයෝජනයක් ලබා ගන්නට තවම අවස්ථාවක් සැලසී නැහැ. එදා තිබුණු තත්ත්වයෙන්මයි, තවමත් තිබෙන්නේ. ඒ අවට මහා විද්‍යාල කීපයක්ම තිබුණත් ඒවායේ ළමයින්ට රාහුල මහා විද්‍යාලයට පැමිණ එහි තිබෙන රසායනාගාර පහසුකම් ලබා ගන්නට පුළුවක්කමක් නැහැ. ඊට හේතුව, රාහුල මහා විද්‍යාලයෙහි 1 වන ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වීමයි. මෙවැනි තත්ත්වයක් රාහුල මහා විද්‍යාලයෙහි තබා ගැනීමේ ඕනෑකම කුමක්ද? 1 වන ශ්‍රේණියේ සිට 7 වන ශ්‍රේණිය දක්වා වූ පන්තිවල ළමයින් අවට තිබෙන ඉස්කෝලවලට යවා, එම ඉස්කෝලවල 8 වන ශ්‍රේණියේ සිට ඉහළට ඇති පන්තිවල ළමයින් රාහුල විද්‍යාලයට ඇතුළත් කොට ඒ ළමයින්ට මෙම විද්‍යාලයෙහි ඇති රසායනාගාර ආදී වූ පහසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඒවායින් ගත හැකි සම්පූර්ණ ප්‍රයෝජනයත් විද්‍යා ගුරුවරුන්ගෙන් ගත හැකි නියම ප්‍රයෝජනයත් ලබාගැනීමට කටයුතු සංවිධානය නොකරන්නේ ඇයි? එදා තිබුණු තත්ත්වයෙන්ම අදත්, රාහුල මහා විද්‍යාලයෙහිම 1 වන ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිවලට යන්නට—අතළොස්සකට පමණයි කියන්නට බැහැ—එක්තරා සීමිත ප්‍රමාණයකට පමණක් අවස්ථාව සලසා තිබෙනවා. අනෙක් උදවියට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. රාහුල මහා විද්‍යාලය අවට මහා විද්‍යාල ගණනාවක් තිබෙනවා. ඒවාට රසායනාගාර ලබා දෙන්නට බැරි නම්, ඒවායේ ළමයින්ට රාහුල විද්‍යාලයේ ඇති රසායනාගාර පහසුකම් ලබා ගැනීමට ඉඩකඩ සලසා නොදෙන්නේ ඇයි? එවැනි තත්ත්වයක් ඇති කළහොත්, අවට මහා විද්‍යාලවල 8 වන ශ්‍රේණියෙන් ඉහළ පන්තිවල ළමයින්ගෙන් රාහුල විද්‍යාලය සම්පූර්ණයෙන්ම පිරී යන තත්ත්වයක් ඇති වෙනවා. ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් හා රසායනාගාර පහසුකම්ද ලබා ගැනීමට ඉඩ ලැබෙනවා. මේ ප්‍රශ්නය ගැන කල්පනා කොට, මාතර පමණක් නොව රසායනාගාර තිබෙන සියලුම තැන්වල එවැනි තත්ත්වයක් ඇති කරන ලෙස මා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ රටේ දරුවන්ට කාර්මික අධ්‍යාපනයක් ලබා දීමට දැන් ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. එහෙත් ඊට අවශ්‍ය දේ තවමත් ක්‍රියාත්මක වන්නේ ඉතා හෙමින්. මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක දෙකේ කාර්මික විද්‍යාල ඇති කිරීමේ යෝජනාවක් ගරු ඇමතිතුමා ළඟ තිබෙනවා. ඊට අවශ්‍ය ඉඩම පරීක්ෂා කොට එය ලබාගෙනත් තිබෙනවා. එහෙත් එහි ගොඩනැගිලි හැදීමට තව අවුරුද්දක් පමණ කල් ගත වෙනවා ඇති. එකී දිස්ත්‍රික්ක දෙකේ ළමයින්ගේ කාර්මික අධ්‍යාපනය දියුණු කිරීම සඳහා හැකි පමණ ඉක්මණින් එම කාර්මික විද්‍යාල පිහිටුවීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

අධ්‍යාපන සියවස් උළෙල සඳහා මුදල් සපයා ගැනීමට දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන යෝජනා ගැන නම් සතුට ප්‍රකාශ කරන්නට අමාරුයි. ඒ සඳහා සකස් කර තිබෙන්නේ අධ්‍යාපන ලොතරැයියක් වැනි දෙයක්. එහි ටිකට්පත් විකිණීමේ කාර්යය ගුරුවරුන්ට පවරා තිබෙනවා. ටිකට්පත් විකිණීම බාර නොගන්නා ගුරුවරුන්ගේ නාම ලේඛනයක් සකස් කරන ලෙස යම් යම් නිලධාරීන්ට නියම කර තිබෙන බවත් මට ආරංචියි. මෙය ඇත්තක්ද නැත්තක්දැයි මා දන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා නම් හිනා වෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

හැබෑම ආරංචියේ තමුන්නාන්සේ අර ගෙන එන්නේ !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඒක සිද්ධ වෙන්න පුළුවන් දෙයක්. තමුන්නාන්සේගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට ගුරුවරුන් කොපමණ කැමති වුණත්, අද රටේ පවතින ආර්ථික අමාරුකම් ගැන කල්පනා කරන විට, මේ අධ්‍යාපන සියවස් උත්සවයේ ටිකට් පතක් මිළ දී ගන්නා ලෙස ඔවුන් කොහොමද දෙවියනේ තවත් කෙනෙකුට කියන්නේ? එක ගුරුවරයකු රුපියල් 50 බැගින් ටිකට් විකුණන්නන්ට ඕනෑ යයි, දැන් ඒ ඒ පළාත්වල අධ්‍යාපන අධ්‍යක්ෂවරු ගුරුවරුන්ට කියාගෙන යනවා. අපට ලැබී තිබෙන ඒ ආරංචිය ඇත්තක්ද නැත්තක්ද කියා අධ්‍යාපන ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. අධ්‍යාපන ඇමතිතුමා නිශ්ශබ්දයි. එයින් තේරෙන්නේ ඒ ආරංචිය ඇත්තක් බවයි.

අද ගුරුවරුන් වැටී සිටින තත්ත්වය දිහා බැලුවාම, ලැබෙන සුළු වැටුප පවා වියදම් කළ යුතු ආකාරය තීරණය කිරීමේ නිදහසක් ඔවුන්ට නැති බව පෙනෙනවා. මෙපමණ ටිකට් ගන්නට ඕනෑ, අර ක්‍රීඩා උත්සවයට මෙපමණ දෙන්න ඕනෑ, යනුවෙන් නියෝග කරමින්, ගුරුවරුන් සිය වැටුප වියදම් කළ යුතු ආකාරය තීරණය කරන්නේත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවයි. ඇයි දෙයියනේ, වෙන කිසිම දෙපාර්තමේන්තුවක නැති නීති රීති හා විධිවිධාන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විතරක්? ගුරුවරුන්ට ලැබෙන්නේ ඉතාම සුළු වැටුපක්. ලැබෙන ඒ සුළු වැටුප පවා සිය පවුල්වල කටයුතු හා පෞද්ගලික කටයුතු සඳහා යොදවන්න බැහැ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගෙනයන වැඩ පිළිවෙළ නිසා.

මේ සියවස ලොතරැයිය ලොතරැයි මණ්ඩලයට භාර දෙන්න බැරිදැයි මා අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට විතරක් විශේෂයක් ඇයි? ගුරුවරුන් මාර්ගයෙන් මුදල් එකතු කරන්න නියෝග කර තිබෙන්නේ ඇයි? සාමාන්‍යයෙන් පවත්වන එක ලොතරැයියක් නවත්වා, ඒ වෙනුවට මේ ලොතරැයිය කරන ලෙස ලොතරැයි මණ්ඩලයෙන් ඉල්ලන්න බැරිද? ලොතරැයි මණ්ඩලයේ සංවිධානය යටතේ ටිකට් විකුණන විට, ගුරුවරුන් හෝ වේවා, ශිෂ්‍යයන් හෝ වේවා, අන් කවුරුන් හෝ වේවා ආධාර කළාදෙන්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඒ ආධාර කරන්න ඉන්නේ ශිෂ්‍යයන්ගේ දෙමාපියන්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඔවුන් කැමති නම් ටිකට් ගනීවි. නැත්නම් නිකම් ඉඳීවි. ඒ විධියට මේ ලොතරැයියත් ලොතරැයි මණ්ඩලයට භාර දී එමඟින් ක්‍රියාත්මක කරවන්න බැරිද? අධ්‍යාපනය ඒ තරම් වැදගත් කටයුත්තක් හැටියට මේ රජය සලකන්නේ නැද්ද? රෝහල් හදන්න ලොතරැයි පවත්වන්නේ ලොතරැයි මණ්ඩලයෙන් නම්, මේ ලොතරැයියත් ලොතරැයි මණ්ඩලයෙන් කළාම නරකද? සෞඛ්‍යය නගා සිටුවීම අත්‍යවශ්‍ය දෙයක් නමුත්, අධ්‍යාපනය ලබා දීම ඊට වඩා වැදගත් නැද්ද? හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා වැඩි වැඩියෙන් පාසල් පහසුකම් ඇති කරන්න රජයට මුදල් නැත්නම්, මේ සූදුව මාර්ගයෙන්වත් ඒ මුදල් සපයා ගැනීමේ වරදක් නැහැනේ? මේ රජය දැන් මුදල් ලබා ගන්නේ සත 50 බැගින් හූරාගෙන නොවැ? රෝහල් හැදීම වැනි කටයුතු සඳහා, බදු මුදල් හැරුණාම මේ ලොතරැයි සූදු මඟින් අයථා ක්‍රමයටත් රජය මුදල් එකතු කර ගන්නවා නේද? එහෙම නම් අධ්‍යාපන සඳහා එසේ කිරීම නරකද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කවුද පටන් ගත්තේ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

කවුරු පටන් ගත්තත් තමුන්නාන්සේලා එය ක්‍රියාත්මක කරන්නේ ඇයි?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මා දන්නේ නැහැ. නරක නම් තමුන්නාන්සේලා එය නවත්වන්නේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලා ආවේ, දස රාජ්ධර්මයෙන් රාජ්‍ය පාලනය කරන්නට නොවැ? එවැනි උදවියවත් මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. එම නිසා, මෙපමණ ටිකට් ගත යුතු යයි කිසිම ගුරුවරයකුට බල නොකරන ලෙස ලංකාවේ සියලුම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට නියෝග කරන හැටියට අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ සමඟම, මේ සියවස ලොතරැයිය, ලොතරැයි මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන හැටියටත් ඉල්ලා සිටිනවා.

මා එහෙම කියන්නේ මේ නිසයි: මේ ටිකට් පත් නොගත්තොත්, අධ්‍යාපන අධ්‍යක්ෂ අර ගුරුවරයා සමග අමනාප වෙනවා. එම නිසා, ඔහු මේ ටිකට් ගන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂ සතුටු කරන්නටයි. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා මේවා විකුණන්නට මහන්සි ගන්නේත්, සේවයක් හැටියට නොව අධ්‍යාපන ඇමතිතුමා සතුටු කිරීම පිණිසයි. ඒ අනුව බලනවිට, ඒ දෙදෙනාගේම අදහස සේවයක් කිරීම නොව තව කෙනෙකුගේ හිත සතුටු කිරීමයි. ඇමතිතුමා නම් මේවා කරන්නේ සේවයක් හැටියට වෙන්න පුළුවනි. එහෙත් මේ අන්ද මට අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඇමතිතුමා සතුටු කරන්නටත්, ගුරුවරු අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සතුටු කරන්නටත් ගියාම, අන්තිමටම අමාරුවේ වැටෙන්නේ දුප්පත් දෙමාපියනුයි. දුප්පත් දෙමව්පියන් කොහොම හරි මුදල් දෙන්නට ඕනෑ. එසේ නැත්නම් ගුරුවරුන් අමනාප වී තමන්ගේ දරුවන්ට වෙනස්කම් කරතැයි ඔවුන් තුළ භයක් තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ නියමය ක්‍රියාත්මක කරන්නට ගුරුවරුන්ට සිදු වෙනවා. එසේ නැත්නම් අධ්‍යාපන අධ්‍යක්ෂතමාගෙන් තමන්ට වෙනස්කම් සිදු වෙතැයි ඔවුන් සිතනවා. ඇත්තෙන්ම මේක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්; අශෝභන තත්ත්වයක්. ඒ නිසා ටිකට් පත් ගන්නැයි කිසිම ගුරුවරයකුට නියම නොකරන ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට නියෝග කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා මීට වඩා කථා කරන්නේ නැහැ. නැවතත් මා ඉල්ලන්නේ මේකයි. දැනට පවතින පෞද්ගලික පාඨශාලා ටිකත් රජයට පවරාගෙන, ඒ වාගේම ගුරුවරුන්ගේ හොඳ හිත දිනා ඔවුන්ගේ සහයෝගය ලබාගෙන, ක්‍රමවත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා නම් ඒ සඳහා අප සෑම සහයෝගයක්ම දෙන්නට ලෑස්තියි. පාසල් රජයට ගැනීමේ කටයුත්ත සඳහා විරුද්ධ පාර්ශවයේ සහයෝගය දී තිබෙනවා. නියම විධියට කටයුතු කරන්නට ලෑස්ති වෙතොත් ඉදිරියට විරුද්ධ පාර්ශවයේ සහයෝගය නොඅඩුව ලැබෙනවා ඇති.

අ. භා. 5.07

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ නමින් ඉදිරිපත් වුණු යෝජනාවක් සම්බන්ධයෙන් අප කතාබහ කරන්නට නැගිටින්නේ ටිකක් අදිමදි කරමිනුයි. විවාදය ටිකක් දුර යන විට, පාර්ලිමේන්තුවේ සිදු වන විවාදයක් බව අමතක කර ඇමතිතුමාගේ පෑත්තෙන් මුද්‍රණය කරන්නට බැරි කියමන් නිකුත් වන්නට පටන් ගන්නවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ප්‍රශ්න ගැන විවාද කරන්නට අප නැගිටින්නේ ටිකක් කනස්සල්ලෙනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ මාතර ගරු මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවේ මයා.) පසුගිය ශත වර්ෂයේ ජාතික අධ්‍යාපන කටයුතු විෂයයෙහි ඉතිහාසගත වී සිටින පුද්ගලයන් දෙතුන් දෙනකුගේ නම් සඳහන් කළා. නිදහස් අධ්‍යාපනයේ පීතෘවරයා වශයෙන් හඳුන්වන සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාත්, මේ රටේ තිබුණු පෞද්ගලික පාඨශාලා රජය සතු කිරීම සඳහා පනතක් ඉදිරිපත් කළ බද්උද්දීන් මහ්මූද්, යනාදී විශයෙන් ඉතිහාසගත වන නම් කීපයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

ඒ ගුරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. ඉහත කී නම් දෙකට වඩා ඉහළින් ඊරියගොල්ල මහතාගේ නම මේ රටේ අධ්‍යාපන ඉතිහාසයෙහි සඳහන් වෙනවා ඇති. නොමැකිය හැකි අයුරින් ඒ නම සඳහන් වෙනවා ඇති.

එයට හේතු කීපයක් තිබෙනවා. අවුරුදු 100 ක් තිස්සේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ රටේ තිබුණත්, ඒ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පාලනය කළ ගුරු ඇමතිවරුන් හිටියත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පාලනය වන ගුරුවරුන් විෂයෙහි අපේ වර්තමාන ගරු ඇමතිතුමා තරම් සානුකම්පිකව ක්‍රියා කළ වෙන කිසිදු ඇමතිවරයකු මේ රටේ අධ්‍යාපන ඉතිහාසයේ කවරදාකවත් හිටියේ නැහැ. ඒ බව ගමේ ගොඩේ ඕනෑම ඉස්කෝලෙකට ගිහින් ඕනෑම ඉස්කෝලෙ මහත්මයෙකුගෙන් ඇහුවොත් කියනවා ඇති. මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු, පසුගිය ආණ්ඩුව කරපු වැරදි හරි ගැස්සීම සඳහා එඩිතරව ඉදිරිපත් වෙලා පළමුවෙන්ම ක්‍රියා කරන්ට පටන් ගත් ඇමතිවරයා තමයි, අධ්‍යාපන ඇමතිතුමා. පසුගිය අවුරුදු 3½ ඇතුළතදී අනුගමනය කළ ඒ එඩිතර ක්‍රියාමාර්ගයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ රටේ 150 කට ආසන්න ගුරුවරුන් සංඛ්‍යාවක් අද රක්ෂා නැතිව අහිංසකව අසරණව අනාථව සිටිනවා. 1,10,000 ක් පමණ වූ ගුරු සංහතියෙන් පසුගිය ශත වර්ෂය තුළ සිදු වූ අධ්‍යාපන සිද්ධීන් පිළිබඳව විමසා බැලුවොත්, ඔවුන් ඒකමතිකව දෙන පිළිතුර තමයි, පසුගිය අවුරුදු 3½ ඇතුළතදී මේ රටේ ගුරුවරුන් පස්සේ එළව එළවා මේ විධියේ සහනයක් සැලසූ තවත් ඇමතිවරයෙක් ලංකාවේ හිටියේ නැහැ කියන කාරණය.

අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා ඉතිහාස ගත වෙන්නේ ඒ නිසා පමණක් නොවෙයි. මීට ඉස්සරවෙලා හිටපු ඇමතිවරුන් විසින් අළුතෙන් විශ්ව විද්‍යාල පටන් ගත්ත. මොන අධ්‍යාපන ඇමතිවරයා යටතේද පටන් ගත් විශ්ව විද්‍යාල වසා දැම්මේ? ලංකාවේ විශ්ව විද්‍යාල 4 න් 3 කට බලධාරීන් පත් කර ශිෂ්‍යයන්ට ඒවාට ඇතුළු වන්නට ඉඩ නොදී තහනම් කර වසා දැමූ යුගයක් තිබුණේ මොන අධ්‍යාපන ඇමතිවරයාගේ කාලයේද? යුගයක් ඉතිහාස ගත වන්නේ ඒ යුගයේ සිදුවන ඉන් පෙර සිදු නොවූ විරු විශේෂ වැදගත් සිද්ධීන් නිසයි. මීට පෙර විශ්ව විද්‍යාල එකක් පැවති කාලයේ එය වහන්නට පුළුවන් ඇමතිවරයකු ලංකාවේ හිටියේ නැහැ. ඊට පසුව අද විරුද්ධ පාර්ශ්වයේ සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩු කරන සමයේ විශ්ව විද්‍යාල 3ක් ආරම්භ කළා. එවා එකක්වත් වසා දමන්නට පුළුවන් ඇමතිවරයෙක් ඒ උදවියට හිටියේ නැහැ. එහෙත් මේ ආණ්ඩුවේ දක්ෂකම අනුව තෝරාගත් අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ලවා විශ්ව විද්‍යාල 4න් 3 ක් වසා දැම්ම. මීට ඉස්සර තිබුණු මොන ආණ්ඩුව යටතේද, මීට ඉස්සර සිටි මොන ඇමතිවරයා යටතේද, මේ රටේ විශ්ව විද්‍යාලවල සිසුන්ගේ ඔළු පළා ඔවුන් ඉස්පිරිතාලවලට යැව්වේ? එය ඉතිහාස ගත විය යුතු සිද්ධියක් නොවේද? ඉතිහාසගත විය යුතු දේවල් එකින් එක මතක් කරන්නට ඕන. මොන අධ්‍යාපන ඇමතිවරයකු යටතේද විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන් හා විශ්ව විද්‍යාලයේ අනිකුත් පාලක මණ්ඩලය මතක් වන හැම මොහොතේම මේ වගේ කටුක බැණුම්වලට ගොදුරු වුණේ? අනික් මොන අධ්‍යාපන ඇමතිවරයකු යටතේද උපාධිධාරීන් මෙතරම් විශාල සංඛ්‍යාවකට රක්ෂාව නැතිව මහ මඟට බසින්නට සිදු වුණේ? වෙන මොන අධ්‍යාපන ඇමතිවරයකු යටතේද අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූල රාජකාරි කටයුතු පරාජිත යූ.එන්.පී. අපේක්ෂකයන් තැරුව්කාරයින් හැටියට යොදා කරවා ගත්තේ?

පාර්ලිමේන්තු ක්‍රමයේ අළුත් පරිච්ඡෙදයක් ආරම්භ කිරීමේ ගෞරවය තවත් අතකින් එතුමාට හිමි වන්නේ කෙසේද? පාර්ලිමේන්තුවට පත් වී එන මන්ත්‍රීවරුන් නොව සෑහෙන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත නොහැකිවීම නිසා පාර්ලිමේන්තුවට පත් විය නොහැකිව පරාජයට පත් වූ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන් අධ්‍යාපන දෙපාර්තමේනතුවේ තැරුව්කාරයන් හැටියට තබාගෙන කෙළින්ම ඔවුන්ට දෙපාර්තමේන්තුව මඟින් ලියුම්කියුම් යවමින් ඔවුන් මාර්ගයෙන් වැඩ කරන යුගයක් මින් පෙර කවදාවත් තිබුණාද? පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව එබඳු අළුත් දර්ශනයක් බිහිකොට පරාජයට පත් වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

අපේක්ෂකයන්ට නිල ලත් ස්ථාන ලබා දීමේ ගෞරවයත් අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට ලැබෙන්නට ඕනෑ. එපමණක් නොවෙයි. මින් පෙර සිටි අධ්‍යාපන ඇමතිවරු නොයෙකුත් අන්දමේ හොඳ දේවල් කළා. ඒවාගේම නොයෙකුත් අන්දමේ නරක දේවල් කළා. එම නිසා ඒ උදවිය පාර්ලිමේන්තුවේදීත් පාඨශාලාවලදීත් විශ්ව විද්‍යාලවලදීත් විවේචනය වුණා. එහෙත් ඒ කුමන ඇමතිවරයාද ගිය ගිය තැනදී අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා මෙන් එක් ස්වරයකින් මහජන ප්‍රසාදයට ලක් වූයේ. එතුමා ගිය ගිය තැනදී මොන මොනවා කතා කළත් එක ස්වරයකින්, එනම් "හූ" ස්වරයෙන් පිළිගන්නවා. මුළු රටම ඒ අන්දමට පිළිගන්නා එකම ඇමතිවරයා වර්තමාන අධ්‍යාපන ඇමතිවරයායි. අපේ වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා ඉතිහාස ගත විය යුතු මෙවැනි කරුණු තවත් ඕනෑතරම් දක්වන්නට පුළුවනි. මට පසුව කතා කරන්නට සිටින තවත් කථික මහත්වරුන් එම කරුණු එක්කාසු කර පෙන්වනවා ඇති. එසේ හෙයින් මා සඳහන් කරන ප්‍රමාණය මෙතෙකින් නවත්වා එතුමා උසස් අධ්‍යාපන ක්‍රමය උඩ විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් සිදු කරන ලද තවත් එක වැදගත් සේවයක් පමණක් මතක් කරන්නට කැමතියි.

යටත් විජිත යුගයේ ලංකාවේ විශ්ව විද්‍යාලයක් පිහිටවූ පුද්ගලයා හැටියට අප හැමෝම හඳුන්වන්නේ ආචාර්ය අයිවර් ජෙනිංස් උන්නැහේයි. මේ රටේ එකම උසස් අධ්‍යාපන ආයතනය හැටියට තිබුණු ලංකා විශ්ව විද්‍යාලයෙන් සහ අනිකුත් අධ්‍යාපන ආයතන මාර්ගයෙන් එදා සිදු වුණාය කියන එකම සේවය නම් මේ රටේ සංවර්ධනයට අවශ්‍ය කාර්මිකයන් විද්‍යාඥයන් හෝ ඉංජිනේරුවන් බිහි කිරීම නොවෙයි. එදා ලංකා විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපනයෙන් සිදු වුණාය කියන්නේ යටත් විජිත ආණ්ඩුවක පාලන කටයුතු සඳහා අවශ්‍ය කරන සිවිල් සේවකයන් හා වෙනත් නිලධාරීන් සම්පාදනය කිරීමයි. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒකත් වෙනස් කර තිබෙනවා. යටත් විජිත අධ්‍යාපන ක්‍රමය යටතේ විශ්ව විද්‍යාලය මගින් සිවිල් සේවකයන් බිහි කිරීමයි එදා සිදු වුණේ. අපේ අධ්‍යාපන ඇමතිතුමා අද කරන්නේ කුමක්ද? එසේ බිහි වී සිටින සිවිල් සේවකයන් විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරුන් හැටියට පත් කිරීමයි. ඒක ඉතිහාස ගත විය යුතු කාරණයක් නොවේද? බ්‍රිතාන්‍ය අධිරාජවාදීන් ලංකාවේ විශ්ව විද්‍යාලයක් පිහිටුවා සිවිල් සේවකයන් බිහි කොට ආණ්ඩුවේ සේවයට දැම්මා. අපේ ඇමතිතුමා දැන් ඒකත් නවත්වා තිබෙනවා. එතුමා රජයේ සිටින සිවිල් සේවකයන් තෝරාගෙන—ඒ උදවියගෙන් සමහර දෙනා විශ්‍රාම ගෙන සිටින අයයි—ඔවුන් විශ්ව විද්‍යාලයේ උප කුලපති පදවිවලට පත් කරනවා. ඒක උසස් අධ්‍යාපනය පිළිබඳ බරපතළ විපර්යාසයක් නැතිනම් පෙරළියක් නොවන්නේද? මේ ආදී වශයෙන් බලන විට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා තරම් මේ රටේ අධ්‍යාපන කටයුතු විෂයෙහි ඉතිහාස ගත විය යුතු පුද්ගලයකු නැති තරම්යැයි කියන්නට පුළුවනි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඔච්චර දන්නවාය කියා දැන ගත්තා නම් තමුන්නාන්සෙවයි, පත් කරන්නෙ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

පසුගිය අවුරුදු තුනහමාර ඇතුළතදී තමුන්නාන්සේ කළ දේ ගැන මේ රටේ හැම දෙනාම දන්න බොහෝ දේ මා මෙතැන සඳහන් කළේ නැහැ. ඉතිහාසගත විය යුතුයයි මා සිතන කරුණු කීපයක් පමණයි, සඳහන් කළේ. මේ රටේ අධ්‍යාපන කටයුතු පිළිබඳව විදේශික මහාචාර්යවරයකු දක්වන අදහස් ඇතුළත් පොඩි පොතකින් ඡේදයක් කියවා මම කථාව පටන් ගන්නම්.

"Without becoming involved in the tangled history of education in Ceylon, let us, for purposes of simplicity, say that there have been—"

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කොයි කාලයේදීද ඔය පොත ලියා තිබෙන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

1964 දී.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

එහෙමනම් ඔය පොතේ කියන දේ ඇත්ත වන්නට ඇති. තමුන්නාන්සේලා කරපු දේ තමයි, ලියා තිබෙන්නේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේ උසස් අධ්‍යාපන පනත හරිගස්සන්න වැඩිපුරම ගියේ ඇමෙරිකන් විශ්ව විද්‍යාලවලටයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඒ මනුෂ්‍යයා දොස් කියනවා නම් මා එය පිළිගන්නවා. තමුන්නාන්සේලා මේක කාලා නේ තිබෙන්නේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඔය කැමට තමුන්නාන්සේත් ටිකක් හවුල් වුණා නේද? මේසය අයිනේ ඉඳ ගෙන මේසයෙන් වැටෙන මොනවාදෝ කුණුකන්දල් අහුලගෙන කෑවා නේද? 1960 සිට නොසිටියත් 1956 සිට සිටියා නේද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අවුරුද්දයි, හිටියේ. එපා වෙලා ගියා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අවුරුද්දකින් කරන්න ඇති, ඒ මහාචාර්යවරයාට අසූ වන්නට ඕනෑ තරම් වැරදි.

"Without becoming involved in the tangled history of education in Ceylon, let us, for purposes of simplicity, say that there have been two different types of education to which a Ceylonese child may have been exposed. One type—an English education—prepared children for membership in the social, economic, and political elites of the Island. The other—a Swabasha or 'mother tongue' education—prepared, or rather condemned, a child to inferior social status and position. Indeed, since English was the official language of government until 1956, an English education was, until that date, a *mandatory* prerequisite for entry into the political elite ......

The next question concerns the *type* of secondary school attended by members of the elite. Presumably, every former British colony has its equivalents of Eton and Harrow. These are the schools to which members of the general elite send their children to distinguish them from the crowd and to prepare them for their future roles within the adult elite."

මේ රටේ තිබුණු පැරණි අධ්‍යාපන ක්‍රමය යටතේ, එකම ජාතියකට අයත් මිනිසුන්, ඉංග්‍රීසි කථා කරන ජාතියය, ඉංග්‍රීසි කථා කරන්නට බැරි ජාතියය කියා ජාති දෙක කට බෙදා තිබුණු සැටි මෙහි විස්තර කර තිබෙනවා. ඉගෙනගන්නා ස්කෝල අනුව තමයි, ජාති දෙකට බෙදුණේ. මේ මහාචාර්යතුමා මේ වාර්තාව ලිව්වේ 1964 දී නිසා, මෙය 1964 ට පෙර සිටි ආණ්ඩුව අනුගමනය කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය විග්‍රහ කර ලියූ ඡේදයක්ය කියා ඇඟ බේරා ගන්නට ඇමතිතුමා උත්සාහ කරනවා. නමුත් අද තමුන්නාන්සේගේ මෙහෙයීමෙන් පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්තියෙනුත් මෙයම නේද කරන්නේ? 1956 රාජ්‍ය භාෂා පනත යටතේ—මාතෘ භාෂාවට තැනක් දුන් පනත යටතේ—යම්කිසි වෙනසක් සිදු වුනා නම්, යළිත් වරක් ඉංග්‍රීසිය සෑම ස්කෝලයකටම ඇතුළු කරන්නට උත්සාහ කර, තමුන්නාන්සේ ක්‍රියා කරන්නේ ඒ වෙනස නැති කොට නැවතත් පැරණි යටත්විජිත යුගයටම අධ්‍යාපනය ඇදගෙන යාමට නේද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මාධ්‍යයක් හැටියට නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මාධ්‍යයක් හැටියට නොවෙයි. නමුත් ඊටත් වඩා භයානක තත්ත්වයක් මෙතන තිබෙන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එතකොට රුසියාවෙ උගන්වන්නෙ? ජර්මනියෙ උගන්වන්නෙ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
චීනයෙ, යුගෝස්ලාවියාවෙ උගන්වන්නෙ? ඉන්දුසිනියාවෙ උගන්වන්නෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඒ රටවල ඓතිහාසික පසුබිම අනුව කල්පනා කර බලන්නට ඕනෑ ඒ රටවල් කරන දේ හරිද වැරදිද කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එහෙම නම් දෙමළ උගන්වන්නද කියන්නෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නැහැ. මේ රටේ යළිත් ඉංග්‍රීසිය හිස එස වීමෙන් සිදු වන්නේ—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඉංග්‍රීසි පමණක් නොවෙයි පුළුවන් නම් අප ජර්මන් රුසියන් භාෂාත් උගන්වනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ ප්‍රශ්නයේදී ඓතිහාසික පසුබිම දෙස බලා තීරණයක් ගත යුතුව තිබෙනවා. මේ රටේ නැවත වරක් තනිකර ඉංග්‍රීසි ඉගැන්වීම මේ රට යටත් විජිත වාදය කරා ඇද ගෙන යාමක්ය කියා අප කල්පනා කරනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔය පොත කොහොමද කියෙව්වෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ පොත පමණක් නොවෙයි, මා කියවන්නම් තවත් පොතක්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඉතින් අනික් අයත් කැමති නොවැ ඉගෙන ගන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නමුත් මේ විධියට කොටසකට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දී——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේලා දුන්නෙ කොටසකට. අප සියලු දෙනාටම දෙන්නට යනවා.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பீ. இலங்கரத்ன—கொலொன்னவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
දෙයි කියල තමයි බය. ගුරුවරු කෝ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සැම දෙනාටම ඉංග්‍රීසි උගන්වන්නට යනවාය කියා අධ්‍යාපන ඇමතිතුමා කියනවා. එහෙම නම් ඒකත් වැරදියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සෙට හරි යන එකක් මට කරන්නට බැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

මක්නිසාද? පළමුව ඒක කරන්නට බැරි වැඩක්. දෙවනුව ඒක නොකළ යුතු වැඩක්. විදේශික භාෂාවක් ජාතියක සැම දෙනාටම ඉගැන්වීම නිරාපරාදේ ජාතික ශ්‍රමය නාස්ති කිරීමක්. අනෙක් අතින් එබඳු විදේශික භාෂාවක් ජාතියට බල හත්කාරයෙන් උගන්වන්නට උත්සාහ කිරීම ඒ ජාතිය නැති කර දැමීමට ගන්න පියවරක්.

මේ ප්‍රශ්නය දෙස තමුන්නාන්සේලාගේ පන්තියේ දෘෂ්ටි කෝණයෙන් පමණක් බලා, පොදුවේ රට දෙස නොබලා, තමන් අද භුක්ති විඳින බලතල දෙස පමණක් බලා නිගමනයකට බැසීම වැරදියි. එසේ කල්පනා කර ජාතියේ පොදු යහපත තකා සාධාරණ නිගමනයකට එළඹෙන්නට පුළුවන්කමක් නැහැ. සැම දෙනාටම ඉංග්‍රීසි උගන්වන එකත් වැරදිය කියා මා කිව්වේ එම නිසයි.

අධ්‍යාපන ඇමතිතුමා බොහෝ විට ලංකා විශ්ව විද්‍යාලයට දොස් කියනවා. මෙපමණ කෝටි ගණනක් වියදම් කරන, මෙපමණ පැරණි ආයතනයක් වන අපේ මේ විශ්ව විද්‍යාලයෙන් බිහි වූ විශිෂ්ට මහාචාර්යවරයා, විශිෂ්ට ලේඛකයා කවුද කියා තමුන්නාන්සේ ප්‍රශ්න කරනවා. මේ දක්වා අපේ විශ්ව විද්‍යාලයෙන් විශිෂ්ට චින්තකයෙක්, විශිෂ්ට විද්‍යාඥයෙක් බිහි වුණාද කියා තමුන්නාන්සේ බොහෝ විට ප්‍රශ්න කරනවා. කුමන අංශයකින්වත් විශිෂ්ටත්වයකට හිමිකම් කියන්නට පුළුවන් එක් තැනැත්තකුවත් මේ උසස් අධ්‍යාපන ආයතනයට බිහි කරන්නට නුපුළුවන් වුණාය කියා තමුන්නාන්සේ දොස් කියනවා. එයට හේතුව කුමක්ද කියා ටිකක් සන්සුන්ව කල්පනා කර බලන්න. ඇයි මේ උසස් අධ්‍යාපනය ලබා දෙන විශ්ව විද්‍යාලයෙන් මේ දක්වා එකම විශිෂ්ට චින්තකයකුවත් ලේඛකයකුවත් බිහි නොවූයේ? එයට හේතුව අවුරුදු සිය ගණනක් තිස්සේ මේ විදේශික භාෂාවක් වූ ඉංග්‍රීසිය ඔවුන්ගේ බුද්ධිය කෙරෙහි බල පෑමයි. ප්‍රධාන හේතුව ඒකයි. ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙනගන්නට ගිහින් මේ රටේ බුද්ධිමත් මිනිසුන්ගේ සිත් මොට වුණා. ඒකයි මූලික හේතුව. තමන් සහජයෙන් උරුමකම් කියන මාතෘ භාෂාව අත්හැර දමා ඒ මාතෘ භාෂාවෙන් උසස් අධ්‍යාපනය නොලබා විදේශික භාෂාවකින් අධ්‍යාපනය ලැබූ නිසා ඔවුන්ගේ අදීන චින්තන ශක්තිය සම්පූර්ණයෙන්ම හීන වී ගියා. ඒකයි ප්‍රධාන හේතුව.

අ. භා. 5.30

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)

අර ශ්‍රීමත් අයිවර් ජෙනිංස් කියන විධියට මේ රට බුද්ධිමත් චින්තකයින්ගෙන් හිස් කාන්තාරයක් බවට පත් වුණේ, ලංකාව සංස්කෘතික කාන්තාරයක් බවට පත් වුණේ, මෙන්න මේ විදේශික භාෂාවේ බල පෑම නිසයි.

ඒ තරම් දුරට ඉංගිරිසියේ ආධිපත්‍යයට යටත් නොවූ තදාසන්න රාජ්‍යයන් දෙස බලන්න. වැඩි දුරට යන්නට වුවමනාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

නැහැ. ඉන්දියාව දෙස බලන්න. බ්‍රිතාන්‍ය යුගය තුළදීම ඉන්දියාවේ ඕනෑ තරම් විශිෂ්ට චින්තකයන් බිහි වුණා. ඒ අය ඉදිරිපත් කළ කෘතීන් ඉංගිරිසියෙන් කළ ඒවාම නොවෙයි. තම තමන්ගේ මාතෘ භාෂාවෙන් ම සම්පාදනය කරන ලද වැදගත් කෘතීන් සැහෙන සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඉන්දියාවට ආඩම්බර වන්නට පුළුවන්කම තිබෙනවා. මේ විධියේ තත්ත්වයක් ඇති වීමට මූලික හේතුව කුමක්දැයි අප විසින් කල්පනාකාරීව සොයා බැලිය යුතුව තිබෙනවා. පසුගිය අවුරුදු එකසිය පණහ තුළ නොවෙයි, හාරසිය පණහක් තරම් වූ දීර්ඝ කාලයක් තුළ මේ රටට විජාතික බලපෑම් බෙහෙවින් ඇති වුණා. ඒ විජාතික බලපෑම් නිසා ඇති වූ ජාතික පරිහානිය ගැන කල්පනා කරන්නට ඕනෑ. එහෙම කල්පනා කරන්නේ නැතිව, එංගලන්තයේ පළ වන යම් සඟරාවක් කියවන්නට ඉංගිරිසි ටිකක් ඉගෙනීම හොඳයි කියා උඩ පැනගෙන යන්නට එපා. ඔය සඟරාවක් කියැවූ පලියට අපේ හැම ජාතික අඩුපාඩුවක්ම සම්පූර්ණ වන්නේ නැහැ. ඊට වඩා වැදගත්, ඊට වඩා බැරෑරුම්, ඊට වඩා අපේ සිත් සතන් යොමු විය යුතු ප්‍රශ්න අපට තිබෙනවා. අපේ ජනතාවගේ දැවෙන ප්‍රශ්න ගැන කල්පනා කර බලන්නට ඕනෑ. අපේ ජනතාවගේ ඕනෑ එපාකම් ගැන සැලකිල්ල යොමු කරන්නට ඕනෑ. එංගලන්තයේ හෝ ලෝකයේ වෙනත් රටවල හෝ සිදු වන දේවල් ගැනත්, වෙනත් රටවල ඇති වී තිබෙන විද්‍යාත්මක ආයතන ගැනත් වැදගත් තොරතුරු සොයා ගැනීමට මාර්ග සකස් කරන්නට ඕනෑ බව පිළිගත යුතු වුවත් මේ විධියට මේ රටේ අතීතය අනුව අනවශ්‍ය අධිපතිකම් කරන ඉංගිරිසියට යළිත් වරක් හිස ඔසවන්නට ඉඩ දීමෙන් සිද්ධ වන්නේ අල්ප මාත්‍රයෙන් නමුත් ඉදිරියට නැඟ එන අපේ ජාතික අභිමානය පිළිබඳ අපේ බලාපොරොත්තු කනගාටුදායක ලෙස කඩවීමයි. අවුරුදු හාරසියයකින් චින්තකයකු බිහි කරන්නට බැරි වූ මේ රට නැවත වරක් ඔය ඉංගිරිසි දම්වැල්වලින් බැඳ තබන්නට ගියොත් තවත් අවුරුදු පන්සියයකටවත් නිදහස්ව නිවහල්ව සිටින්නටත් සිතන්නටත් පුළුවන් මිනිසුන් බිහි කරන්නට බැරි වෙනවා.

ඊයේ රාත්‍රියේ ගුවන් විදුලියෙන් කෙරුණු සාකච්ඡාවකට මා සවන් දීගෙන සිටියා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ හිත මිතුරකුත්, උසස් අධ්‍යාපන මණ්ඩලයේ සාමාජිකයකුත් වන ආචාර්ය අදිකාරම් මහත්මයාගේ කථාවකටයි මා ඇහුම්කන් දීගෙන සිටියේ. මේ රටේ නිදහස් ජාතික තත්ත්වයක් ගන්නට පුළුවන් තරම් උසස් කිසිම කෘතියක් මෑතකදී බිහි වී නැති බව ඒ කථාවේදී සඳහන් වුණා. ඊට හේතුව කුමක්ද යන්නත් විග්‍රහ කළා. ඒ හේතුවයි මා මේ දන් පැහැදිලි කර දෙන්නට උත්සාහ කරන්නේ. ගරු අධ්‍යාපන ඇමතිතුමා තමන්ගේ භාරයේ පවත්නා අධ්‍යාපන දෙපාර්තමේන්තුව පාලනය කරද්දී පසුගිය කාල සීමාවේදී නිකුත් කරන ලද හිතුවක්කාර ඇතැම් චක්‍රලේඛන හා නියෝග නිසා රටේ සමහර කොටස් තුළ ලොකු කලකිරීමක් ඇති වෙලා තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය දවස්වල සමස්ත ලංකා ශිෂ්‍ය සම්මේලනයේ නියෝජිත පිරිසත් හමු වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
කොයි දවස්වලදීද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මෑතකදී.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
දිනය මතක නැද්ද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
දිනය මතක නැහැ, බොහොම මෑතකදී. හොඳයි, ඒ කොයි හැටි වෙතත්, තමුන්නාන්සේ සමස්ත ලංකා ශිෂ්‍ය සම්මේලනයේ වාර්ෂික උත්සවයකට සහභාගි වුණේ නැද්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කොයි කාලයේදී පැවැත්වුණු උත්සව යක් ගැනද කියන්නේ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගත වූ වර්ෂයේ පැවැත්වුණු වාර්ෂික උත්සවය.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කවරදා පැවැත්වුණු වාර්ෂික උත්සව යද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අවුරුදු එකහමාරකට උඩදී.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අවුරුදු එකහමාරකට උඩදී වෙකොස් ලෝවේකියාවට රුසියන්කාරයෝ ආවේවත් නැහැ නොවැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ නිසා මොකද කියන්නේ ? එදා තමුන් නාන්සේට මූලාසනය දී ඒ ශිෂ්‍යයන් කට යුතු කළ නිසා සමස්ත ලංකා ශිෂ්‍ය සම්මේ ලනය බොහොම හොඳ එකක් හැටියට තමුන්නාන්සේ කල්පනා කළ නමුත් අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා නොවෙයිද ? අද තමුන්නාන්සේ විසින් කරන ලද නියෝගයක් පරිදි චක්‍රලේඛන යක් ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව සමස්ත ලංකා ශිෂ්‍ය සම්මේලනය කොමියුනිස්ට් ආයතනයක් හැටියටයි විස්තර කරනු ලබන්නේ. ඒ නිසා ඒ අයට කිසිම සහ යෝගයක් දෙන්නට එපායයි කියනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කියවන්න බලන්න ඒ චක්‍රලේඛනය.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒක ගෙනාවේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නොගෙනා එකක් ගැන කියන්නේ මොකටද ? නිකම් මේ ගරු සභාව නොමග යවන්න එපා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හොඳයි ගරු ඇමතිතුමා එවැනි නියෝග යක් නිකුත් කළේ නැතෙයි කියනවාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔය කියන විධියට චක්‍ර ලේඛනයක් යැව් වේ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අන්න හරි. කියන විධියට යැව්වේ නැහැ. එහෙත් ඒ ශිෂ්‍ය සංගමයේ වැඩ කටයුතු වලට සහයෝගය දෙන්නට එපාය කියා චක්‍ර ලේඛනයක් යැව්වා. ගරු ඇමතිතුමා සභාවේ මූලාසනයේ තබාගෙන හොඳ කථා වක් කළ අවුරුද්දේ ඒ ශිෂ්‍යයෝ හොඳයි. ඇමතිතුමා අනුමත නොකරන අදහස් වග යක් ඒ ශිෂ්‍යයන්ගේ සඟරාවක පළ වූ නිසා එය කොමියුනිස්ට් සංවිධානයක් වුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කලකට පෙර ගරු කර්මාන්ත ඇමති තුමා ගරු මන්ත්‍රීතුමාගේ නායකයා හැටියට පිළිගත්තා. එහෙත් අද නැහැ. හැමදාම එක විදිහේ යැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඒක හරි. උන්නැහේ කරන වැරදිවල හැටියට මම කොහොමද උන්නැහේගේ නායකත්වය පිළිගන්නේ ?

මෙන්න මේ විධියට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා තමන්ගේ ඇමති ධුරයේ බල තල පාවිච්චි කරන්නට යන නිසා, ඉතාම පටුකල්පනාකාරී විධියට ඒ බලතල පාවිච්චි කරන නිසා, එක්තරා විධියක නිදහසක් භුක්තිවිඳිමින්, එක්තරා විධියක සේවයක් කරමින් තිබුණු සමහර ආයතනවලට හා ව්‍යාපාරවලට බලවත් පහරක් වැදී තිබෙන වා. ගරු ඇමතිතුමා අවුරුදු 3½ ක් තුළ කළ හැම දෙයක් ගැනම මා සඳහන් කරන්නේ නැහැ. එතුමා පෙරේදා සහභාගි වූ රැස්වීම කදී—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Sir, this is all irrelevant. Can you not put him on the track? The hon. Member has got derailed.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මේ යන්නේ කෝච්චි පාරේ නොවෙයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා කිව්වෙත් ඒක තමයි. වෙන පාරකයි යන්නේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මේ යන්නේ අධ්‍යාපන බරකරත්තයේ.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීවරුන් 15 දෙනෙක් දැනට මේ ගැන කථා කර තිබෙනවා. කරුණාකර ඉක්මනින් කථාව අවසන් කරන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ අලුත්ම කථාවකින් කොටස් කිපයක් ගෙනහැර දක්වන්නම්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මොකක්ද ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගිය සතිය අගදී අගනුවර විදුහල්පතී වරුන් අමතමින් ගරු අධ්‍යාපන ඇමති තුමා කළ කථාවක.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඊයේත් කිව්වා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ නොකියන්න ඇති. අනික් අය කිව්වා. තමුන්නාන්සේටත් කියන්න ඕනෑ නම් කියන්න. [බාධා කිරීමක්]

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඒ මේක නොවෙයි. ඒ කියෙව්වේ ඇමති තුමා බණින පත්තරයකින්. මේ, ඇමති තුමා පිළිගන්නා "ලංකාදීප" පත්‍රය. [බාධාකිරීමක්] ඊයේ කියෙව්වේ "ජනතා" පත්‍රයෙන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නැහැ දිනමිණෙන්. ලංකාදීපයත් හරි නැහැ. ඒකත් පිළිගන්න පත්තරයක් නොවෙයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ රැස්වීම බොහොම ප්‍රීතිදායක රැස්වීමක් බව පෙනෙනවා. මා එසේ කීවේ රැස්වීම පටන්ගෙන තිබෙන ආකාරයටයි. "'ලෝකෙන් උතුම් රට ලංකාවයි' ගීතය ගයා පිළිගන්නා ලදී" කියා තිබෙනවා. ඒ නිසා ඇමතිතුමා බොහොම නිදහස්ව ප්‍රීතිමත්ව ඒ සාකච්ඡාවේදී අදහස් ප්‍රකාශ කර තිබෙන බව හිතන්නට පුළුවන්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

දවසක තමුන්නාන්සේත් එක්ක යන්න මට හිතයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ සාකච්ඡාවේ එක්තරා අවස්ථාවකදී මෙහෙම දෙයක් කියා තිබෙනවා.

"තරුණ පිරිසගේ අදහස් ඒ ආකාරයෙන්ම විකාශනය විය යුතුය යන්න විශ්ව විද්‍යාල පණ්ඩිත යන්ගේ අදහසයි. සමහර අවස්ථාවලදී මහාචාර්ය වරුන් අතිනුත් විකාශනය වන බව මම දනිමි. මවක දකින කුඩා දරුවකුට රාගික චේතනා පහළ වන බව කියැවෙන පොත් පත්‍ය ඔය ආචාර්ය වරුන් අතින් බිහිවන්නේ."

මා හිතන්නේ ගරු ඇමතිතුමා එය වරද්දාගෙනය කියලයි. මේ කියන සිද්ධිය සඳහන් වුණේ මහාචාර්යවරයෙක් ලියූ පොතක නොවෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

ඔකේ ඒ කියන කරුණ පමණක් වැරදියි. මා කීවේ මහාචාර්යවරුන් පාවිච්චි කරන්නේ ඒ විධියේ පොත් ය කියලයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

"විශ්ව විද්‍යාලවලින් පිරිසිදු දිය දහරාමෙන් පිට විය යුතුවා වෙනුවට අද පිටවන්නේ මඩවගුරු මෙන් ය.

ආචාර්යවරුන් නොහැදී සිසුන් හැදිය හැකිද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හොඳට ඇහෙන්න කියවන්න. මාත් ආසයි අහන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අධ්‍යාපන ඇමතිතුමාට තිබෙන එකම රෝගය තම ස්වරය අසා ගැනීමට තිබෙන ආශාවයි. තම අදහස් කොහොම හරි අනුන් ලවා කියවා ගැනීමේ ආශාවයි......

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේට තිබෙනවා, හැම දේටම කථා කරන පිස්සුවක්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

......එම නිසා. මේ අතුරු යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන රුපියල් ලක්ෂ ගණනෙන් රු. 21ක් වියදම් කොට, අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මානසික වෛද්‍ය වරයකු ළඟට ගෙන යා යුතුයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සිහිය ඇති අය දැක්කහම අංගොඩ මිනිස්සුත් ඔහොම කියනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මෙන්න ඊළඟට අධ්‍යාපන ඇමතිතුමා කියා තිබෙන දේ :

පඩි වැඩි නොකළොත් "ස්ට්‍රයික්" කරනවාය කියන අපේ මහාචාර්යවරුන්ගෙන් කුමන විනයක් ඇති වේද? උගත්කම කෙසේ වෙතත් මහත්තැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමවත් ඇත්නම් රටේ මුදල් හිඟය ගැන පැහැදිලි කර දී තිබියදීත් ඔවුන් එවැනි තීරණයන් ව පෙළෙඹෙව්ද ? ලැබෙන වැටුප් මදිනම් තියෙන්නේ ගෙදර යන එකයි. යන්නෙත් නැහැ. කියන එක අහන්නෙත් නැහැ.

කොයිතරම් මානසික විපිරියාසයකින් අධ්‍යාපන ඇමතිතුමා මෙම ප්‍රකාශය කර තිබේද යන වග විමසිය යුත්තේ මා කලින් කී පරිදි, රු. 21ක් වියදම් කොට එතුමා මානසික විශේෂඥයකු ළඟට ගෙන යාමෙනුයි.

ඊළඟට අධ්‍යාපන ඇමතිතුමා හැම තිස්සේම අල්ලාගෙන ගහන කොමියුනිස්ට්කාරයන් වගයක් මෙතැනදීත් අල්ලා ගෙන තිබෙනවා.

කොමියුනිස්ට්කාරයන් මුළු ලොව පුරා පිහිටි විශ්ව විද්‍යාලවල වැඩ වර්ජන ව්‍යාපාරයක් ඔක්තෝබරයේදී ඇති කිරීමට කටයුතු කරගෙන යන අතර මේ එයි එක් අංගයකැයිද අධ්‍යාපන ඇමතිවරයා කීවේය.

අපට නම් කවදාවත් මෙවැනි ආරංචියක් අහන්නට දකින්නට ලැබුණේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේට සේරම ආරංචි ලැබෙනවායැ ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
විශ්ව විද්‍යාල, ඔක්තෝබර් විප්ලවයක් කරන්නට යන බවට ආරංචියක් අධ්‍යාපන ඇමතිතුමාට ලැබී තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
එහෙනම් ඒක නොවැම්බරේට කල් දමාගෙන ඇති.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ඇත්ත වශයෙන්ම ජයග්‍රාහක විප්ලවය ඇති වුණේ නොවැම්බරයේ තමයි. ඔක්තෝබර් විප්ලවය යනුවෙන් සඳහන් වී ඇතත්, නියම විප්ලවය සිදු වුණේ නොවැම්බරයේදීයි. ඒ නිසා, තමුන්නාන්සේ කියන මේ විප්ලවය නොවැම්බරයට කල් ගිහින් තිබෙන්නේ තමුන්නාන්සේගේ හොඳකට නොවෙයි.

ඊළඟට එතුමා, හැම තැනකදීම සඳහන් කරන නොසරුප් වචනවලින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ චරිත පිළිබඳ කරුණු වගයක් ප්‍රකාශ කර තිබෙනවා. ඒවා හැන්සාඩ් වාර්තාගත වීම නුසුදුසු නිසා මා ඒවා කියවන්නේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කියවන්න, කියවන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මේ වගේ නැහැදිච්චි වචන කියන්නට තමුන්නාන්සේ කැමැති වුණත්, මා නම් කැමැති නැහැ. මුද්‍රණය කර තිබුණත් මා ඒවා කියවන්නේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මූණ දිහා බැලුවහම පේනවා හැදිච්චකම.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
කුමන රැස්වීමකට ගියත් කුමන සාකච්ඡාවකට ගියත් තමාට මතක් වන මතක් වන හැම එක්කෙනාටම—තම අමාත්‍යාංශයේ නිළධාරීන්ට හෝ වේවා, විරුද්ධවාදී දේශපාලනඥයන්ට හෝ වේවා, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවනට හෝ වේවා, විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුනට හෝ වේවා—නොසරුප් බසින්, අවමන් වන අන්දමින් බැණ වදින අධ්‍යාපන ඇමතිතුමා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියවස සිහිපත් කරන්නට උත්සාහ කරන මේ අවස්ථාවේදී එතුමාගේ මේ ක්‍රියාකලාපය ගැන බුද්ධිමත් මහජනයා මොනවා හිතනවා ඇද්දැයි ඕංගක් නතර වී කල්පනා කරන්න. හැම අවස්ථාවකදීම, විරුද්ධවාදීන් කියන හැම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
දෙයක්ම විහිළුවක් බවට හරවාගෙන ඔවුන්ට අවමන් කරමින් දිනූ බවක් ජය ගත් බවක් ලෝකයට පෙන්වීමට තමුන් නාන්සේ උත්සාහ කළත්, ඇත්ත වශයෙන්ම, කල්පනා කරන මිනිසුන් හමුවෙහි තමුන්නාන්සේ අන්ත පරාජයකට පත්ව සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේ වාගේ කල්පනා කරන මිනිසුන් තව කීදෙනාද ඉන්නේ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
තමාට මිස, වෙන කිසිම කෙනකුට හරියට කල්පනා කරන්නට බැරිය යන අදහස ඇරීමේ රෝගය තමයි, අධ්‍යාපන ඇමතිතුමාට වැළැඳී තිබෙන්නේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීතුමා නොවැ, එහෙම කියන්නේ ? එයාට විතරලු, නියම විධියට කල්පනා වන්නේ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මා කොතැනකවත් එහෙම කියා නැහැ. අනෙක් මිනිසුන්ට කල්පනා කර අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබෙන්න ඕනෑ. (බාධාකිරීම්) කරුණාකර අධ්‍යාපන ඇමතිතුමාට කියන්න, කලබල නොවී ඩිංගක් ඉන්න කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අපිත් කථා කරන්න ඕනෑ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ටිකක් ඉන්න. මොකද හදිස්සිය ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීතුමා දැන් කථා කරන්නේ මොන ආරංචියක් උඩද ? මොකක්ද, අදහස ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ ප්‍රවෘත්තියෙන් පැහැදිලි වන්නේ, අධ්‍යාපන ඇමතිතුමාගේ හිතේ බලපවත්වන මානසික අසහනයයි. මේ රෝගයට යම්කිසි ප්‍රතිකාරයක් ගත යුතුයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මා මෙතෙක් හිතා හිටියේ, මන්ත්‍රීතුමා අද්වකාත් කෙනෙක් කියායි. දැන් බලන විට, දොස්තර කෙනකු බවත් පෙනෙනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
Please do not interrupt the hon. Member. Let him finish.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ කාර්යය වෙනුවෙන් රුපියල් ලක්ෂ ගණනක් ඉල්ලා තිබෙනවා. මේ ගරු සභාවේ අනුමතිය ලැබෙන්නටත් කලින්, කොපමණ මුදලක් දැනටමත් වියදම් කර තිබෙනවාදැයි මා දැනගන්න කැමතියි. මේ යෝජනාව සම්මත වේය යන බලාපොරොත්තුවෙන් ලොතරැයි ටිකට් මුද්‍රණය කිරීම සඳහාත්, ඒ පිළිබඳ නොයෙකුත් සාකච්ඡා පැවැත්වීම හා සංවිධාන කටයුතු කිරීම සඳහාත් කොපමණ මුදලක් වියදම් කළාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීතුමා මටත් වඩා දන්නවා නොවැ ? කියන්න, කොපමණද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඇමතිතුමා නොවැ, කෙරුම්කාරයා. සිය වස පිළිබඳ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළේ, දැනට මාසයකට පමණ කලිනුයි. එහෙත් ඒ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නටත් කලින් පවා තම තනි මතය අනුව නිලධාරීන්ට නියෝග කොට, මේ කටයුත්ත වෙනුවෙන් කොපමණ මුදලක් වැය කර තිබෙනවාද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මා දන්නේ නැහැ. මන්ත්‍රීතුමා කියන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

දන්නේ නැහැ? තමා කළ නියෝග මොනවාදැයි දන්නවා නොවැ. මේ හිතුවක්කාරකම තමයි——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඕකමයි, ඉවසන්න බැරි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඉවසන්න දෙයක් නොවෙයි. මේ ක්‍රියාව නීති විරෝධිවා පමණක් නොව, පාර්ලිමේන්තු සම්ප්‍රදාය විරෝධිවා පමණක් නොව, හිතුවක්කාරයි. මෙසේ අත්තනෝමතිකව කටයුතු කරන ඇමතිවරයකු යටතේ අපේ අධ්‍යාපනය පවතින නිසා තමයි මේ ඇමතිතුමා යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිදු වන්නේ කුමක්දැයි අප විශේෂයෙන් දැන ගත යුත්තේ.

රාජ්‍ය ඇමතිතුමා තුන් හතර වතාවක්ම කීවා, මේ ගැන එතුමාත් කථා කරන්නට ඕනෑය කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඔව්, මටත් කථා කරන්න ඕනෑ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් දෙතුන් දෙනකුටත් කථා කරන්න ඕනෑලු. එතුමන්ලා කථා කළාට පස්සේ කථා කරන්න රාජ්‍ය ඇමතිතුමාට පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මට දැන් වුණත් පුළුවනි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අතුරු යෝජනාව පිළිබඳව අපේ විරුද්ධත්වය පළ කරනවා. අධ්‍යාපනයත් හුදුවක් බවට පත් කිරීම ගැන අපේ විරුද්ධත්වය දක්විය යුතුයි. මේ රටේ නොමිළයේ සපයන තවත් සේවාවන් වගයක් තිබෙනවා. නිදහස් සෞඛ්‍ය සේවය ඉන් එකක්. ඒ නිදහස් සෞඛ්‍ය සේවය සම්බන්ධයෙනුත් ලොතරැයි පටන් ගත්තා; හුදුවක් පටන් ගත්තා. ඊළඟට අලුතෙන් හැදූ "ජාතික සම්පත" කියන හුදුවත් දැන් මහා කන්දොස්කිරියාවක් වෙලා තිබෙනවා. ආහාර වගා ව්‍යාපාරයත් දැන් හුදු තාලයක් බවට පත් වී තිබෙනවා. නොමිළයේ දෙන සෞඛ්‍ය සේවය, නොමිළයේ දෙන හාල් සේරුව, නොමිළයේ දෙන අධ්‍යාපනය යන මේ ඔක්කොම දැන් හුදු බවට පත් වී තිබෙනවා. මේ ආණ්ඩුව යටතේ හැම දෙයක්ම හුදු බවට පත් වන්නටයි, යන්නේ. මේ හුදුවලින් සමාජය තව තවත් දූෂණය කරන්නට එපා. නිදහස් අධ්‍යාපනය හුදුවක් බවට පත් නොකර ගරු ඇමතිතුමා එකක් කළයුතුව තිබෙනවා. ඉතිහාස ගත වීම සඳහා ගරු ඇමතිතුමා පසුගිය අවුරුදු තුන හමාර ඇතුළතදී ඕනෑ තරම් දේවල් තිබෙන හෙයින් මේ රටේ මින් පෙර කිසිම දාක අධ්‍යාපන ඇමතිවරයකු නොකළ වැඩේ කරන ලෙස,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
එනම් ඉල්ලා අස් වී යන ලෙස, අධ්‍යාපන යට ආයුබෝවන් කියන ලෙස මා එතුමාට මතක් කරනවා.

අ. භා. 5.53

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අවුරුදු 100 ක් ගත වීම නිමිත්තෙන් ලබන අවුරුද්දේදී පවත්වන්නට යන උත්සවය පිළිබඳවයි, මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මා නම් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් ලොකු දැනුමක් ඇති විශාරදයකු නොවන බව ඇත්තයි. එහෙත් සාමාන්‍ය මන්ත්‍රීවරයකු වශයෙන් හෝ මාත් යමක් ප්‍රකාශ කරන්නට එපායැ. පසුගිය අවුරුදු 100 තුළ අධ්‍යාපන කටයුතුවල නොයෙකුත් වෙනස්කම් සිදු වී තිබෙනවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනය යටතේ මේ රටේ එක්තරා අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. ඒ අධ්‍යාපනය තුළින්ද යම් යම් උගතුන් බිහි වුණා. එදා තිබුණු අධ්‍යාපන ක්‍රමයෙන් ප්‍රයෝජන ගත් උදවියයි දැන් ඔය නායකත්වය ගෙන සිටින්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඔය පැත්තෙන් ඉන්නවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
චින්තකයන් බිහි වුණේ නැතැයි හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) කීවා. එහෙත් ගරු රාජ්‍ය ඇමතිතුමා, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) චින්තකයන් හැටියට ගණන් ගන්නට බැරිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඔව්, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් එක් කෙනෙක් තමයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය වාදී පාලන කාලයේ තිබුණු ඉංග්‍රීසි අධ්‍යාපනය තුළින් යම් යම් තරාතිරම්වල පුද්ගලයන් බිහි වුණා. දැන් ඒ අධ්‍යාපනය ක්‍රම ක්‍රමයෙන් පරිවර්තනය වීගෙන යනවා. එදා අප ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා කාලයේදී, ඉංග්‍රීසි නොදන්නා අයට විශ්ව විද්‍යාලයට ඇතුළු වන්නට පුළුවන්කම තිබුණේ නැහැ. එහෙත් ටිකින් ටික සිංහලට තැනක් ලැබී ගෙන ආවා. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළ යුතු යයි රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී ගරු රාජ්‍ය ඇමතිතුමා යෝජනාවක් ගෙනාවා.

සියවස් උළෙලේදී මෙතෙක් හිටි සෑම අධ්‍යාපන ඇමතිවරයකු ගැනම සිහිපත් කළ යුතුයි. මෙතෙක් සිටි සෑම අධ්‍යාපන ඇමතිවරයකුගෙන්ම යම් යම් සේවාවන් සිදු වී තිබෙනවා. වර්තමාන කෘෂිකර්ම ඇමතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදීත් ඒ වාගේම වර්තමාන කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා (කලුගල්ල මයා.) අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදීත් ඒ අයගේ ශක්ති ප්‍රමාණයෙන් සේවය කළා. එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කල්පනාවේ හැටියට මේ රටේ අධ්‍යාපනයේ විශාල පරිවර්තනයක් ඇති කළේ අන් කිසිවකු නොව දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී—අපේ කර්මාන්ත ඇමතිතුමාත්, වර්තමාන වෙළඳ ඇමතිතුමාත් ඒ ආණ්ඩුවේ සිටියදී—ඒ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටි විජයානන්ද දහනායක මහත්මයා බව අප කවුරුත් පිළිගන්නට ඕනෑ. සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව වුණාට පසු මේ රටේ සෑම ප්‍රදේශයකම වගේ මහා විද්‍යාල පිහිටුවූවා පමණක් නොව, ඒ කාලයේ වෙනත් ආසියාතිකයන් පවා ඉගෙනුම සඳහා සොයාගෙන ආව මේ රටේ පැවති උසස්ම පිරිවෙන් දෙක වන විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පරිවර්තනය කළ දහනායක අධ්‍යාපන ඇමතිතුමා අපට මේ අධ්‍යාපන සියවසෙහිදී කවදාවත් අමතක කරන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත : සම්මතිය

කමක් නැහැ. ඒ තත්ත්වය ඇති වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේ දීයි.

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව කාලයේදී.

**පර්සි වික්‍රමසිංහ මයා.**
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

කොහොම හරි දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් පැවති ආණ්ඩුව කාලයේදීයි. මම මේ කථා කරන්නේ අපක්ෂපාතවයි.

**ආර්. පී. විජේසිරි මයා.** (කුණ්ඩසාලෙ)
(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலே)
(Mr. R. P. Wijesiri—Kundasale)

එහෙනම් අද උදේම ගිහින් ඇමතිතුමාගෙන් මොනවා හරි කරවා ගන්න ඇති.

**පර්සි වික්‍රමසිංහ මයා.**
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

මහා විද්‍යාලත් මේ විශ්ව විද්‍යාල දෙකත් ඇති වුණු නිසා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ගත් විශාල පිරිසකට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වී උපාධි ලබා ගන්නට අවස්ථාව ලැබුණා. මේ අන්දමට බිහි වූ උපාධිධාරීන් දැන් අපටත්, ආණ්ඩුවටත් අධ්‍යාපන ඇමතිතුමාටත් කරදර කරනවා, රැකිරක්ෂා ප්‍රශ්නය විසඳන්නය කියා.

මේ රටේ දරු දැරියන්ට අධ්‍යාපනයක් ලබා දිය යුත්තේ රැකිරක්ෂා ප්‍රශ්නය විසදීමේ පරමාර්ථයෙන් පමණක් නොව, ශිෂ්ට සම්පන්න ශීලාචාර පරපුරක් ඇති කිරීමේත් පරමාර්ථයෙන් බව අවුරුදු 100 ක් අවසාන වන මේ අවස්ථාවේදීවත් අප සියලු දෙනාම කල්පනාවට ගන්නට ඕනෑ. අපි අවුරුදු 100 කින් පසුවවත් ඉගෙන ගත යුතු පාඩම ඒකයි.

මම සමහර අවස්ථාවල අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවලට එකඟ වෙන්නෙ නැහැ. එහෙත් අධ්‍යාපන ඇමතිතුමා[illegible] කෙනෙයක් අවස්ථාවල දෝෂාරෝපණ එල්ල වීම ස්වාභාවිකයි. හැබැයි, අධ්‍යාපන ඇමතිතුමාගේ එක ප්‍රතිපත්තියක් තමයි, ඕනෑ එකක් ඔහෙ ගහල අරින එක. කියන එක කියනවා ඕනෑ අතකින් පලයන් කියා. හරි හෝ හෝ වැරදි හෝ වේවා කියන්ට තියෙන එක කියනවා. ඒක කවුරුත් දන්න කාරණයක්.

අද බොහොම දෙමව්පියන් තමන්ගේ ළමයින් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කරන්නට අකමැත්තක් දක්වනවා. මා සමග මගේ හොඳ මිත්‍ර එක්සත් ජාතික පක්ෂයට හිතවත් මහත්මයෙක් කිව්ව "මගේ දියණිය නම් විශ්ව විද්‍යාලයට ඇතුළත් කරන්නෙ නැහැ" කියා. මම ඇහුව ඒ මොකද කියා. උන්නැහේ කිව්ව, විශ්ව විද්‍යාලයට ඇතුළත් කළොත් ගන්ට දෙයක් නැතුව යනවාය කියා. ඒ විධියේ තත්ත්වයක් මේ රටේ තිබෙන නිසා අපට ඒව හංගන්නට වුවමනා නැහැ. අපි කවුරුත් එකතු වෙලා ඒ තත්ත්වය අවුරුදු 100 ක් ගිහිල්ලවත් වෙනස් කරන්නට ඕනෑ. එහෙම නැතුව අපේ අනාගත පරම්පරාව සමග සෙල්ලම් කරන්ට ගියොත් රටට සිදු වෙන්නෙ මොකක්ද? හොඳ ශිෂ්ට සම්පන්න උගත් ජනතාවක් මේ රටේ ඇති කරන්ට ඕනෑ. ගත වූ අවුරුදු 100 තුළ දී අප කළ වැරදිවල මායිමක් නැතිව ඇති. එහෙත් ඒවා දිගින් දිගට පවතින්නට ඉඩ හැරිය යුතු නැහැ.

අපේ සමහර උදවිය කියනවා, ඉංග්‍රිසි වුවමනා නැහැ කියා. මම එහෙම කියන්නෙ නැහැ. ඉංග්‍රිසි නොවෙයි, රුසියන් භාෂාව උගන්වන්නට පුළුවන් නම් ඒකත් උගන්වන්න. ඇයි, ඉස්සර වගේ නොවෙයි, දැන් රුසියාවේ ලුමුම්බා විශ්ව විද්‍යාලයට මේ රටේ ශිෂ්‍යයින් ඇතුළත් වෙනවා. ඒ නිසා අපේ දරුවන්ට රුසියන් භාෂාවත් උගන්වනවා නම් ලුමුම්බා විශ්ව විද්‍යාලයට යන ළමයින්ට එය කොයිතරම් පහසුවක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අධ්‍යාපන ප්‍රශ්නය ඉතාම ගම්භීර ප්‍රශ්නයක්. අධ්‍යාපන ප්‍රශ්නයේදී ගැලරිය සතුටු කරවන්නට අපට වුවමනා නැහැ. අද අපේ රටේ බුද්ධිමත් පිරිසක් සිටිනවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ කාලේ හරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මොන කාලේ හරි ඉගෙනීම ලත් බුද්ධිමත් පිරිසක් අද මේ රටේ සිටින නිසා තමයි මෙපමණින්වත් ලෝකයේ පිළිගත් රටක් හැටියට අපේ රට ගණන් ගෙන තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පස්ස බලාගෙන කතා කරන්න.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මට කොයි පැත්ත බලාගෙන වුවත් කතා කරන්නට පුළුවනි. අද අපේ රටේ හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) වැනි හොඳ අධිනීතිඥයන් සිටිනවා. ඒවාගේම හොඳ උසස් වෛද්‍යවරුන් සිටිනවා; චින්තකයන් සිටිනවා, සමාජ සේවකයන් සිටිනවා. ඒ උදවිය කුමන අධ්‍යාපන ක්‍රමයෙන් හරි බිහි වුණා. [බාධා කිරීමක්] අධ්‍යාපන ඇමතිතුමාගේත් වැරදි ඇති. කර්මාන්ත ඇමතිතුමාගේත් වැරදි ඇති. මගෙත් වැරදි ඇති. වැරදි නැති කෙනෙක් නැහැනෙ. එහෙත් මින් පෙර අපෙන් යම් යම් වැරදි ඇති වුණා නම් එම වැරදි තවදුරටත් පවත්වාගෙන යන්නේ නැතුව ඒවා හරිගස්සා ගන්නට අපි කල්පනා කරන්නට ඕනෑ. ලෝකප්‍රසිද්ධ දේශපාලනඥයකු වන ලෙනින්තුමා කියා තිබෙනවා, "වරද දැන ගත් විට හරිගස්සන්නට ඕනෑය; නැවතත් ඒක නොකර ඉන්නට ඕනෑය" යනුවෙන්.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

චෙකොස්ලොවෙකියාවේ කර තිබෙන වැරදිත් පිළිගෙන හදාගන්නට ඕනෑ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

චෙකොස්ලොවෙකියාව ගැන නොවෙයි මා කතා කරන්නේ. අධ්‍යාපන සියවස ගැනයි මා කතා කරන්නේ. ගරු කර්මාන්ත ඇමතිතුමනි, මා කීවේ ලෙනින් කී දෙයක්. [බාධා කිරීම්] මගෙන් අහගන්නට වුවමනා නැහැ, කාගෙත් කෙරුම්. කාගෙ අතෙත් වැරදි ඇති. ඕවා ගැන විස්තර කරන්නට ගියොත් සිදු වනදේ දන්නවනේ. [බාධා කිරීමක්] අපි කියන්නේ අධ්‍යාපනය ගැනයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The hon. Member is wasting the time of the House.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

I am not wasting the time of the House, for I am speaking on one hundred years of education in Ceylon. I cannot speak about the hundred years of education in this country in five minutes.

දැන් බලන්න අපේ පාඨශාලාවල තත්ත්වය ගැන. නැවතත් දහනායක ඇමතිතුමා ගැන කතා කරන්නට සිදු වී තිබෙනවා. 1956න් පසුව දහනායක ඇමතිතුමා සෑම තැනම පාඨශාලා ගොඩනැගිලි සදා ගෙන ගියා. ඒ අවධියේ එතුමා පාඨශාලා ගොඩනැගිලි නොදම්මා නම් අද අපේ ළමයින්ට ඉගෙන ගන්නට තැන් ඇත්තේ නැහැ. එතුමාගේ විශාල වැඩ පිළිවෙළක් තිබුණා. එතුමා සෑමතැනම ගොඩනැගිලි සාදාගෙන ගියා. අද එම ගොඩනැගිලි සංඛ්‍යාවත් මදිවෙලයි තියෙන්නේ. දවසින් දවස ජනගහනය වැඩි වන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එසේ වැඩිවන ජනගහනයට සරිලන්නට නම් තවතවත් පාසල් ගොඩනැගිලි සෑදිය යුතුයි. ඒවාගේම ගුරුවරුන් අවශ්‍යයි.

අපේ ගම්බද ප්‍රදේශවල තවමත් පවතින්නේ ඉතා කනගාටුදායක තත්ත්වයක් බව කිවයුතුයි. ගොඩනැගිලි නැතිකම නිසා ගම්බද පාඨශාලාවල පන්ති පවත්වාගෙන යන්නේ ගස් යටයි. එය කනගාටුවට කාරණයක්. [බාධා කිරීමක්] එදත් වැරදි තිබුණා. අදත් තිබෙනවා. අවුරුදු 100 ක් ගියාසින් පසුවත් ඒවා තියාගන්නට නො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙයි ඒවා නැති කර ගන්නටයි සූදානම් විය යුත්තේ. එදත් වැරදි තිබුණාය කියා අදත් වැරදි කරන්නට ඕනෑද? [බාධා කිරීමක්] මට තේරෙන නිසා තමයි මම කියන්නේ. තමුන්නාන්සේට තේරෙන්නේ නැතිනම් කට වහගෙන ඉන්න. ඔය කනගාටුදායක තත්ත්වය වෙනස් කරන්නට ඕනෑ. අළුත් ගොඩනැගිලි සාදන විට හැකිතරම් පන්ති කාමර වෙන් කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. නිකම්ම අඩි 80×20 මාළු කඩ වැනි ශාලා සෑදීමෙන් පලක් නැහැ. එවැනි ශාලාවල පන්ති පවත්වන්නට ගියාම සිදු වන්නේ කුමක්ද? මේ පන්තියේ කවි කියනවා. අනික් පන්තියේ භූගෝලය උගන්වනවා. අනික් පන්තියේ ඉතිහාසය උගන්වනවා. එතකොට මෙතන කවියක්; අතන භූගෝලය; අනික් තැන ඉතිහාසය. හරියට මාළු කඩයක් වගෙයි. එසේ හෙයින් අළුත් සැළැස්මවලට අනුව ගොඩනැගිලි සාදන විට පන්ති කාමර වෙන් කොට ඒවා සාදන්නට කල්පනා කළ යුතුයි. ලෝකයේ දියුණු රටවල් ඒ අන්දමට කටයුතු කරන බව අප දන්නවා. පන්ති කාමර වෙන් නොකර ගොඩනැගිලි තැනීම අධ්‍යාපනයට විශාල බාධා වියහැකි දෙයක් බව දියුණු රටවල් පිළිගෙන තිබෙනවා. අපි ඉගෙන ගන්නා දවස්වල තිබුණු තත්ත්වය කුමක්ද? ඒ කාලයේ අපේ දෙමව්පියන් දන්නවා, මගේ ළමයා පාඨශාලාවට ගිහින් කේම්බ්‍රිජ් ජූනියර්, කේම්බ්‍රිජ් සීනියර්, ලන්ඩන් මැට්රිකියුලේෂන් සමත් වුණාම මේ තත්ත්වයට එන්නට පුළුවන්ය කියා. අපේ සමාජ සේවා ඇමතිතුමත් මාත් එකට ඉගෙන ගත්තා. ලන්ඩන් මැට්රිකියුලේෂන් විභාගය ලැටින් සමග සමත් වුණාම නීති විද්‍යාලයට යන්නට පුළුවන්ය කියා අපේ දෙමව්පියන් දැනගෙන සිටියා. අසවල් විෂය සමග සමත් වුණාම අසවල් තැනට යන්නට පුළුවන්ය කියා ඒ අයට අවබෝධයක් තිබුණා.

අද තත්ත්වය කොහොමද? අද අපේ ළමයින් පාඨශාලාවට ගිහින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙනවා. ඊ ළඟට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වෙනවා. ඊ ළඟට ළමයාගේ තත්ත්වය මොකක්ද කියා දෙමව්පියන් දන්නෙ නැහැ. විෂයයන් 4 ක් සමත් වුණොත් විශ්ව විද්‍යාලයට යන්නට පුළුවන්ය කියා ගිය අවුරුද්දේ කිව්වා. මේ වර්ෂයේදී කියනවා, එහෙම බැහැ, විෂයයන් 3 ක් සම්මාන 3 කුත් සමග සමත් වුණොත් පමණයි, විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නට පුළුවන් කියා. ඔන්න ඔය විධියේ නොයෙකුත් වෙනස්වීම් චක්‍රලේඛ මගින් ඇති වෙනවා. මේක දෙමව්පියන්ට තිබෙන විශාල කරදරයක්. දෙමව්පියන්ට අද තමන්ගේ ළමයින් පුහුණු කර යම්කිසි මාර්ගයක යැවීමට බාධාවක් තියෙනවා. ඊට හේතුව මොකක්ද?

තමුන්නාන්සේ අද අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල ඇමතිතුමා. ඊට පෙර සිටියේ පී. බී. ජී. කලුගල්ල ඇමතිතුමා. ඊට පෙර සිටියේ බදිඋද්දීන් මහ්මූද් ඇමතිතුමා. ඊට පෙර සිටියේ තවත් කෙනෙක්. ආණ්ඩු වෙනස් වන විට, ඇමතිවරුන් වෙනස් වන විට, අධ්‍යාපනය වෙනස් වෙනවා. එහෙම නොවෙයි සිදු විය යුත්තේ. දේශපාලන මතභේදවලින් තොරව, අවුරුදු සිය ගණනක් ගියත් එක අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ පවතින පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. එතකොට අප දන්නවා, අප අපේ දරුවන් පිටත් කරන්නේ කොහාටද කියා. මාත් දරුවන් ඇති පියෙක්. මට තියෙන අමාරුව ගැන මා දන්නවා. ඔය ප්‍රශ්නය ගැන මුළු මහත් ප්‍රදේශයේම ජනයා අප සමග සාකච්ඡා කරනවා. මා ඇමතිතුමාට දොස් කියන්නෙ නැහැ. මේ වතාවේ උසස් අධ්‍යාපන මණ්ඩලය ලකුණු ක්‍රමයක් අනුව විශ්ව විද්‍යාලයට තේරුවා. සමහරුන් විෂයයන් 4 කින් සමත් වෙලත් තේරුණේ නැතිලු. සමහරුන් විෂයයන් 3 කින් සමත් වෙලා තේරුණාලු. ඊ ළඟට අප මේ තත්ත්වය මහජනයාට තෝරා දෙන්නට ඕනෑ. ඔය විධියට කිසිම පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ: එක එක අවුරුද්දේ එක එක විධියට.

තමුන්නාන්සේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් තුළින් මේ රටේ අධ්‍යාපනය ක්‍රමවත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා; මහා විද්‍යාල ඇති කර තිබෙනවා; කණිෂ්ඨ විද්‍යාල ඇති කර තිබෙනවා; 8 වැනි ප්‍රමාණය දක්වා ගියාම ළමයාගේ සහජ දක්ෂතාව උර ගා බලා උසස් අධ්‍යාපනය සඳහා තෝරන්නය කියා වැඩ පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

පිළිවෙළක් යොදා තිබෙනවා. බොහොම හරි. ළමයකුගේ සහජ දක්‍ෂතාව යම්කිසි අවස්ථාවකදී උරගා බලන්නට ඕනෑ. යම්කිසි ළමයකු සහජයෙන්ම කර්මාන්තයට දක්‍ෂතාවක් දක්වනවා නම් ඒ ළමයා ඒ කර්මාන්තය අතේ පිටත් කර යැවීමට අධ්‍යාපනය සකස් විය යුතුයි. එසේ නැත්නම් මේ රටේ දියුණුවක් ඇති වන්නෙ නැහැ; රටට වුවමනා විද්‍යාඥයන් විශේෂඥයන් ඇති වන්නෙ නැහැ. තමුන්නාන්සේ ඒ තත්ත්වය ඇති කරගෙන යනවා. දැන් මොකක්ද වන්නෙ? යම්කිසි විධියකින් ප්‍රජාතන්ත්‍රවාදය අනුව මේ ආණ්ඩුව පරාජය වෙලා 1970 දී වෙනත් ආණ්ඩුවක අධ්‍යාපන ඇමතිවරයකු ඇති වුණොත් මේක වෙනස් වෙනවා. එතකොට මොකක්ද අපේ දරුවන්ට යන කල? ඒ නිසා මේ ආණ්ඩුවෙනුත්, විරුද්ධ පාර්ශ්වයෙනුත් මා ඉල්ලා සිටින්නේ, අධ්‍යාපනය සමග පමණක් සෙල්ලම් කරන්නට එපාය කියායි. කොයි කව්රුන් ආණ්ඩු කළත් අධ්‍යාපනය සම්බන්ධයෙන් දීර්ඝ කාලීන එක්සත් වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. එතකොට අපේ දරුවන්ව අප මොන මාර්ගයේ යවනවාද යන්න ගැන අපට හොඳ අවබෝධයක් ඇතිව සිටින්නට පුළුවන්.

එදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ කාලයේදී අධ්‍යාපනය තිබුණේ ඉංග්‍රීසියෙන් තමයි. නමුත් ඒ කාලයේදී කේම්බ්‍රිජ් සීනියර් ලැටින් සමග සමත් වුණොම නීති විද්‍යාලයට යන්නට පුළුවන්. ඒ වගේ පැහැදිලි තත්ත්වයක් තිබුණා. දැන් නීති විද්‍යාලයට ඇතුළු කිරීමට ඉංග්‍රීසියෙන් මොන විධියේ සාමාර්ථ්‍යයක් වුවමනාද කියා මා මන්ත්‍රීවරයකුගෙන් ඇහුවා. ඒක මා දන්නෙත් නැහැ. ඉංග්‍රීසිවලින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් තිබුණොම ඇත කියා සමහරුන් කියනවා. සම්මාන සාමාර්ථ්‍යයක් වුවමනාය කියා සමහරුන් කියනවා. ඔය විධියේ තත්ත්වයක් අද තිබෙන්නේ. එයින් පහර වදින්නේ අපේ දරුවන්ටයි. දරුවන්ට පහර වදින විට අන්තිමේදී ඒ පහර වදින්නේ මුළු රටටමයි.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මේ රටේ යම්කිසි අධ්‍යාපන ක්‍රමයක් ඇති කළා නම් ඒ අධ්‍යාපන ක්‍රමය තුළින් යම්කිසි පිරිසක් මේ රටේ ඇති වුණා. ඔය ඉන්නෙ ගරු ඩඩ්ලි සේනානායක. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කාලයේ අධ්‍යාපනය ලැබූ කෙනෙක්. අද ඔහු අපේ අගමැතිතුමා. ඔහු ලැබුවේ ඉංග්‍රීසි අධ්‍යාපනයයි. එහි වරදක් තිබෙනවාද? ඒ වාගේම මේ පැත්තෙත් එවැනි අය සිටිනවා. අපේ නායකයා, අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) තවත් එවැනි කෙනෙක්. මා කියන්නේ එදා එක්තරා අධ්‍යාපන ක්‍රමයක් තිබුණු බවයි. දෙමව්පියන් කවුරුත් දන්නා අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. නමුත් අද මොකක්ද තත්ත්වය? තමන්ගේ දරුවන් කුමන ආකාරයකට, කුමන වැඩ පිළිවෙළක් අනුව කුමන මාර්ගයක පිටත් කරනවාද කියා අද ලංකාවේ කිසිම කෙනෙකුට ස්ථිර නිගමනයකට බසින්නට පුළුවන්කමක් තිබෙනවාද? නැහැ. ඊරක් මහා විද්‍යාල ඇති කළා. ඒ මහා විද්‍යාල තුළින් විශ්ව විද්‍යාලයට පිටත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කළා. ඊළඟට දැන් මේ ඇමතිතුමා ආවා. එතුමා ආරම්භයේ සිටම ජාතික අධ්‍යාපන ක්‍රමය තව තවත් ක්‍රමවත් කිරීමට කටයුතු කරනවා. 8 වන ශ්‍රේණිය දක්වා අවුත් එතැනදී සහජ දක්‍ෂතාවයන් අනුව උසස් අධ්‍යාපනය දෙන වැඩ පිළිවෙළක් එතුමා ආරම්භ කර කර තිබෙනවා. ඊළඟට තවත් කෙනෙකු අධ්‍යාපන ඇමති පදවියට පත් වුණොම ඒ වැඩ පිළිවෙළත් වෙනස් වෙනවා. මොකක්ද මේකෙ තේරුම? අවුරුදු සියයක් දැන් ගතවී තිබෙනවා. කවදාද අපි මේක හරි ගස්සන්නෙ? එමනිසා ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පක්ෂයේත් සියලු දෙනාම එකතු වී ලංකාවේ අනාගත පරම්පරාවට ආදරයක් තිබෙනවා නම්, මේ රටේ වගකීම භාර ගන්නට සුදුසු අනාගත පරපුරක් බිහි කිරීමට නම් වරින් වර වෙනස් නොවන හොඳ අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ ඇති කිරීමට මේ සියවස් උළෙලේදීවත් පියවරක් ගන්නවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

**ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා.** (පැල්මඩුල්ල)
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දිනවල අයවැය ලේඛන කාරක සභා අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණා. ඒ අවස්ථාවේදී විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත්, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් ඉතාම ශාන්තව—

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව යටතේ වරක් කථා කර තිබෙනවා.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

නැහැ. අධ්‍යාපන "සියවස" ගැන මා කථා කළේ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

හැන්සාඩ් වාර්තාවෙන් බලා ගන්නට පුළුවනි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committees)

ඔව්. ජූලි 29 වන දින අ. භා. 6.30 ට තමුන්නාන්සේ මේ යෝජනාව යටතේ කථා කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඇයි මන්ත්‍රීතුමනි, මෙහෙම අමතකවීම් වෙන්නෙ ?

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

දහසක් වැඩ තියෙන කොට මෙහෙම අමතකවීම් වෙනව.

අ. භා. 6.15

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(Th Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාදයට ඇහුම්කන් දුන් මට එහි කනගාටුදායක තත්ත්වය මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්නට සිදුවීම ඇත්ත වශයෙන්ම වේදනාසහගතයි. කාරණයට අදාළ දේත්, අදාළ නොවන දේත් කථා කළා පමණක් නොව, දෙවරක් කථා කිරීමටත් සමහර මන්ත්‍රීවරුන් උත්සාහ කළා. එක් වරක් මේ කාරණය කල් දැමීමට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කතිකාකරගෙන සියලු දෙනාම මේ සභා ගර්භයෙන් පිට වී ගොස් සිටි අතර, ඊළඟට රැස්වීමේ වැඩ කටයුතු කරගෙන යෑමට වුවමනා කරන ගණපූරණය නොමැති බව එක් ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා. එයින් ඒ තරම් විශාල වෙනසක් ඇති වුණේ නැහැ. හොඳ වෙලාවට අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම වාගේ එහා පැත්තේ සිටි නිසා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරගෙන යන්නට අපට පුළුවන් වුණා. මේ තරම් ගරු සභාවක, ලංකාවේ මහජනතාව නියෝජනය කරමින්, මහජනතාව වෙනුවෙන් මන්ත්‍රීවරුන් වශයෙන් මේ ගරු සභාවේ පෙනී සිටින අප තමන්ට අවාසි වන ප්‍රශ්නයකදී හෝ වාසි වන ප්‍රශ්නයකදී මහජනයා වෙනුවෙන් ඉටු විය යුතු යුතුකම නියෝජිතයන් වශයෙන් ඉටු නොකොට මේ පාර්ලිමේන්තුව විහිළුවකට භාජන කිරීම ඉතාමත් කනගාටුදායකයි.

ඊයේ විශ්ව විද්‍යාලයේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඊට පෙර කියන ලද කරුණු පවා නැවත නැවතත් පුනපුනා කථා කිරීම ගැන මා කනගාටු වෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමා කෙරෙහි මා තුළ ගෞරවයක් තිබෙනවා. එහෙත් ඒ ගෞරවය ටිකක් පළුදු වී ගියා මේ හේතුවෙන්. ඒ කොයි හැටි වෙතත්, එතුමා කෙරෙහි මගේ ගෞරවය සම්පූර්ණයෙන් නැති නොවූ බව කියන්නට කැමතියි. එසේ කියන්නට පුළුවන්වීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ විවාදයේදී, කාරණයට ගැළපෙන පරිද්දෙන් හෝ මේ තරම් වැද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ගත් ජාතික ප්‍රශ්නයක් මධ්‍යස්ථව ජාතියේ පොදු යහපත සඳහා කථා කළ එකම ගරු මන්ත්‍රීවරයා කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) බව සන්තෝෂයෙන් සඳහන් කරන්නට කැමතියි. තමන්ගේ අඩුපාඩුකම් පිරිමසා ගැනීමට හැම විටම වාගේ අනුන් හෙළා දැකීමට උත්සාහ කරමින් තමාම හෙළා දකින හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) මේ අවස්ථාවේ මෙතන නොසිටීම ගැනත් මා කනගාටු වෙනවා. එතුමා ගැනත් වචනයක් දෙකක් කියන්නට සිතා සිටි නිසයි මා එසේ කියන්නේ. එතුමා නැති නිසා ඒ ගැන සඳහන් කරන්නට අදහස් කරන්නේ නැහැ.

මේ ගරු සභාව නොමග යැවීමේ අදහසින් මෙහිදී කථා කළ තවත් ගරු මන්ත්‍රීවරයෙක් ඉන්නවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ගැනයි මා එසේ කිව්වේ. එතුමා ගැනත් මා කනගාටු වෙනවා. උන්නැහේ මෙහිදී පෞද්ගලික කාරණයක් හුවා දැක්වුවා. අභගෙන ඉන්න අයට එහිදී වැටහුණේ අමාත්‍යවරයකු වශයෙන් මා මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරයකුට නොසැලකූ වගයි. මාතර රාහුල මහා විද්‍යාලයේදී පැවැත්වුණු උත්සවයකදී ඒ ගරු මන්ත්‍රීතුමාට කථා කිරීමට මා අවස්ථාවක් නොදුන් බවත්, එය ඉතාමත් කනගාටුදායක කාරණයක් බවත් එතුමා පැවසුවා. ඊට පිළිතුරක් දිය යුතුව තිබෙනවා. මෙවැනි උසස් විද්‍යායතනවල වාර්ෂික රැස්වීම්වලදී න්‍යාය පත්‍රය සකස් කිරීමේ දී කෙරෙන්නේ ප්‍රධාන වශයෙන්ම විදුහල්පතිතුමාගේ පිළිගැනීමේ කථාව සහ වාර්තාව කියවීමයි. ඊට පසු ප්‍රධාන අමුත්තාගේ කථාවයි. ඊළඟට ස්තුති කථාව කෙරෙනවා. අපේ ගරු අගමැතිතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් නාලන්ද මහා විද්‍යාලයට පැමිණි අවස්ථාව මට මතකයි. මාත් ඒ රැස්වීමට පැමිණ සිටියා. එහිදී අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන්වත් මට කථාවක් කරන්නට අවස්ථාවක් තිබුණේ නැහැ. මා එහි ආදි ශිෂ්‍යයකු වශයෙන් සැලකෙන නිසා ස්තුති කථාව මට පැවරූ බව මේ අවස්ථාවේ කියන්නට සතුටුයි. එදා රාහුල මහා විද්‍යාලයේ පැවැත්වුණු වාර්ෂික මහා සභා රැස්වීමේදී මාතර ගරු මන්ත්‍රීතුමා පසුපස ආසනයක සිටිද්දී එතුමා මා ළඟට කැඳවා මා ළඟ ආසනයක් පනවා එතුමාට වාඩි වන්නට මා එදා සැලැස්සුවා. රැස්වීමේ න්‍යාය පත්‍රයේ හැටියට ඒ මන්ත්‍රීතුමාට කථාවක් කිරීමට නැති බවත් එය ඒ රැස්වීමේ සම්ප්‍රදායට එකඟ බවත් එහෙත් අවශ්‍ය නම් කථා කරන්නට පුළුවන් බවත් මා ඒ වෙලාවේ එතුමාට කිව්වා. එහෙත් ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා කථා කරන්නට වුවමනාවක් නැහැ කියා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණු පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. කථාවක් කරනවාද නැද්ද කියා ගරු අධ්‍යාපන ඇමතිතුමා මගෙන් ඇසුවා. එය ඇත්ත. එවිට මා කීවා එය සංවිධායක සභාවේ අදහසයි කියා. කථාවක් ඉල්ලන්නට මට වුවමනාවක් නැහැ. සංවිධායක සභාවේ කැමැත්තක් තිබෙනවා නම් මට කථාවක් කරන්නත් පුළුවන් නැත්නම් නිකම් ඉන්නත් පුළුවන්ය කියා මා කීවා. ඒකයි නියම තත්ත්වය.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(Th Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමා කලින් කීවේ නියම තත්ත්වය නොවෙයිනේ. සංවිධායක සභාවේ න්‍යාය පත්‍රය තිබුණේත් එහෙමයි; සම්ප්‍රදායත් ඒකයි.

මෙතන උගතුන් වශයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීපදෙනෙක් හිටියත් උගතෙක් වශයෙන් කථා කළේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) පමණයි. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කථා කළේ මා එතුමාට නොසැලකුවාය කියන හැඟීම දී මේ ගරු සභාවත් ගැලරියේ සිටින සියලුදෙනාත් නොමඟ යවන පරිද්දෙනුයි. ඒ රැස්වීමේ පසුපස ආසනයක සිටි මාතර මන්ත්‍රීතුමා මා විසින් ඉදිරියට කැඳවා මගේ ආසනයට කෙලින් ආසනයක් ලබා දී එතුමාටත් සමානව සලකා න්‍යාය පත්‍රයේ හැටියටත් සම්ප්‍රදායේ හැටියටත් එතුමාට කථාවක් නොතිබුණත් වුවමනා නම් කථා කරන්න පුළුවන්ය කියා මා එතුමාට කීවා. එවිට මාතර ගරු මන්ත්‍රීතුමා වුවමනා නැතෙයි කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒකයි තත්ත්වය. ඒ නිසා එතුමාගේ කථාව ගැන මා කණගාටු වෙනවා. මාතර මන්ත්‍රීතුමා ප්‍රකෘති වශයෙන් හොඳ පුද්ගලයෙක්. එහෙත් කොමියුනිස්ට්කාරයෙක්.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කඹුරුපිටියේ මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) කොමියුනිස්ට්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ තරමටම නරක් වී නැහැ.

මේ කරුණ ගැන සමස්ත අධ්‍යාපන මණ්ඩලයම පිළිබඳව අයන්නේ සිට ඈයන්න දක්වා සියලුම දේ මෙහිදී විග්‍රහ කර දක්වන ලද්දේ සියවස උත්සවය පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයේ කැමැත්ත අනුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුවයි. මේ කළ කථා සියල්ලක්ම මීට පෙරත් ළඟ ළඟම කර ඇති බව ගරු මන්ත්‍රීවරුන්ට මතක ඇති. අද මම තවත් කරුණක් කියන්නම්. විශ්ව විද්‍යාල පිළිබඳව අතිරේක වැය සටහනක් ළඟදී ඉදිරිපත් වීමට තිබෙනවා. හොඳට මතක තබා ගන්න මේ අද කී දේවල්ම නැවත නැවතත් එහිදීත් කියන බවට කිසිම සැකයක් නැහැ. මේ ගරු සභාවේ කාලය මේ අන්දමට ගත කිරීම රට වෙනුවෙන් මෙහි පෙනී සිටින මන්ත්‍රීවරුන්ට තරම් නොවෙයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනය ගැනත් එය ක්‍රියාත්මක වූ ආකාරයත් ජාතික අධ්‍යාපනයට මුලපිරූ හැටිත් පිළිබඳව සම්පූර්ණයෙන්ම වැරදි ඉතිහාසයක් ගෙනහැර පා තමන්ට සම්පූර්ණයෙන්ම අහිමි ගෞරවයක් ලබාගැනීමට දැරූ ඒ උත්සාහය මහා මැතිවරණ දේශපාලන සභාවකදී කළා නම් කමක් නැහැ. එහෙත් හැන්සාඩ් වාර්තාවේ සටහන් වීම පිණිස මෙහිදී ඒවා කීම ගරු මන්ත්‍රීවරුනට තරම් නොවෙයි. නිදහස් අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය අවුරුදු 23ක් නැත්නම් 24 ක් තරම් පැරණි එකක්. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදී එහි සිටි මන්ත්‍රීවරුන්ගේ සාකච්ඡාවක් අනුව එවකට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටි පසුව එක්සත් ජාතික පක්ෂයේ මූලික සාමාජිකයකු වූ කන්නන්ගර ඇමතිතුමා විසින් නිදහස් අධ්‍යාපනය ව්‍යවස්ථාගත කළේ 1945 දීයි. 1946 සිට ලංකාවේ නොයෙක් ප්‍රදේශවල නොයෙක් ආසනවල මධ්‍ය මහා විද්‍යාල ඇති කළා. මේ රටේ මුදල් තත්ත්වය අනුව නිදහස් අධ්‍යාපන ක්‍රමය ව්‍යවස්ථාගත වූ වහාම ලංකාව මුළුල්ලේම මධ්‍ය මහා විද්‍යාල ඇති කරන්නට පුළුවන් කමක් තිබුණේ නැහැ. මේ රටේ තබා ධනවත් යයි කියන රටවලවත් එය වහාම කරන්නට පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසා එය දියුණු කළේ ක්‍රම ක්‍රමයෙන්. කන්නන්ගර ඇමතිතුමාගේ කාලයේ ගම්බද ළමයින්ට ඉගෙනගන්නට බැරි වුණාය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) කීවා. එය සම්පූර්ණ මිථ්‍යාවක්. අපේ පළාතත් ගම්බද පළාතක්. එවකට මා සිටියේත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙක් වශයෙනුයි. එමෙන්ම පළමුවැනි පාර්ලිමේන්තුව කාලයේදී විරුද්ධ පාර්ශ්වයේ සිටගෙන එවකට සිටි අගමැතිතුමා ඉතා තදින් විවේචනය කළ පුද්ගලයෙක් තමයි මම. එහෙත් ලංකාවේ විශාලම මධ්‍ය මහා විද්‍යාලය කුලියාපිටියට ලැබුණා. ගරු අගමැතිතුමාමයි එහි ගොස් එය විවෘත කළේ. ඒ හේතුවෙන්, අධ්‍යාපන ඇමති නුගවෙල මහතාගේ කාලයේදී මගේ කොට්ඨාශය අවට ප්‍රදේශවල සියගණන් මහා විද්‍යාල ඇති වුණා. දහනායක මහත්මයා අධ්‍යාපන ඇමතිව සිටි කාලයේදී ගොඩනැගිලි හැදූ බව සමහර ගරු මන්ත්‍රීවරුන් කිව්වා. මා ඒ කීම පිළිගන්නවා. එහෙත්, නුගවෙල ඇමතිතුමාගේ කාලයේදීත් බණ්ඩා ඇමතිතුමාගේ කාලයේදීත් තරම් විශාල ගොඩනැගිලි අන් කවර කාලයකවත් ඉදි වුණේ නැහැ. එවැනි ගොඩනැගිලි හදන්නට මටත් තවම බැරි වුණා.

ස්වභාෂා මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය දීමට මුල පිරුවෝ 1956 න් පසුව ආ ඇමතිවරුයයි කීමත් සම්පූර්ණයෙන්ම මිථ්‍යාවක්. ඒ පිළිබඳ සම්පූර්ණ ගෞරවය ලැබිය යුත්තේ බණ්ඩා ඇමතිතුමායි. කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන් අතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

පවා මේ පිළිබඳ නොයෙක් මතභේද ඇති වී තිබියදී, ඇමති ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියවිල්ල පවා ඉදිරිපත් කරන්නට සූදානම්ව ප්‍රශ්නය පිළිබඳව දරුණු තර්කයක් කොට, ප්‍රාථමික අංශයේ පටන් විශ්ව විද්‍යාලය දක්වා අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම ස්වභාෂාවෙන් කළ යුතුය යන කැබිනට් තීරණය එදා ලබා ගත්තේ එවකට සිටි අධ්‍යාපන ඇමති බණ්ඩා මහතායි. ඊට පසු වෙනත් අයත් ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන ගිය බව ඇත්ත. එහෙත්, දිය යුතු තැනට ඒ ගෞරවය නොදී කොළේ වසා කථා කිරීම මන්ත්‍රීවරුනට තරම් නොවෙයි. නිදහස් අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යයෙන් ලැබීමේ වරප්‍රසාදය මේ රටේ දරුවනට ලැබුණේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේ දීයයි තමුන්නාන්සේලා කිව්වා. බණ්ඩාරනායක මහත්මයාට අප ගෞරව කරනවා. එහෙත් මේ කාරණය සිද්ධ වුණේ එතුමාගේ කාලයේදී නම් නොවෙයි. ස්වභාෂා මාධ්‍යය අවුරුද්දෙන් අවුරුද්ද පුළුල් කරගෙන ගොස් 1968 වන විට විශ්ව විද්‍යාල අධ්‍යාපනයත් සම්පූර්ණයෙන්ම ස්වභාෂාවෙන් කළ යුතුය යන තීරණය ගත්තේ එවකට අධ්‍යාපන ඇමතිව සිටි බණ්ඩා මහතායි. බණ්ඩාරනායක අගමැතිතුමාවත් වෙනත් ඇමතිවරුන්වත් නොවෙයි. එපමණක් නොවෙයි. අධ්‍යාපන කටයුතු ඉතා හොඳින් සිදු වුණායයි තමුන්නාන්සේලා කියන කාලයේදී තමයි මේ රටේ අධ්‍යාපනය අවුලෙන් අවුලට පත් වුණේ. තවමත් ඒ අවුල ලිහා ගන්නට බැරිව මා දඟලනවා. අප බලයට එන්නට පෙර බලයෙහි සිටි බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව 1962 දී ආගමික ආයතන මඟින් පාලනය කරගෙන යන ලද පෞද්ගලික පාඨශාලා සමහරක් රජයේ පාඨශාලා බවට පත් කළා. එහෙත්, දැන් පෞද්ගලික පාඨශාලා සියල්ලම රජයට නොගැනීම ගැන එතුමන්ලා මට චෝදනා කරනවා. ඇයි තමුන්නාන්සේලා ඒවා නොගත්තේ ?

විශ්ව විද්‍යාල අධ්‍යාපනය නරක බව දැක්වීමට එක් ගරු මන්ත්‍රීවරයකු වාර්තාවක් ඉදිරිපත් කරමින් කොහේදෝ මහාචාර්යවරයකුගේ ප්‍රකාශයක් තිබෙව්වා. එය කුමන අවුරුද්දේ පළ වුණු වාර්තාවක්දැයි මා ඒ මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කළා. එය 1964 වාර්තාවක් බව කියන්නට එතුමාට සිදු වුණා. මුළු සභාවම මිථ්‍යාවෙන් රවටීම සඳහා ආත්ම ගෞරවයක් නැතිව කථා කළ හබරාදුවේ ගරු මන්ත්‍රීතුමාගේ (ප්‍රින්ස් ගුණසේකර මයා.) ඒ මිථ්‍යාව අත්පිටම හෙළි වුණා.

මේ රටේ අධ්‍යාපන ප්‍රශ්නය පක්ෂ භජනයෙන් විසඳිය යුතු ප්‍රශ්නයක් නොවන බව කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) ප්‍රකාශ කළා. එය සම්පූර්ණ ඇත්තක්. අධ්‍යාපන ප්‍රශ්නය ජාතියේ වැදගත්ම ප්‍රශ්නයයි; ජාතියේ සකලම අනාගත පරම්පරාව කෙරෙහි බලපාන ප්‍රශ්නයයි. එම නිසා, තාවකාලික දේශපාලන වාසි ලබා ගැනීම සඳහා කෙනකුට අහිමි ගෞරවයක් පවරන්නටත් තවත් කෙනකුට හිමි ගෞරවය නොදී හරින්නටත් කටයුතු කිරීමේ තේරුම කුමක්දැයි මට තේරෙන්නේ නැහැ.

පාසල්, ගුරු මණ්ඩල, ගුරුවරුන්ට අවශ්‍ය නිදහස නොලැබීම ඇතුළු තවත් බොහෝ දේ ගැන ගරු මන්ත්‍රීවරුන් කථා කළා. සමාජවාදී රටවල ගුරුවරුන් හා අධ්‍යාපන කටයුතු ගැනත් සමහර මන්ත්‍රීවරුන් කථා කළා. සමාජවාදී රටවල් ගැන කථා නොකර සිටිනවා නම් මා එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මන්ද ? සමාජවාදී රටවල ගුරුවරුන්ට තිබෙන නිදහස කුමක්දැයි මා දන්නා නිසා, ඒවා මෙහි ඇද දක්වන්නට මටත් හිතෙනවා. රුසියාවේ කිසියම් ගුරුවරයකු කොසිජින්ට හෝ රුසියාවේ ආණ්ඩුවට හෝ විරුද්ධව එක වචනයක් කීවොත් පැය 24 ක් ඇතුළත ඒ ගුරුවරයාගේ මළකඳ කොහේ තිබේදැයි කියන්නට තමුන්නාන්සේලාට පුළුවන්ද ? වේදිකාවට නැගී තම ඇමතිවරයා හෝ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ හෙළාදැකීම ගුරුවරයකුට තරම් නොවන නමුත්, එය නොපනත්කමක් නමුත්, එසේ කිරීමේ නිදහස පවා මේ රටේ වෘත්තීය සමිතිවල ගුරුවරුනට තිබෙනවා. යම් වරදක් සිදු වී ඇත්නම්, අධ්‍යාපන ඇමතිවරයා හෝ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ හමු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔහු සමග සාකච්ඡා කොට, වරද හෙළි කරවා ඒ පිළිබඳ කරුණු සසඳා පහදා වටහා දී එය නිවැරදි කර ගන්නවා මිස වෛදිකාංගනව බෙදිදෙන් මෙන් කෑගස මින් ඇමතිවරයා හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන් හෝ හෙළාදැකීම මොන ගුරු ප්‍රතිපත්තියක්දැයි මා අහනවා. මේ ප්‍රති පත්තිය, ඒ මන්ත්‍රීතුමාගේ සමාජවාදී රටවල තිබෙනවාදැයි මා අහන්න කැමැතියි. මහ ලොකුවට සමාජවාදී රටවල් ගැන කථා කරනවා. චෙකෝස්ලෝවැකියාවේ මිනිසුන්ට—ගුරුවරුන්ට නොවෙයි—තමන්ගේ ආණ්ඩුව විසින් දෙන ලද නිදහස ඒ වූ පරිද්දෙන් පරිහරණය කිරීමට, ඒ මන්ත්‍රීතුමාගේ මහ ලොකු සමාජවාදී රට ඉඩ දුන්නාදැයි මා අහනවා. දන්නේ නැති දේවල් කථා නොකර කට වහගෙන ඉන්න ඕනෑ. නොදන්නා දේවල් කථා කර, නිකම් පල් වෙනවා.

ශිෂ්‍ය සංගමය ගැන හබරාදුවේ ගරු මන්ත්‍රීතුමාටත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) තවත් මන්ත්‍රීවරුන් කීප දෙනකුටත් ලොකු කැක්කුමක් තිබෙනවා. බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය යන නාමේ මුවාවෙන්, සමහර මන්ත්‍රීවරුන් ගේ හා විශ්ව විද්‍යාලවල ඉන්නා වාමාංශික ගුරුවරුන්ගේත් අනුදැනුම ඇතිව, වෙනත් රටවල ශිෂ්‍යයන් මෙන් මේ රටේ ගැටවර ශිෂ්‍යයනුත් නොමග යැවීම සඳහා දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් ආරම්භ කර කටයුතු කරගෙන ගියා, අපත් රවටා අපේම මුදල් වියදම් කරමින්. එය දේශපාලන ව්‍යාපාරයක්. රජයේ ප්‍රතිපත්ති යට පක්ෂ හෝ වේවා විපක්ෂ හෝ වේවා, එවැනි දේශපාලන ව්‍යාපාර ශිෂ්‍යයන් ලවා නොකරවීමට මා හිතට ගත් බව ඇත්ත.

ජාතික ශිෂ්‍ය සංගමය ගැනත් කීවා. ළඟදී මහනුවර පැවැත්වුණු ඇසළ පෙරහැර මා දුටුවා. කොමියුනිස්ට් ව්‍යාපාරය විසින් පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් කීපදෙනකු මෙහෙයවා, හැම වන්දනාකාරයකු අතටම එක්තරා පත්‍රිකාවක් බෙදා දුන් බවත් මා දන්නවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අසහනයකින් පෙළෙන බවත්, විශ්ව විද්‍යාලවලින් පිට වන ශිෂ්‍යයන්ට—උපාධිධාරීන්ට—රැකී රක්ෂා නොමැතිව අතරමං වන නට සිදුව තිබීම ගැන මේ ආණ්ඩුව වගකිවයුතු බවත්, එම නිසා කොමියුනිස්ට් චීනය හා කොමියුනිස්ට් රුසියාව වැනි රටවල පවත්නා ක්‍රමය අනුව මේ රටේත් ආණ්ඩු ක්‍රමය සකස් කළ යුතු බවත් දැක්වෙන එවැනි පත්‍රිකා රජයේ මුදල්වලින්ම මුද්‍රණය නොට බෙදා හරින්නට ඉස්සර පුළුවන්කම තිබුණාට, ඒවායින් රටුනා රවටන්නටත්, අපේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් එවැනි කැත කුණුවලින් අපිරිසිදු කිරීමට හා නොමග යැවීමටත් දැන් නම් ඉඩ නොදෙන බවත් මා කියන්න කැමතියි.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අසහනයෙන් පෙළෙනවාලු ! මේ අවුරුදු තුන තුළ හුඟ දෙනෙක් විශ්ව විද්‍යාලවලින් පිට වුණාලු ! ඒ උපාධිධාරීන්ට රැකීරක්ෂා නැතිලු ! වගකීමෙන් තොර ප්‍රවෘත්ති පත්‍රවල ශීර්ෂ පාඨවලින් දැක්වෙන ප්‍රවෘත්ති කියෑවූ තරමින් ඒවා ඇත්ත යයි පිළිගන්නා ලෝකයාට, අර කියන දේවලුත් ඇත්ත වන්න පුළුවනි. එහෙත් පසුගිය තුන් අවුරුද්ද ඇතුළත විශ්ව විද්‍යාලවලින් පිට වුණු උපාධිධාරීන් සම්බන්ධයෙන්, මේ ජාතික රජය හෝ අධ්‍යාපන අමාත්‍යවරයා හෝ සම්පූර්ණයෙන් වගකිවයුතු දැයි මා තමුන්නාන්සේලාගෙන් අහනවා. කාගේ වරදින්ද, මේවා සිදු වූයේ ? නොමඟ යැව්වේ කවුද ? හිටපු අධ්‍යාපන අමාත්‍යවරයකුත් දැන් මෙතැන ඉන්නවා. විශ්ව විද්‍යාලවල කලා අංශයෙන් පිට වන්නන්ට රැකීරක්ෂා සැපයීම සඳහා එතුමන්ලා සකස් කළ වැඩ පිළිවෙළ මොකක්දැයි මා අහනවා.

**පී. බී. ජී. කළුගල්ල මයා.** (කෑගල්ල)
*(திரு. பீ. பி. ஜி. கலுகல்ல—கேகாலை)*
(Mr. P. B. G. Kalugalla—Kegalla)
ඔක්කෝටම රැකීරක්ෂා දුන්නා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මන්ත්‍රීතුමා කථා කරන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේගේ කථා මා අසා තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
ඔක්කෝටම රැකිරක්ෂා දුන්නා. නිකම් බොරු කියන්න එපා. [බාධාකිරීම්]

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
තමුන්නාන්සේ රැකිරක්ෂා දුන් හැටි මා දන්නවා. කරුණාකර වාඩි වන්න. [බාධාකිරීම්]

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
ඔක්කෝටම දුන්නා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
සමහරකුට රු. 12 වන තුරුත් දුන් හැටි මා දන්නවා. [බාධාකිරීම්] මගේ කට අවුස්සා ගන්නේ නැතිව නිකම් ඉන්න.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
මටත් කටක් තිබෙනවා. [බාධාකිරීම්]

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
විශ්ව විද්‍යාලවලින් පිට වුණු උපාධිධාරීන් දාහකට දෙදාහකට රැකිරක්ෂා දීමේත්, අට දාහකට රැකිරක්ෂා සැපයීමේත් වෙනසක් තිබෙනවා. ඒ කාලයේ උසස් පන්තිවල ශිෂ්‍යයන්ට ඉගැන්වීම සඳහා උපාධිධාරීන් නැතිව, පිරිවෙන්වල පණ්ඩිත විභාගය සමත් වුණු උදවිය පවා ඒ සඳහා යොදවා ගන්න සිදු වුණා. ඒත් මදිව, සිංහල පාඨශාලා ගුරුවරුන්ට එක විශ්ව විද්‍යාලයක ශිෂ්‍යත්ව සියය ගණනේ දී ඔවුන් උපාධිධාරීන් කරවා ගත්තා, දහනායක අධ්‍යාපන ඇමතිතුමා. අද තත්ත්වයත් එයමද? කිසිම සෝදිසියක් නොකර තමුන්නාසේලා පැළැස්තර දමමින, දැනට අවුරුදු සියයක් වන බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී අධ්‍යාපන ක්‍රමය ඒ වූ පරිද්දෙනම පවත්වාගෙන ගිය නිසා; දේශපාලන වාසි ලබා ගැනීම සඳහා ගුරුවරුන් නොයෙකුත් දේවලට පෙළඹුවා විනා, ළමයින් විනාශ කළා විනා, ඒ ළමයින්ගේ අනාගතය කුමක් වේදැයි කිසිම විභාගයක්, පරීක්ෂණයක් නොකොට අර කසිකබල් අධ්‍යාපන ක්‍රමයම පවත්වාගෙන ගිය නිසා; දැන් විශ්ව විද්‍යාලවලින් දහස් ගණන් උපාධිධාරීන් පිට වෙනවා. ඔවුන්ට පුළුවන් උගන්වන්නට විතරයි. හැබැයි, සමහරුනට නම් "නෝට්ස්" අරගෙන ගියත් හරියට උගන්වන්නට බැහැ. හොඳයි, ඉතින් අර එදා තුබුණු තත්ත්වයයි, දැන් මෙදා තිබෙන තත්ත්වයයි එකද? මේ කාරණය අවබෝධ කර ගැනීමේ ශක්තියක් නැද්ද? එදා විශ්ව විද්‍යාලයෙන් පිට වුණේ 500යි; නැත්නම් 600 යි. එහෙත් දැන් අවුරුද්දකට 3,000ක්, 4,000 ක්, 5,000 ක් පිට වන බව දන්නේ නැද්ද? එදා තුබුණු පාඨශාලා ගණනමයි, අදත් තිබෙන්නේ. අදත් තිබෙන්නේ පාඨශාලා 10,000 යි. ඒ පාඨශාලාවලට වුව මනා කරන උපාධිධාරීන් සියලු දෙනාගේම පුරප්පාඩු දැන් පුරවා ඉවරයි. මීට පසුව අවුරුදු පතා විශ්‍රාම ගැනීම් හා වෙනත් හේතූන් නිසා ඇති වන පුරප්පාඩුවලට පත් කරනවා හැර, මේ විශ්ව විද්‍යාලවලින් පිට වන සියලුම උපාධිධාරීන්ට පාඨශාලාවල කොහොම පත් වීම් දෙන්නටද?

මේ තරුණ පිරිස ගැන අප කනගාටු වෙනවා. මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ අපේ වරදකින් නොවන බව පිළිගත යුතුයි. එදා තුබුණු ක්‍රමය අප වෙනස් කෙළේ 1968 ජනවාරි මාසයේ 4 වැනිදායි. එදා සිට වුවද සියලු දෙනාටම ඒ අලුත් ක්‍රමය අනුව ඉගෙන ගැනීමේ වරප්‍රසාද නැහැ. 8 වැනි පංක්තියෙන් ඉහළ සැම ළමයකුම තව මත් ඉගෙන ගන්නේ පරණ ක්‍රමය අනුවයි. 7 වැනි පංක්තිය දක්වා ඇති පංක්තිවල සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවනට පමණයි, අලුත් ක්‍රමය අනුව ඉගෙන ගන්නට පුළුවන් වන්නේ. මේ අලුත් ක්‍රමයෙන් සැලසෙන ප්‍රයෝජනය ලබා ගන්නට තව අවුරුදු පහක් හයක් ගත වේවි. ඒ වන තුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාගේ මේ අධිරාජ්‍යවාදී අධ්‍යාපන ක්‍රමය අනුව ඉගෙන ගන්නා අය තව තවත් සමාජයට ඒවි. ඇත්තෙන්ම මේ තත්ත්වයට අප කවුරුනුත් වග කිව යුතුයි. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කිවාක් මෙන් අප මේ කාරණය ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා විසඳිය යුතුයි. කවුරුනුත් එකතු වී ඒ ප්‍රශ්නය ඒ විධියට විසඳනවා විනා එය අපට විරුද්ධව චෝදනාවක් එල්ල කිරීමට කාරණයක් කර ගැනීම මන්ත්‍රීවරුන්ට තරම් නොවන බව මා කිව යුතුයි.

මා විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුනට දෙස් කියනවාලු. අරවා කියනවාලු; මේවා කියනවාලු. දෙස් නොකියා පුළුවන්ද? මා ඒ අයට බණිනවාලු. ඒක වැරදියි. මා මහාචාර්යවරුනට බැණපු තැනක් පෙන්වන්නට පුළුවන් නම් මා කනගාටු වෙනවා. ඔය බැන්නා යයි කියන කථාවේ තේරුම මොකක්ද? කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා (කලුගල්ල මයා.) බොරුවක් කීවා යයි මා කීවොත් ඒක බැණුමක්ද? එතුමා බොරුවක් කී නිසයි, මා ඒ බව කිවේ. ඉතින් ඔකත් බැණුමක්ද? ඒ විධියට කල්පනා කරනවා නම් කථා කරන්නට බැහැ නොවැ? අපට චෝදනාවක් එල්ල කිරීම සඳහා 1964 වර්ෂයේ වාර්තාවක් ඉදිරිපත් කිරීම මෙම ගරු සභාවත් මහජනයාත් නොමඟ යැවීමට යෙදූ උපක්‍රමයක් යයි කීම බැණුමක්ද? මේක හරි කථාවක් නොවැ. මේ අධ්‍යාපන ප්‍රශ්නය දේශපාලන වාසි ලබා ගැනීමට යොදා ගත යුතු උපක්‍රමයක් වශයෙන් සලකා මිනිසුන් නොමඟ යැවීමේ ව්‍යාපාරයක යෙදීම කනගාටුදායකයි. අප මේ ප්‍රශ්නය විසඳා ගන්නට ඕනෑ. හැමදාම අපේ අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් විශ්ව විද්‍යාලවලින් පිට වන උපාධිධාරීන් සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක්ද, කවර අන්දමින් ඔවුනට සහනයක් සැලසිය යුතුදැයි සිතා බොහොම කනගාටුවෙන් කියා කරගෙන යනවා. එදා තුබුණු ආණ්ඩුව කළ වරදට කර ගසන්නට සිදු වුණේ අපටයි. ඉතින් තමුන්නාන්සේලා එය අපට විරුද්ධව එල්ල කරන චෝදනාවක් වශයෙන් සලකා ක්‍රියා කිරීම වැරදියි. ඕනෑම බොරුවක් කියා ඡන්ද ගන්නට පුළුවනැයි තමුන්නාන්සේලා හිතුවත් දැන් සිටින මිනිසුන් ඒ තරම් රැවටෙතැයි මා හිතන්නේ නැහැ. ජාතියේ දරුවන්ගේ අනාගතය පිළිබඳ මේ ඉතාමත්ම වැදගත් ප්‍රශ්නය සම්බන්ධයෙන් එදා කළ වැරද්ද අප විසින් කරන ලද වරදක් හැටියට දක්වා අපට පහර ගැසීම යුතුද? හරිද? සාධාරණද?

දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) මොන මොනවාදෝ අනම්මනම් වගයක් කිවා. මට ඒවා හරියට අහන්නටත් බැරි වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගත වූ තුන් අවුරුද්දේ අධ්‍යාපනය මහා අවුල් ජාලාවක් වුණාලු. අවුල් ජාලාවක්ද වෙන එකක්ද වුණේ කියා මම කියා දෙන්නම්. තමුන්නාන්සේලා අධ්‍යාපනය ගැන විමසීමක් කරනවා යයි මා හිතන්නේ නැහැ. අපි කරන්නේ මොනවාදැයි ඉස්කෝලයකට ගිහින් සොයා බලන්නේ හෝ දෙපාර්තමේන්තුවට ගිහින් විමසා බලන්නේ හෝ නැහැ කියායි, මා හිතන්නේ. තමන්ගේ බලාපොරොත්තු ඉෂ්ට නොවුණු නිසා අධ්‍යාපනය අවුල් ජාලාවකැයි හැමදාම ඝෝෂා කරන පත්‍ර දෙකක් මේ රටේ තිබෙනවා. කෙළින්ම කියන එක යුතුකම නිසා නම කියලම කියන්නම්. "ටයිම්ස්" පත්‍රය කියා එකක් තිබෙනවා, ඒ පත්‍රය අධ්‍යාපනය ගැනත්, මේ අමාත්‍ය මණ්ඩලය ගැනත් ලියන ලියන සෑම එකම වැරදියි. යම්කිසි පෞද්ගලික බලාපොරොත්තුවක් ඉෂ්ට නොවීමෙන් ඇතිවුණු චිත්ත වේදනාවක් නිසා අපේ ඇමතිවරුන් ඔවුන්ට පෙන්වන්නට බැහැ. අනික් පත්‍රය—

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
"ඩේලි මිරර්"

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
—"ඩේලි මිරර්". ඒ පත්‍රයටත් මොනවා වෙලාද මා දන්නෙ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
තමුන්නාන්සේලාගේ නුවරඑළියේ මන්ත්‍රීතුමා (රණවීර මයා.) ඒ සමාගමේ අධ්‍යක්ෂක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක මම දන්නේ නැහැ. "අධ්‍යාපනය අවුල් ජාලාවක්; අධ්‍යාපනය අවුල් ජාලාවක්" කියමින් හැමදාම ලියනවා. අවුල් ජාලාවක්ව තිබුණු හැටි මම කියන්නම්. මා ඇමති පදවියට පත්වන අවස්ථාවේ නම් අධ්‍යාපනය අවුල් ජාලාවක්ව තිබුණු බව ඇත්ත. ඒ කාලයේ ඒ ඒ ශ්‍රේණි අනුව ගුරුවරුන් මහා විද්‍යාලවලට හෝ කණිෂ්ඨ විද්‍යාලවලට හෝ පත් කිරීමේ ක්‍රමයක් තිබුනේ නැහැ. ඒ වගේම ගුරුවරුන් මාරු කිරීමේ කිසිම වැඩ පිළිවෙලක් තිබුණේත් නැහැ. කොළඹ මහා විද්‍යාලවල හා ද්විතියික විද්‍යාලවල උපාධිධාරීන් හා විශේෂඥ ගුරුවරුන් වුවමනාවට වඩා පිරී සිටියා. අපේ පළාත්වලට—පිටිසර පළාත්වලට—අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව නැතුව සිටියා. සමහරවිට ගුරුවරුන් 20 ක් සිටිය යුතු පාඨශාලාවේ හිටියේ ගුරුවරුන් 5 දෙනයි. දේශපාලන බලපෑම් උඩ ඒ රජයේ මන්ත්‍රීවරුන් මාගීයෙන් ගුරුවරුන් තම තමන්ගේ ගම්වලට පත්වීම් ලබා ගැනීමෙන් පසුව 5 දෙනා සිටිය යුතු පාඨශාලාවල 15 දෙනයි. ගුරු මණ්ඩලයේ 112 ක් සිටි මිශ්‍ර මහා විද්‍යාලයක—බාලක බාලිකා දෙපක්ෂයම සිටින මහා විද්‍යාලයක—104 දෙනෙක්ම සිටියේ කාන්තාවනුයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මොකක්ද පාඨශාලාව ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගුරු මණ්ඩලයේ 24 දෙනකු සිටින තවත් මිශ්‍ර පාඨශාලාවක 21 දෙනෙකුම හිටියේ කාන්තාවන්.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මොකක්ද ඉස්කෝලෙ ? බොරු.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පාඨශාලා දෙකේ නම් මා ප්‍රසිද්ධියේ මේ සභාවේ කියන්නට කැමති නැහැ. ගරු මන්ත්‍රීතුමාට වුවමනා නම් ආවාම මම ඉස්කෝලෙ නමත් දෙන්නම්. ගුරුවරුගෙ නමුත් දෙන්නම්.

මම කියන්නෙ සම්පූර්ණ සත්‍ය. ඕකයි තිබුණු තත්ත්වය. ඒ තත්ත්වය කරන කොටගෙන 1965, 1964, 1963, 1962 යන කාලවලදී විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමේ විභාගවලින් සමත් වූ පිටිසර ගම්බද පාඨශාලාවල ශිෂ්‍ය සංඛ්‍යාව සීමා සහිත වුණා. ඉංජිනේරු අංශය, විද්‍යා අංශය, වැනි අංශවලට ආවේ කලාතුරකිනුයි. දේශපාලන බලතලවලටද යට නොවී මවිසින් අධ්‍යාපනයේ දියුණුව තකා කරන ලද මෙහෙය ගැන තමුන්නාන්සේලාට කියන්නට කැමතියි.

වැඩිපුර නගරබදව සිටි ගුරුවරුන් සැම පළාතකම විසුරුවා හැරියා. යාපනෙන් 300ක් යැව්වා. යාපනේ, මහනුවර, ගාල්ල සහ කොළඹ වැනි තැන්වල වැඩිපුර රොක් ගැසී සිටි විශෙෂඥ ගුරුවරුන් හා උපාධිධාරී ගුරුවරුන් බලහත්කාරයෙන් වාගේ අරගෙන ඔවුන්ට කරුණු අවබෝධ කර දීමෙන් පසුවයි එසේ යැව්වේ. "තමුන්නාන්සේලා යවන්නේ ළමයින්ට උගන්වන්නට මිස තමුන්නාන්සේලාට රක්ෂා දෙන්නට නොවේය" යනුවෙන් කරුණු අවබෝධ කර දුන් විට බොහෝ දෙනා එම කරුණු පිළිගත්තා. ඉන් පසු ඔවුන් දිව ගිහ පුරා විසුරුවා හැරියා. අද එහි ප්‍රතිඵල කෙසේදැයි මා අහන්නට කැමතියි. මා ගත් එම පියවර නිසා මේ වර විශ්ව විද්‍යාලවලට ඇතුළත් වූ වැඩි දෙනා ගම්බද පාඨශාලාවලින් ඉගෙනීම ලැබූ උදවිය බව කියන්නට කැමතියි. පිටිසර පාඨශාලාවලින් ඉංජිනේරු අංශයට කොළඹට වැඩි ගණනක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

තේරුණා. ගාල්ලෙන් එක්කෙනෙක් තේරුණා නම් මාහෝවලිනුත් එක්කෙනෙක් තේරුණා. නගරබදින් තේරුණු තරමට නැති නම් ඊට සමාන වූ පිරිසක් මාහෝ, සඳලංකාව, වේයන්ගොඩ, වැනි ගම්බද පාඨශාලාවලින් ඉංජිනේරු අංශයට එහෙම ඇතුළත් වුණු බව මා කියන්නේ බොහොම සන්තෝෂයෙනුයි. අපේ ජාතික ආණ්ඩුවේ නියමය පරිදි මා ගත් පියවරක ප්‍රතිඵලයයි ඒ.

කලා අංශයේ තත්ත්වයත් එයයි. මේ වර කලා අංශය දෙස බලන විට සත් කෝරළය ලංකාවේ තෙවන තැනට පැමිණ සිටින බව කියන්නේ සතුටින්. නම පවා නොඇසූ ඈත පිටිසර පාඨශාලාවලින් සිසුන් 10, 12 යනාදී වශයෙන් තේරුණා. එයින් අවබෝධ වෙනවා ලංකාවේ අධ්‍යාපනය මොන තරම් සමාන අන්දමකින් සෑම තැනම කෙරීගෙන යනවාද කියා.

කණිෂ්ඨ අධ්‍යාපනය විකාරයක් වෙලයි තිබුණේ. සමහර පාඨශාලාවල 2 වන පංක්තිය දක්වා විතරයි. තිබුණේ. සමහර ඒවා 1 සිට 4 ට, සමහර ඒවා 1 සිට 5 ට, සමහර ඒවා 1 සිට 6 ට, සමහර ඒවා 1 සිට 7 ට, යනාදි ආකාරයට පංක්ති පැවැත්වුව. එම තත්ත්වය වෙනස් කිරීම සඳහා කැබිනට් මණ්ඩලය සමගද සාකච්ඡා පවත්වා ගරු අගමැතිතුමාගේද උපදෙස් වලට අනුව වර්ග 7 කට පමණ බෙදී හත් හවුලක් වී තිබුණු පාඨශාලා වර්ග දෙකකට පත් කළා. ගුරුවරුන් යැවීමේ පහසුව, ඉගැන්වීමේ පහසුව, පාලනයේ පහසුව හා උපදෙස් දීමේ පහසුව, යන මේ සියල්ල සලකාගෙනයි පාඨශාලා අංශ දෙකකට බෙදන්නට කල්පනා කළේ. දැන් තිබෙන්නේ පාඨශාලා වර්ග දෙකයි. එම පාඨශාලාවල තත්ත්වය දියුණු බව තමුන්නාන්සේලා සිත් ඇතුළෙන් පිළිගන්නවා ඇති. විනය දියුණු නම්, ගුරු මණ්ඩල නිසි පරිදි සකස් කර තිබෙනවා නම්, විද්‍යා විශෙෂඥයන් හා උපාධිධරයන් සිටින ප්‍රමාණය අනුව ලංකාවේ හැම තැනම සම සේ බෙදී ගොස් සිටිනවා නම්, අපේ රටේ අධ්‍යාපනය අවුලකැයි කිව හැකිද? "මිරර්" පත්‍රයෙනුත් "ටෛයිම්ස්" පත්‍රයෙනුත් කී පළියටම ඇයි තමුන්නාන්සේලා මෙවැනි ජාතික අපරාධයක් කරන්නේ? මේ අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නවලදී තමුන්නාන්සේලා ධෛර්යය දිය යුතුයි නේද? එය හරියාකාර කෙරෙනවා නම්, එහි යම් යම් අඩු පාඩු තිබෙනවා නම්, ඒවා ගැන සොයා බලා සකසා ගැනීම තමුන්නාන්සේලාටත් මටත් අපේ ජාතියේ අනාගත පරම්පරාවටත් යහපත සැලසෙන කාරණයක් නේද?

අධ්‍යාපනය පිළිබඳ 1956න් පසුව මේ රටේ ඇති වුණු අවුල පමණ අවුලක් ලෝකයේ කිසිම රටක කවදාවත් සිදු වී නැති බව කියන්නට පුළුවනි. කිසිම ඉගැන්වීමක් නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
මහජනතාව දන්නවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ගුරුවරු දේශපාලනයට යට වෙලයි හිටියේ. එකල ඇමතිවරයා ප්‍රසිද්ධියේම ගුරුවරුන්ට කිව්වා, 23 වනදා නැති නම් 24 වනදා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව—තුන් හවුල—දිනනවා. එයින් පසු අධ්‍යාපන ඇමතිවරයා වන්නේ මායි. එසේ හෙයින් අප මෙතෙක් කර තිබෙන වැඩ මහජනයාට කියන්න, යනුවෙන්. එහෙත් අපේ ගුරුවරුන්ට මා කියනවා කිසිම පක්ෂ භජනයක් ඇතුව පාඨශාලා තුළ වැඩ කරන්නට එපාය යනුවෙන්. ඒ අය ඕනෑම දේශපාලන මතයක් දැරුවාට අපේ ආණ්ඩුවෙන් කිසිම වරදක් නැහැ. උසස් වීමට හෝ තමන්ගේ ගමට මාරු වීමට හෝ එය බාධාවක් නොවෙයි. ලෝකයේ සියලුම දේශපාලන න්‍යායයන් වැරදියි. අවුරුදු පන් දහසක් ග්‍රන්ථාරූඪ වී ඇති ඉතිහාසය දෙස බලන විට සියලුම දේශපාලන න්‍යායයන් වැරදියයි කියන්නට පුළුවනි. සර්වතොභද්‍ර සර්ව නිර්දෝෂ න්‍යායයන් අද වන තුරු පහළ වී නැහැ. එහෙත් වැඩිය හොඳ න්‍යායයක් තමයි අද අප අනුගමනය කරන්නේ. හැම දේකම එක්කෝ අඩුවෙන් වැරදියි, නැත්නම් වැඩියෙන් වැරදියි. මනුෂ්‍යයාගේ ජීවිතය වටාපිටාවෙන් හා අභ්‍යන්තරයෙන් සැපවත් කර ගැනීමේ එකම මාර්ගය දේශනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත: සම්මතිය

[ගුරු ඊරියගොල්ල]

කළේ අවුරුදු 2,500 කට පෙර ගයා ශීර්ෂයෙන්. ඒ හැර සමස්ත ලෝක ජනතාවටම සරිලන දේශපාලන න්‍යායක් කවදාවත් ඇති වුණේත් නැහැ, ඇති වන්නේත් නැහැ, දැනුත් නැහැ. අප අනුගමනය කරන්නේ හුඟක් දුරට නිවැරදියයි අප වටහාගෙන ඇති දේශපාලන න්‍යායක්. ඒ වුණත්, එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය මා බලාපොරොත්තු වුණත්, එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණයෙන් පමණක් මේ රටේ අනාගත සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට ලැබෙන බව මට ස්ථිරව සහතික වුණත්, මගේ පක්ෂයවත් ගෙන වේදිකාවලට නැඟී ළමයින්ගේ ගෞරවය මැකෙන පරිද්දෙන් කථා කරන්නට එපා කියා මා ගුරුවරුන්ට කියා තිබෙනවා. පක්ෂ භජනය පාඨශාලා ගර්භයේදී සම්පූර්ණයෙන්ම අත්හරින්නටය කියායි, මා කියන්නේ. තමුන්නාන්සේලා එහෙම කිව්වෙ නැහැ.

ගුරු ගෞරවය නැති කෙරුවාලු. ගුරු ගෞරවය නැති කළා නේන්නම්. එක්තරා ජාත්‍යන්තර දේශපාලන නියෝජිත පිරිසකගෙන් මාස්පතා වැටුප් ලබන ගුරුවරුන් කුමන්ත්‍රණයෙන් ගුරු සංගම්වල නායකයන් කරවා, ඔවුන් ඉස්සරකොට, ගුරුවරුන් වශයෙන් අඳවන ලද වරායේ කම්කරුවන් පිටුපසින් යොදවා, රෙදි කලවය දක්වා එක අතකින් උස් කරගෙන, අනික් අත ඔසවා මිටිමොළවා සොලවා කුණුහරුපවලට තරමක් කිව්වු සටන් පාඨ කියමින්, රටේ හා ලෝකයේ ගෞරවයට පාත්‍ර වූ නායකයන්ට හිංසා වන වචන පාවිච්චි කරමින්, තමුන්නාන්සේලාගේ මැයි දින පෙළපාළියේ යන්නට සැලැස්වීමද ගුරු ගෞරවය කෙළසීම එසේ නැත්නම් ගුරු ගෞරවය කෙළෙසෙන පරිද්දෙන් ප්‍රසිද්ධියේ දේශපාලන ව්‍යාපාරවල යෙදෙන්නට එපා කීමද ගුරු ගෞරවය කෙළෙසීම කියා මා අහන්නට කැමතියි.

ගුරුවරයා, දේශපාලනඥයා, නායකයා, පන්සලේ හාමුදුරුවන් යන අයට සාමාන්‍ය ජනතාවට තිබෙන නිදහස නැහැ. ඇමතිවරුන්ට මේ රටේ ඉඩම් ගන්නටවත් බැරි බව තමුන්නාන්සේලා දන්නවා. අගමැතිතුමා එය අවලංගු කරන්නටය කිව්වා. හොඳ වෙලාවට මා ගත්ත ඉඩම එළි කරලා කැම්බි ගහලා වවලා තිබුණා. නැත්නම් මගේ ඉඩමටත් කෙළවෙනවා. අගමැතිතුමා ඒවා අවලංගු කරන්නටය කිව්වා. මා නම් එයට එකඟ වුණේ නැහැ. අපට ඒ අයිතිවාසිකම් තිබිය යුතුය කියා මා සිතුවා. ඇමතිවරුන්ට අනිකුත් සාමාන්‍ය මහජනයාට තිබෙන නිදහස ඒ වූ පරිද්දෙන් ම නැත, යම් යම් අවහිර තිබෙනවාය, ඒවා පිළිගත යුතුය කියා අගමැතිතුමා කිව්වා. ඒක ඇත්තයි. ගුරුවරයාටත් එහෙමයි. හාමුදුරුවන්ටත් එහෙමයි. මිනුවන්ගොඩ මන්ත්‍රීතුමාත් (ද සොයිසා සිරිවර්ධන මයා.) කෑගල්ලේ මන්ත්‍රීතුමාත් (පී. බී. ජී. කලුගල්ල මයා.) මාත් අමුඩයක් ගහගෙන වෙලක ළිඳකින් නැවට කිසිම කෙනෙක් වරදක් කියන්නේ නැහැ. එහෙත් හාමුදුරු කෙනකු අමුඩයක් ගහගෙන නෑවොත් තත්ත්වය මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඒ වර්ගී විසින් නොකළ යුතු යම් යම් දේ තියෙනවා. කම්කරුවන් හා ලිපිකරුවන් කලවා තෙක් හෝ ඊටත් ටිකක් ඉහළට හෝ රෙදි උස්සාගෙන සටන් පාඨ කියමින් මැයි රැළියේ පාරේ ගියාට කව්රුත් දොස් කියන්නෙ නැහැ. ගුරුවරයකු ඒ විධියට ගියොත් ඒ ශිෂ්‍යයන් දක්කොත් නැවතත් ඒ ගුරුවරුයාට ගෞරව කරනවාද? දෙමව්පියන් ඒ ගුරුවරයාට ගෞරව කරනවාද? අන්න ඒ පිළිවෙළට ගුරු ගෞරවය කෙළසුවේ තමුන්නාන්සේලයි. විශ්ව විද්‍යාල ඇතුළේ කෙරෙන යම් යම් අකටයුතුවලට විරුද්ධව මා කටයුතු කළ නිසා මා ඇමති කමින් පහ කර දැමීමට, අපේ ආණ්ඩුව කඩාකප්පල් කිරීමට විශ්ව විද්‍යාල ඇතුළේ තමුන්නාන්සේලාගේ ඔත්තු කාරයන් යොදවා විශ්ව විද්‍යාල නරක් කළේ තමුන්නාන්සේලයි. අප ඒ වැරදි සෑදිය යුතුයි. නමුත් කවුද මේ නරක කළේ? අවුරුදු ගණනකට වරක් තමන්ටත් තමන්ගේ භාර්යාවන්ටත් නොමිලයේ ශිෂ්‍යත්ව ලබාගෙන රට යන්නට විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන්ට අවසරයක් තිබෙනවා. සමහරු එහෙමත් අරගෙන තව ආයතනවලටත් ගිහින් ආණ්ඩුවේ මුදල් අරගෙන තිබෙනවා. එක ආචාර්යවරයෙක් ආයතන දෙකකින් ඒ ආකාරයට ප්‍රයෝජන ගෙන තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනත් ආණ්ඩුවේ නිලධාරියකු එවැනි දෙයක් කළා නම් ඔහු නිලයෙනුත් පහ වෙනවා. නමුත් මෙතැන—විශ්ව විද්‍යාල යේ—තිබෙනවා නොවැ "ඔටොනොමිය." ඔය "ඔටොනොමිය" කපා දමන තුරු ලංකාවේ තබා ලෝකයේවත් එකම විශ්ව විද්‍යාලයක්වත් හදන්නට බැහැ.

ප්‍රංශයේ ඩිගෝල්ට විරුද්ධව කොමියුනිස්ට්කාරයින් විසින් මෙහෙයවන ලද පෙළපාළියට හේතුවූ එක් කරුණක්—මා ප්‍රකාශ කළ එක් කරුණක්—වැරදිය කියා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරයකු කියා සිටියා. නැහැ, මා කී දේ හරි. සෝබෝන් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ගේ ඉල්ලීම්වලින් එක් ඉල්ලීමක් තමයි රාත්‍රී කාලයේ නිදහසේ ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරවලට යෑමේ අවසරය. එවැනි ඉල්ලීමක් කර අද ඇමරිකාවේ එක් විශ්ව විද්‍යාලයක ඒ අවසරය දී තිබෙනවා. එංගලන්තයේ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයනුත් ඒ ඉල්ලීම ඉදිරිපත් කර තිබෙනවා. නමුත් පාලක පක්ෂය ඒකට විරුද්ධයි. ඒ එක ඉල්ලීමක්. තවත් නොයෙක් ඉල්ලීම් තිබෙනවා. කොමියුනිස්ට්කාරයින්ට ද ඉල්ලීම් නැත්තෙ? ඉල්ලීම් 21 ක් තියෙන්නට ඇති. මා සඳහන් කළ ඉල්ලීම එකක්. විශ්ව විද්‍යාලවල නම්වත් නැසූ අපේ ගම්වල සිටින දෙමව්පියන් මේවා ගැන දැනගත්තොත් ක්ලාන්තවී වැටෙනවා ඇති. කොහොමද තමුන්නාන්සේලාගේ සංස්කෘතිය? පාලක පක්ෂය බැහැ කිව්වා. ඒ අවස්ථාවේදී ශිෂ්‍යයන් ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරවලට කඩා වැදුණා. එත කොට පොලීසිය ගෙන්වන්නට සිදු වුණා. පොලීසියට බෝම්බ ගැසුවා. ඊටපසු ප්‍රංශයේ කොමියුනිස්ට් මණ්ඩලය විසින් මෙහෙය වනු ලැබූ ඒ නොමග ගිය තරුණ තරුණියන් "ඩිගෝල් අස්විය යුතුයි, ඩිගෝල් අස්විය යුතුයි" කියා විශාල පෙළපාළියක් ගියා. මෙහෙ අපේ පණ්ඩිතවරුන් ඩිගෝල් ඉවරය කිව්වා. නමුත් මොකද වුණේ? ඩිගෝල් මිනිත්තු හතයි කථා කළේ. ලබන වාරයේ අප කථා කරන්නෙත් මිනිත්තු හතයි. ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාවේදී ඩිගෝල්ට ආණ්ඩුව ගෙන යන්නට බැරි තරම් ඔවුන් අවුල් ඇති කළා. මේ විශ්ව විද්‍යාලකාරයින්ට එවැනි අවුල් ඇති කරන්නට පුළුවනි. ඒ බැරෑරුම් අවස්ථාවේදී ඩිගෝල් ජනතාවට කථා කර "මෙන්න ඒ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කරන ඉල්ලීම්, මේ ඉල්ලීම්වලට ඉඩ දෙනවා නම් මට විරුද්ධව ඡන්දය දෙන්න, මේ ඉල්ලීමේ ප්‍රතික්ෂේප කිරීමට මා ගත් තීරණය හරි නම් මට ඡන්දය දෙන්න" කියා කීවා. මිනිත්තු හතයි කථා කළේ. මොකද වුණේ?

ලජ්ජා භය තිබෙන මිනිසුන් තවමත් ඒ රටේ සිටිනවා. යම් ස්ත්‍රියක් ගණිකාවක වුණත් ඇය ඇගේ දියණිය ගණිකාවක වනු දකින්නට කැමති නැහැ. යම් මිනිසකු සුරා සොඬකු වුණත් ඔහු ඔහුගේ පුත්‍රයා සුරා සොඬකුවනවා දකින්නට කැමති නැහැ. අපේ රටේ තත්ත්වයත් එහෙමයි. එමනිසා විශ්ව විද්‍යාලවල වන අවලම් වැඩවලට මහජනතාව කැමති නැහැ. මෙතෙක් කල් මහජනයා යම් යම් කරුණු නොදැන සිටියා. ඒවා මහජනතාවට අවබෝධ කරවන්නටයි මා කථා කරන්නෙ. එක්කෝ විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් හැදෙන්නට ඕනෑ. නැත්නම් ඔවුන් අස් වෙන්නට ඕනෑ. මා කියන්නේ ඇත්තයි. මහජනතාවගේ මුදල් අරගෙන මේ සියලුම නෙයියාඩගම් නටමින් ඔවුන් දැන් කියනවා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් මේ වැඩ වර්ජන කරන්නේ, කෝලාහල කරන්නේ රක්ෂා නැති නිසාය කියා. නමුත් නියම තත්ත්වය කුමක්ද යන්න දැන් තමුන්නාන්සේලාට අවබෝධ වී ඇති. එමනිසා මේ නොමග යන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

මහාචාර්යවරුන් හදන්නට තමුන්නාන්සේලාත් අපට උපකාර කරන්නට ඕනෑ.

අවසානයේදී ඩිගෝල්ට මොකද වුණේ? ප්‍රංශ ඉතිහාසයේ කෙදිනකවත් නොඇසූ තරම් ජයග්‍රහණයක් ඩිගෝල්ට ලැබුණා. හැබැයි, අපේ පණ්ඩිතවරු, ඔය "ටයිම්ස් කාරයො" එහෙම, මෙහෙ ඉඳගෙන ඩිගෝල් අවසානය කියා කල්පනා කළා. ලියුම් ලිව්වා. නමුත් අවසානයේදී වූ දේ තමුන්නාන්සේලා දුටුවා නේද? ප්‍රංශ ඉතිහාසයේ කවදාවත් නොඇසූ ජයග්‍රහණයක් ඔහුට ලැබුණා. එයින් පෙනෙන්නේ ප්‍රංශයේ මහජනතාව තවමත් ලජ්ජා භය තිබෙන ජනතාවක් බවයි. ආසන භාරසිය ගණනකින් ඩිගෝල් ආසන තුන්සිය පණස් හයක් ගත්තා. ඒවාගේ ආසන එකසිය පණස් එකකින් ආසන එකසිය ගණනක් අප මේ වාරයේ ගන්නවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That this House do now adjourn."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.1 ට, අද දින සභාසම්මතිය අනුව, 1968 සැප්තැම්බර් 27 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி பி.ப. 7.1 க்கு சபை அதனது இன்றைய தீர்மானத்துக்ிணங்க, 1968 செப்ரெம்பர் 27, வெள்ளிக்கிழமை மு.ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 7.1 P.M. until 10 A.M. on Friday, 27th September 1968, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු.35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி 30 சதம், தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org